# පාලිපදාවතාර

නම් වූ

පාලි ව්‍යාකරණය.

විද්‍යෝදය පිරිවෙණේ
උපප්‍රධානාචාර්ය්‍ය පණ්ඩිත
වැලිවිටියේ සෝරත ස්ථවිරපාදයන්
වහන්සේ විසින් විරචිත යි.

විද්‍යෝදය පරිවෙණාධිපතිව වැඩ සිටි
කහවේ ශ්‍රී සුමඞ්ගල රතනසාරාභිධාන
ප්‍රධාන නායක මාහිමියන්වහන්සේ විසින්
පිළිගන්නා ලදී.

ද්විතීය සංස්කරණය

බද්දේගම ඩී. අයි. ගුණවර්ධන මහතා විසින්
ජිනාලඞ්කාර යන්ත්‍රාලයේ මුද්‍රණය කරවා
ප්‍රසිද්ධ කරණ ලදී.

ශ්‍රී බු: ව: 2480
ක්‍රි: ව: 1937

මිල ශත 10 යි

# PALIPADAWATARA

## A PALI GRAMMAR

BY

**Rev. Pandit Weliwitiye Sorata Thero**

Vice Principal of

Vidyodaya College, Colombo.

Finally Revised By

**The Venerable Kahave Siri Sumangala**

**Ratanasara Nayaka Thero**

Late Principal Vidyodaya College, Colombo.

Second Edition

Published by

Mr. D. I. GUNAWARDHANA.

Printed at the Jinalakara Press, Colombo.

B. E. 2480

C. E. 1937

# අනුක්‍රමණිකා


පිට පාඩම් ආදිය.

1 **1 පාඩම**
1 පාළිභාෂාව හා ව්‍යාකරණ
2 පාළි වර්ණ
3 **2 පාඩම**
3 ව්‍යඤ්ජනවර්ණවිභාගය.
5 **3 පාඩම**
5 පදවිභාගය
7 **4 පාඩම**
7 පදොත්පත්තිය
7 නාමපදයන්ගේ භෙද
8 ලිඞ්ගභෙදය
9 **5 පාඩම**
9 නාමාන්තභෙද
10 නාමාර්ථ හා විභක්ති
11 **6 පාඩම**
11 නාමවිභක්ති
14 **7 පාඩම**
15 ආඛ්‍යාතපද
16 **8 පාඩම**
16 ආඛ්‍යාත විභක්ති
18 භූවාදිගණිකධාතු
18 **9 පාඩම**
18 සන්ධි
19 ලොපසන්ධි
20 වත්තමානකාලිකආඛ්‍යාත
21 **10 පාඩම**
21 වාක්‍ය විධිය
23 **11 පාඩම**
23 උක්තකර්තෘක අනුක්ත කර්මවාක්‍ය
25 **12 පාඩම**
25 විශෙෂ අකාරාන්තනාම
27 **13 පාඩම**
,, අතීතකාලික ආඛ්‍යාත
29 **14 පාඩම**
,, විශෙෂ අකාරාන්තනාම
30 නිග්ගහීතලොප සන්ධි
31 ලොපාගම සන්ධි
,, **15 පාඩම**
,, අකාරාන්තසර්වනාම
33 **16 පාඩම**
,, විශෙෂණ විශෙෂ්‍ය විධිය
35 **17 පාඩම**
,, විශෙෂ සර්වනාම
36 භින්නාධිකරණ විශෙෂණ
37 **18 පාඩම**
,, පරොක්ඛා විභක්තිය
38 ක්‍රියාවිශෙෂණය
39 **19 පාඩම**
,, “උභ” ශබ්දාදිය
41 **20 පාඩම**
,, තුම්හ ශබ්දය
42 අනාගත ආඛ්‍යාත
44 **21 පාඩම**
,, අත්තනොපද ආඛ්‍යාත
45 ආකාරාන්තනාම

47 **22 පාඩම**
,, අත්තනොපද ආඛ්‍යාත
48 යකාරවකාර දෙශසන්ධි
49 **23 පාඩම**
,, කම්මකාරක ආඛ්‍යාත
51 **24 පාඩම**
,, අකර්මකධාතුන්ගේ සකර්මකත්වාදිය
54 **25 පාඩම**
,, ආකාරාන්ත සර්වනාම
57 **26 පාඩම**
,, ඉකාරාන්තනාම
59 ඤකාරාදි අදෙශසන්ධි
60 **27 පාඩම**
,, රුධාදිගණයේ ධාතු
62 වර්ගාන්තාදෙශසන්ධි
,, ඊකාරාන්තනාම
65 **28 පාඩම**
,, උකාරාන්තනාම
66 දිවාදිගණයේ ධාතු
68 **29 පාඩම**
,, තුප්‍රත්‍යයාන්ත උකාරාන්තනාම
69 සවාදිගණයේ ධාතු
70 **30 පාඩම**
,, උකාරාන්ත ස්ත්‍රීලිඞ්ගනාම
72 කියාදිගණයේ ධාතු
72 **31 පාඩම**
,, ඌකාරාන්තනාම
74 තනාදිගණයේ ධාතු
75 **32 පාඩම**
,, ඔකාරාන්තනාම
76 චුරාදිගණයේ ධාතු
,, විරුකතසන්ධි
78 **33 පාඩම**
,, ආඛ්‍යාතභෙද
81 **34 පාඩම**
,, කිතකනාම
,, කාරකාර්ථ
84 **35 පාඩම**
,, තබ්බ ප්‍රත්‍යයාදිකිතක
85 **36 පාඩම**
,, කිතක උදාහරණ
87 **37 පාඩම**
,, සමාසලක්ෂණ
88 තප්පුරිස සමාසය
90 **38 පාඩම**
,, තද්ධිතපද
93 **39 පාඩම**
,, කම්මධාරයසමාසය
96 **40 පාඩම**
,, 'අපච්ච' අර්ථාදිතද්ධිත
99 **41 පාඩම**
,, දිගුසමාසය
,, ද්වන්දසමාසය
102 **42 පාඩම**
,, ක්‍රියාවාචක කිතක
104 **43 පාඩම**
,, කිතකයොග විභක්ති
107 **44 පාඩම**
,, උණාදිකිතක
109 **45 පාඩම**
,, බහුබ්බීහිසමාසය
110 **46 පාඩම**
,, අබ්‍යයීභාවසමාසය
113 **47 පාඩම**
,, සඞ්ඛ්‍යාපූරණාර්ථතද්ධිත
115 නිපාතතද්ධිත
116-123 පරිශිෂ්ටසඞ්ග්‍රහය

# සොත්ථි.

# පාළිපදාවතාරය.

නමො සබ්බඤ්ඤුනො.

## 1. පාඩම.

## පාළිභාෂාව හා ව්‍යාකරණ.

"ශ්‍රී මූල (පාඨ) පාළිය, අර්ථකථාපාළිය, ටීකාපාළිය, ප්‍රකරණපාළිය"යි පාළිභාෂාව සිවුවැදෑරුම් වේ. එහි-බුදුරජාණන්වහන්සේ විසින් වදළ පිටකත්‍රයවර්ත්ති මූලපාඨ සමූහය ශ්‍රී මූලපාළිය වේ. ඒ ශ්‍රී මූලපාළියේ අර්ථවර්ණනය කළ පාළිය අර්ථකථා පාළියයි. ඒ අර්ථකථා පාළියේ දුරවබොධපදයන්ගේ අර්ථවර්ණනය කළ පාළිය ටීකාපාළියයි. ඒ හැර ඒ ඒ කාලයන්හි බුද්ධචරිත ඉතිහාස ආදිය කළ පාළිය ප්‍රකරණ පාළියයි. එහි-"භික්ඛු විභඞ්ග, දීඝනිකාය, ධම්මසඞ්ගණී" ආදියෙන් ශ්‍රීමූලපාළියෙහි තත්ත්වය ද, එහි ටීකාවලින් ටීකා පාළියේ තත්ත්වය ද, බොධිවංශ මහාවංශ ආදියෙන් ප්‍රකරණ පාළියේ තත්ත්වය ද දතයුතුයි.

ශ්‍රීමූලපාළිය ප්‍රධාන කොට ඇති පාළිභාෂාව නිවැරදි ලෙස ලියන්නට කියන්නට උගන්වන ශාස්ත්‍රය පාළි ව්‍යාකරණ නම් වේ.

## පාළි වර්ණ.

### 1. පාළිවර්ණයෝ එක්සාළිසකි.

**අ ආ ඉ ඊ උ ඌ එ ඔ**
**ක ඛ ග ඝ ඞ, ච ඡ ජ ඣ ඤ, ට ඨ ඩ ඪ ණ**
**ත ථ ද ධ න, ප ඵ බ භ ම**
**ය ර ල ව ස හ ළ (අං)**

යන මේ එක්සාළිස පාළිභාෂාවේ වර්ණයෝයි. මුළු පාළි භාෂාව ම මේ වර්ණ එක්සාළිසෙහි ඇතුළත් වේ. පාළියෙහි මොවුහු "**වණ්ණ** අක්ඛර" යන නම්වලින් ව්‍යවහාර කරනු ලැබෙත්. අර්ථයන් පවසාලීමට උපකාරය යන අර්ථයෙන් "වණ්ණ" යයි ද, විනාශ නො වන්නාහුය යන අර්ථයෙන් "අක්ඛර" යයි ද කියනු ලැබෙත්.

## වර්ණ විභාගය.

---

### 2. වර්ණ අටක් ස්වර හා තෙතිසක් ව්‍යඤ්ජනයෝයි.

එක්සාළිසක්වූ වර්ණයන් අතුරෙන් "අ" ආදි අට ස්වර වර්ණ ද, "ක" ආදි තෙතිස ව්‍යඤ්ජන වර්ණ ද වෙත්. මොවුහු ශබ්ද කාරණ අර්ථයෙන් ස්වරයයි ද, අර්ථය ව්‍යක්තකරණ අර්ථයෙන් ව්‍යඤ්ජනයයි ද කියනු ලැබෙත්. ස්වරය වනාහි ශබ්දය පිළිබඳ උච්චාරණ ශක්තිය ගෙණ දේ. අර්ථ ව්‍යක්තිය ලැබෙන්නේ ව්‍යඤ්ජනයෙනි. පාළියෙන් ස්වරයන්ට "සර" යන නාමය ද, ව්‍යඤ්ජනයන්ට "බ්‍යඤ්ජන" යන නාමය ද ව්‍යවහාර කරනු ලැබේ. "ව්‍යඤ්ජන" යන නාමය ද පාළියෙහි විරුද්ධ නොවේ.

මෙහි කී ස්වර අටෙන් "අ ඉ උ" යන තුණ හ්‍රස්වයෝ ද සෙසු පස දීර්ඝයෝ ද වෙත්. මොවුන්ගේ පාළිනාමයෝ "රස්ස, දීඝ" යනුයි. ලඝුවූ උච්චාරණ කාලය ඇත්තේ හ්‍රස්වයි. එනම්-මාත්‍රාවක් එකක් පමණවූ කාලයයි. මාත්‍රාවක් නම් ඇසිපිය හෙළන පමණවූ කාලයයි. දික්වූ උච්චාරණ

කාලය ඇත්තේ දීර්ඝයි. එනම් මාත්‍රා දෙකක් පමණවූ කාල යයි. (මාත්‍රා දෙකකට වඩා දීර්ඝකාලයක් කියවෙන්නේ ප්ලුත යයි. ඒ වනාහි දුරවූ කෙනෙකුට ආමන්ත්‍රණය කිරීමේදී හෝ ගායනාදියේදී ලැබේ.

මේ හ්‍රස්වයට "ලහු, ලඝු" යන නම් දෙක ද, දීර්ඝයට "ගරු" යන නම ද කියනු ලැබේ. හුදකලා හ්‍රස්වවූ ස්වරය පමණක් නොව "ක" ආදි වශයෙන් ව්‍යඤ්ජනය හා එකතුවූ ස්වරයද ලඝු නම්. එසේම දීර්ඝස්වර පමණක් නොව සංයොගයකට හෝ බින්දුවර්ණයට මුල සිටි හ්‍රස්වය ද ගරු වේ. "ධම්මං" යනාදි වශයෙනි. මෙහි ධකාරස්ථ අකාරය "මම" යන සංයොගයට පූර්ව බැවින්ද, මකාරස්ථ අකාරය බින්දු වර්ණයට පූර්වබැවින්ද ගරු නම්.

2 පාඩම.

## ව්‍යඤ්ජන වර්ණ විභාගය.

ව්‍යඤ්ජන වර්ණ තෙතිසෙන් කයන්ත පටන් මයන්ත අවසන් කොට ඇති පස්විසි වර්ණයෝ වග්ග (වර්ග) නම් වෙත්. ඔවුහු පසපස බැගින් පසෙකි. ඔවුන්ට ආදිවර්ණයන් මුල් කොට **"කවග්ග චවග්ග ටවග්ග තවග්ග පවග්ග"** යයි නම් පසක් ව්‍යවහාර කරණු ලැබේ.

"වග්ග (වර්ග)" යනු සජාතීය (සමාන උත්පත්තිය ඇති) සමූහයට නම්. 'මනුස්සවග්ග, පසුවග්ග' ආදි වශයෙනි. කයන්ත ආදි වර්ණ පස උත්පත්තිස්ථානාදි වශයෙන් සමාන බැවින් "කවග්ග" නම්. සෙස්සද එසේයි.

මේ හැර ව්‍යඤ්ජනවර්ණයන්ගේ **"ඝොස අඝොස සිථිල ධනිත"** යන හෙදයෝද වෙත්. එහි-හඬ ඇති වර්ණ ඝොස නම්ද, හඬ නැති වර්ණ අඝොස නම්ද, ලිහිල් හඬ ඇති වර්ණ සිථිල නම්ද, තද හඬ ඇති වර්ණ ධනිත නම්ද වෙත්.

පාළි ව්‍යාකරණයන්හි බින්දුවර්ණයට **නිග්ගහීත** යයි කියනුලැබේ.

## වර්ණ භේද.

**ස්වර**-අ ආ ඉ ඊ උ ඌ එ ඔ 8

**රස්ස-ලහු**-අ ඉ උ 3

**දීඝ-ගරු**-ආ ඊ ඌ එ ඔ 5

**ව්‍යඤ්ජන**-ක ඛ ග ඝ ඞ, ච ඡ ජ ඣ ඤ, ට ඨ ඩ ඪ ණ, ත ථ ද ධ න, ප ඵ බ භ ම, ය ර ල ව ස හ ළ (අ)ං 33

**වග්ග**-ක ඛ ග ඝ ඞ, ච ඡ ජ ඣ ඤ, ට ඨ ඩ ඪ ණ, ත ථ ද ධ න, ප ඵ බ භ ම 5

**ඝොස**-ග ඝ ඞ, ජ ඣ ඤ, ඩ ඪ ණ, ද ධ න, බ භ ම, ය ර ල ව හ ළ 21

**අඝොස**-ක ඛ ච ඡ ට ඨ ත ථ ප ඵ ස 11

**සිථිල**-ක ග ඞ, ච ජ ඤ, ට ඩ ණ, ත ද න, ප බ ම, ය ර ල ව ස හ ළ 22

**ධනිත**-ඛ ඝ ඡ ඣ ඨ ඪ ථ ධ ඵ භ 10

**නිග්ගහීත**-(අ) ං 1

## වර්ණයන්ගේ උත්පත්තිස්ථාන හා කරණ.

ඔවුනොවුන්ගේ අදහස් පහළ කිරීමේදී පළමුකොට ඒ පිළිබඳ සිත උපදනේයි. ඒ සිත උපන් කල්හි එයින් අග්නියද, අග්නියෙන් වායුවද චලිත වේ. ඒ චලිතවූ වායුව නාභියේ පටන් උඩවගතව සියුම් ශබ්දයන් උපදවමින් මස්තකය කරා ගොස් එහි හැපී ආපසු හැරී මුව බිලට පැමිණ බොටු ආදි ස්ථානයන් ස්පර්ශ කරමින් ශබ්ද විශෙෂයන් පහළ කරන්නේ වේ. ඒ ශබ්ද විශෙෂයෝ වර්ණ නම් ද, ඒ ස්පර්ශයට ආධාරවූ තැන් උත්පත්ති ස්ථාන නම් ද, ඔවුන්ගේ උච්චාරණයට උපකාරවූ තැන් කරණ නම් ද වෙත්.

| උත්පත්තිස්ථාන. | කරණ. | වර්ණ. |
|---|---|---|
| බොටුව | බොටුව | අ ආ ක ඛ ග ඝ ඞ |
| තල්ල | දිවමැද | ඉ ඊ ච ඡ ජ ඣ ඤ ය |
| මූද්ධන | දිවගලඟ | ට ඨ ඩ ඪ ණ ර ළ |

| | | |
|---|---|---|
| දත් | දිවග | ත ථ ද ධ න ල ස |
| තොල් | තොල් | උ ඌ ප ඵ බ භ ම |
| බොටුව හා තල්ල | බොටුව හා තල්ල | එ |
| බොටුව හා තොල් | බොටුව හා තොල් | ඔ |
| දත් හා තොල් | දිවග හා තොල් | ව |
| නාසය | නාසය | ඞ ඤ ණ න ම (අ)ං |

3 පාඩම.

## පද විභාගය.

### 3. පද නම් අර්ථවද් වර්ණයෝයි.

යථොක්ත වර්ණයන්ගෙන් හුදකලා වර්ණයක් අර්ථවත් නොවේ. වර්ණ කීපය කීපය එකතුවූවෝම අර්ථවත් වෙත්, අර්ථවත්වූ වර්ණයෝ පදයයි කියනුලැබෙත්.

ඒ පදයෝ වනාහි **"නාමපදය ආඛ්‍යාතපදය උපසර්ගපදය නිපාතපදය"**යි සිව්වැදෑරුම් වෙත්. භාෂා විෂයෙහි පවත්නාවූ ඒ සිව්වැදෑරුම් පදයෝ මහ මුහුදෙහි ජලය මෙන් අප්‍රමාණ වෙත්.

**නාමපද**-පද බවට පැමිණි යම් වර්ණ සමූහයක් උච්චාරණය කළ කල්හි එයින් යම් කිසි දෙයක් කියවේ නම් එබඳු වර්ණ සමූහයෝ නාම පද වෙත්. "බුඩ, නීල, ගත, දෙවදත්ත" යනාදි වශයෙනි. මෙහි "බුඩ" යන වර්ණ සමූහයෙන් දැනගත් කෙනෙක් වූ දෙයක් ද, "නීල" යන්නෙන් නිල් ගුණයෙන් යුත් දෙයක් ද, "ගත" යන්නෙන් ගමන ක්‍රියාව කළ කෙනෙක් වූ දෙයක් ද, "දෙවදත්ත" යන්නෙන් එනම් කෙනෙක්වූ දෙයක් ද කිය වේ. (නාමපද ද්‍රව්‍ය වාචකයයි කියත්).

**ආඛ්‍යාතපද**-සෙසු පදයන්ගේ සම්බන්ධයෙන් කියයුතු අර්ථය ප්‍රකාශකරන්නේ ආඛ්‍යාතපදයයි. 'දුක්ඛී සදා සුඛං ප" යන මෙහි "දුක්ඛී සුඛං" යනු නාමපදයි. "සදා"

යනු නිපාතපදයි. "ප" යනු උපසර්ගපදයි. මේ පද සම්බන්ධයෙන් වනාහි කියයුතු අර්ථය ප්‍රකාශ නොවේ. ඊට "අත්‍ථයති" යන ආඛ්‍යාතපදය සම්බන්ධ කොට 'දුක්ඛී සදා සුඛං පත්‍ථයති"යි කී කල්හි "දුක් ඇත්තේ නිතර සැපය පතයි" යන අර්ථය ප්‍රකාශ වේ. (ආඛ්‍යාතපද ක්‍රියා වාචකයයි කියත්.)

**උපසග්ගපද**-අර්ථ විශේෂයන් ප්‍රකාශකිරීම පිණිස හෝ පදපූරණාදිය පිණිස නාමපදයන්ගේ හා ආඛ්‍යාතපදයන්ගේ ආදියෙහි යෙදෙන්නේ උපසග්ගපදයි. ඒ උපසග්ගපදයෝ විසි දෙනෙකි. එනම්:-

**ප, පරා, නි, නී. උ, දු, සං, වි, අව, අනු,**
**පරි, අධි, අභි, පති, සු, ආ, අති, අපි, අප, උප.**

යන මොහුයි. මේ උපසර්ගයන්ගෙන් ඇතැම් කෙනෙක් ධාතුවෙහි ප්‍රකට අර්ථය වළක්වා වෙන අර්ථයක් ප්‍රකාශ කෙරෙත්. "ගතො" යන්නෙහි අර්ථය "ගියේ" යනුයි. "ආ" යන උපසර්ගය යොදා "ආගතො" කී කල්හි ඒ අර්ථය නොව "ආයේ" යන අර්ථය ප්‍රකාශ වේ. ඇතැම් කෙනෙක් ධාතුවෙහි ප්‍රකටවූ අර්ථය වෙනස් කෙරෙත්. "නතො" යන්නෙහි අර්ථය නැමුනේ යනුයි. "ප" යන්න යොදා "පණතො" කී කල්හි ප්‍රකර්ෂයෙන් නැමුනේ යන අර්ථය ප්‍රකාශ වේ. එයින් නැමීමේ වෙනසක් ප්‍රකාශ කරණු ලැබේ. ඇතැම් උපසර්ග කෙනෙක් ධාතුවේ ප්‍රකටවූ අර්ථයම අනුව යෙත්. "සුති" යන්නෙහි අර්ථය වැදීම යනුයි, 'ප' යන්න යොදා "පසුති" කී කල්හි ද ඒ අර්ථය මැයි.

**නිපාතපද**-අර්ථ විශේෂයන් ප්‍රකාශකිරීම පිණිස හෝ පද පූරණය පිණිස වාක්‍යයක අතරතුර යෙදෙන්නේ නිපාත පදයි. නිපාතපදයන්ගේ සඞ්ඛ්‍යාවක් නොපෙණේ. වාක්‍යවල අතරතුර වැටීතිබෙන යම් පදයක් ලිඞ්ග විභක්ති වචන වශයෙන් නොවෙනස්ව ප්‍රකෘති රූපයෙන් සිට අර්ථය පවසා නම් ඒ නිපාතපදයයි දතයුතුයි.

**ච, වා, නු, නො, මා, හි, අලං, අථ, ඛලු, වත,**
**පන, එව, එවං, ඉව, විය, නූන, අහො, ඛිප්පං, සණිකං.**

යන මේ ආදිය නිපාතයි. මේ උපසර්ග නිපාත යන දෙකොටස ලිඞ්ගාදි වශයෙන් වෙනස් නොවන බැවින් අව්‍යයයි ද කියනු ලැබේ. අව්‍යයයන් කෙරෙහුදු විභක්ති යෙදී ලොප්වීම නියමයයි.

4 පාඩම.

### පදොත්පත්තිය.

## 4. පදයෝ ප්‍රකෘතිප්‍රත්‍යය නිෂ්පන්නයහ.

පාලිභාෂාවට අයත් අර්ථවත් සියලු පදයෝම ප්‍රකෘති ප්‍රත්‍යය දෙදෙනාගේ සම්බන්ධයෙන් නිපන්නාහු වෙත්. ඒ ප්‍රකෘතිය වනාහි ධාතු ප්‍රකෘති ශබ්දප්‍රකෘතීන්ගේ වශයෙන් දෙපරිදි වේ. අර්ථවත් සියලු ශබ්දයන්ගේම මුල් කොටස ධාතු ප්‍රකෘතියයි. අග කොටස ප්‍රත්‍යයයි. ඒ ධාතුප්‍රකෘතිය හා ප්‍රත්‍යයයන් යෙදීමෙන් අර්ථවත් ශබ්දප්‍රකෘතීන්ගේ නිෂ්පත්තිය වේ. ඒ ශබ්දප්‍රකෘති කෙරෙන් ද නැවත ප්‍රත්‍යය යෙදීමෙන් නානාවිධ අර්ථාන්විත ශබ්දයෝ නිපදිත්.

"බුඬ" යනු එසේ නිපන් ශබ්දප්‍රකෘතියක් යයි සිතිය යුතුයි. එහි මුල් කොටසවූ ධාතුව 'බුධ' යනුයි. අග කොටසවූ ප්‍රත්‍යය "ත" යනුයි. හුදකලා ධාතුව හෝ ප්‍රත්‍යය අර්ථවත් නොවේ. ඒ දෙක එකතුවීමෙන් නිපන් "බුඬ" යන්න අර්ථවත් වේ. මීට "ලිඞ්ග"යයි ද කියනු ලැබේ. මෙහි ධාතුවේ අර්ථය දැනීම යනුයි. ප්‍රත්‍යයේ අර්ථය කෙළේ හෝ කරන්නේ යනුයි. එබැවින් "බුඬ" යන්නේ අර්ථය දැනීම කෙළේ හෝ කරන්නේ යනුයි. (මෙසේ ශබ්දප්‍රකෘතීන්ගේ නිෂ්පත්ති ක්‍රමය මේ පොතේ 2 වැනි කාණ්ඩයේ ප්‍රකාශ කරන්නෙමු.

### නාමපදයන්ගේ භෙද.

## 5. නාමපදයෝ පඤ්චප්‍රකාරයහ.

චතුර්විධ පදයන් අතුරෙන් නාමපදයෝ වනාහි "කිතක නාම, තද්ධිතනාම, සමාසනාම, සබ්බනාම, සඞ්ඛ්‍යානාම" යයි

පස්වැදෑරුම් වෙත්. එහි ධාතුප්‍රත්‍යය සම්බන්ධයෙන් නිපන්නෝ කිතකනාම නම් ද, නාමය ප්‍රත්‍යය යන දෙදෙනාගේ සම්බන්ධයෙන් නිපන්නෝ තද්ධිතනාම නම් ද නාමපද දෙකක් හෝ වැඩියක් සම්බන්ධවීමෙන් නිපන්නෝ සමාසනාම නම් ද, ධාතුප්‍රත්‍යය සම්බන්ධයෙන් සියල්ලට සාධාරණව නිපන්නෝ සබ්බනාම නම් ද, ප්‍රඥප්තිවශයෙන් ඒ ඒ අයට ව්‍යවහාරකරණ "දෙව දත්ත" ආදි නාමයෝ සඤ්ඤානාම නම් ද වෙත්. (ප්‍රකෘතිප්‍රත්‍යය විභාගයෙන් තොරවූ ඇතැම් නාමයෝ ද ඇත්තාහ.)

**සබ්බ (සර්ව) නාම.**

**සබ්බ කතර කතම උභය ඉතර අඤ්ඤ අඤ්ඤතර අඤ්ඤතම පුබ්බ පර අපර දක්ඛිණ උත්තර අධර ය තඑත ඉම අමු කිං එක උභ ම් ති චතු තුම්හ අම්හ.**

මේ සත්විසි නාමයෝ පාළියෙහි "සබ්බනාම" යයි ව්‍යවහාර කරණලද්දාහ.

ලිඞ්ගභෙදය.

## 6. නාමයෝ ලිඞ්ගත්‍රය වර්නීහ.

පාළි භාෂාවෙහිවූ නාමයෝ "පුල්ලිඞ්ග, ඉත්ථිලිඞ්ග, නපුංසක ලිඞ්ග" යන ලිඞ්ගත්‍රයෙහි පවත්නාහු වෙත්. එහි පුරුෂ ගතියෙන් යුත් නාම පුල්ලිඞ්ගයයි ද, ස්ත්‍රීගතියෙන් යුත් නාම ඉත්ථිලිඞ්ගයයි ද ඒ ගතිවයෙන් හීනවූ නාම නපුංසකලිඞ්ග යයි ද, ලිඞ්ගවයකට සාධාරණවූ නාම ද්විලිඞ්ග නාමයයි ද, ලිඞ්ග ත්‍රයට සාධාරණවූ නාම තිලිඞ්ග නාමයයි ද කියනු ලැබෙත්. ක්‍රියාවාචකව නිපන් කිතක නාමයෝ ද, සමූහාර්ථ භාවාර්ථ ස්වාර්ථයන්හි නිපන් තද්ධිත හැර සෙසු තද්ධිත නාමයෝ ද, බහුව්‍රීහිසමාසාන්ත නාමයෝ ද, ගුණවාචක නාමයෝ ද, සංඛ්‍යා වාචක නාමයෝ ද, සර්වනාමයෝ ද තිලිඞ්ග වෙත්. සෙසුනාම ව්‍යවහාරානුසාරයෙන් දතයුතුයි. (නාමයන්ගේ ලිඞ්ගභෙදය භාෂා ව්‍යවහාරයෙන්ම දතයුතු වේ.)

5 පාඩම.

## නාමානං භෙදං.

## 7. අන්තභෙදයෙන් නාම අට කොටසෙකි.

පාළි භාෂාවෙහි නාමයෝ "අකාරාන්ත, ආකාරාන්ත, ඉකාරාන්ත, ඊකාරාන්ත, උකාරාන්ත, ඌකාරාන්ත, ඔකාරාන්ත, නිග්ගහීතාන්ත" යයි අටවැදෑරුම් වෙත්. මෙහි ඒ ඒ නාම යන්ගේ විභක්තිරූප යෙදෙන පරිද්දෙන් ඒ ඒ නාම ගණ වශයෙන් දක්වනු ලැබෙත්. ඒ ඒ ගණයන්හි එක් නාමයක පමණක් විභක්තිරූප දක්වන්නෙමු. ඒ අනුසාරයෙන් ඒ ගණ යෙහි සෙසු නාමයන්ගේ විභක්තිරූප ද දතයුතුයි.

### සාමාන්‍ය අකාරාන්ත නාම.

| පුල්ලිඞ්ග | | නපුංසකලිඞ්ග | | ඉත්ථිලිඞ්ග | |
|---|---|---|---|---|---|
| පාළි | අර්ථ | පාළි | අර්ථ | පාළි | අර්ථ |
| බුද්ධ | බුදු | චිත්ත | සිත් | වර | උතුම් |
| ධම්ම | දම් | පුඤ්ඤ | පින් | ධීර | නැණැති |
| සඞ්ඝ | සඟ | පාප | පව් | නීල | නිල් |
| සුර | දෙව් | ඵල | පල | පීත | රන්වන් |
| නර | මිනිස් | රූප | රූ | ලොහිත | රතු |
| අසුර | සුරසතුරු | සුඛ | සුව | සෙත | සුදු |
| පුරිස | පුරිස් | දුක්ඛ | දුක් | කණ්හ | කළු |
| උරග | සප් | සීල | සිල් | ගත | ගිය |
| නාග | නා | දන්ත | දත් | ඨිත | සිටි |
| යක්ඛ | යක් | ඝාණ | නාස් | සුත | ඇසූ |

මේ ඉත්ථිලිඞ්ග නාම ස්ත්‍රීලිඞ්ගයෙහි යෙදෙන කල්හි "වරා, ධීරා" යනාදි වශයෙන් ආකාරාන්ත වෙත්. ස්ත්‍රීලිඞ්ගවූ අකාරාන්තනාම පාළියෙහි අවිද්‍යමානයි.

## නාමාර්ථ හා විභක්ති.

---

# 8. නාමාර්ථ නවයෙකි.

භාෂාවිෂයෙහි වූ සියලු නාමයෝම අර්ථවශයෙන් නව යට බෙදෙත්. "ලිඞ්ගාර්ථ, ආලපනාර්ථ, කර්මාර්ථ, කර්තෲර්ථ, කරණාර්ථ, සම්ප්‍රදානාර්ථ, අපාදානාර්ථ, සම්බන්ධාර්ථ, ආධාරාර්ථ" වශයෙනි.

## ලිඞ්ගාර්ථාදියෙහි ලක්ෂණ

---

ලිඞ්ගාර්ථ නම්-නාමයාගේ නිෂ්පත්තියෙන් ඇතිවූ ප්‍රකෘති අර්ථයයි (වෙනසකට නොපැමිණි අර්ථයයි.)

ආලපනාර්ථ-ඒ නාමය ශබ්දයෙන් කථාදියෙහි අභිමුඛ වූවක් කිරීමයි.

කර්මාර්ථ - ,, ,, ක්‍රියාවකට යටත්වූවක් හෝ ක්‍රියාර්ථය ලබන්නක් කිරීමයි.

කර්තෲර්ථ - ,, ;, ක්‍රියාර්ථය සිද්ධකරන්නක් කිරීමයි.

කරණාර්ථ - ,, ,, ක්‍රියාසිද්ධියට උපකාරවූවක් කිරිමයි.

සම්ප්‍රදානාර්ථ- ,, ,, දාන ධාරණාදි ක්‍රියාවක් පිළිගැණීමට යොග්‍යවූවක් කිරීමයි.

අපාදානාර්ථ - ,, ,, අපගමනාදි ක්‍රියාවකට හෝ බියට ඉම්වූවක් කිරීමයි.

සම්බන්ධාර්ථ - ,, ,, කිසිවක්හුගේ හිමියෙක් (අයිතිකාරයෙක්) කිරීමයි.

ආධාරාර්ථ - ,, ,, ක්‍රියාවකට පිහිටවූවක් කිරීමයි.

## 9. නාමාර්ථයන් බෙදන්නී නාමවිභක්තියයි.

වාක්‍ය විෂයෙහි ඒ ඒ නාමයන්ගේ ප්‍රකෘතිරූප යෙදුව හොත් යථොක්ත ලිඞ්ගාර්ථාදිය බෙදී ප්‍රකටව නොහැගේ. එබැවින් ඒ ඒ තන්හි වාක්‍යයට සුදුසු පරිද්දෙන් ඒ ඒ අර්ථයන් බෙදා ප්‍රකට කිරීම සඳහා භාෂාවෙහි විභක්ති විධිය ඇති විය. ඒ ඒ නාමාර්ථයන් බෙදන විභක්ති විධිය නාම විභක්ති නම් වේ.

## 10. නාමවිභක්තිනාම සතක් හා තදීය ප්‍රත්‍යය තුදුසෙකි.

**“පඨමා දුතියා තතියා චතුත්ථී පඤ්චමී ඡට්ඨී සත්තමී”** යන මේ සත නාමවිභක්තීන්ට ව්‍යවහාරකරණ නාමයෝයි. **“සි යො, අං යො, නා හි, ස නං, ස්මා හි, ස නං, ස්මිං සු”** යන මේ තුදුස ඒ විභක්ති සතෙහි ප්‍රත්‍යයෝයි. එකවචන බහුවචන වශයෙන් විභක්තියක් පාසා දෙක දෙක බැගිනි.

6 පාඩම.

### නාමවිභක්ති

සාමාන්‍ය අකාරාන්ත පුල්ලිඞ්ග නාම කෙරෙන් යථොක්ත විභක්ති ප්‍රත්‍යය යෙදී ආදෙශාදිය වීමෙන්වූ පදනෙනාච්චාරණය මෙසේයි:-

| **වි: අර්ථ-** | **වි: නාම** | **වි: ප්‍රත්‍යය** | | | **අනෙනාච්චාරණය** | |
|---|---|---|---|---|---|---|
| ලිඞ්ගාර්ථ- | පඨමා | සි | යො | - | ඔ | ආ |
| ආලපනාර්ථ- | ,, | ,, | ,, | - | අ,ආ | ආ |
| කර්මාර්ථ- | දුතියා | අං | යො | - | අං | එ |
| කර්ත්‍රර්ථ- | තතියා | නා | හි | - | එන | එහි,එභි |
| කරණාර්ථ- | ,, | , | ,, | - | ,, | , |
| සම්ප්‍රදානාර්ථ- | චතුත්ථී | ස | නං | - | ආය, අස්ස; | ආනං |

| | | | | |
|---|---|---|---|---|
| අපාදානාඣී- | පඤචමී | සමා හි | - | ආ,අම්හා,අස්මා; එහි, එභි. |
| සම්බන්ධාඣී- | ඡට්ඨී | ස නං | - | අස්ස ආනං, |
| ආධාරාඣී- | සත්තමී | ස්මිං සු | - | එ අම්හි,අස්මිං;එසු |

---

### "බුද්ධ" නාමයේ විභක්තිරූප.

| එකවචන. | බහුවචන. |
|---|---|
| ප-බුද්ධො | බුද්ධා |
| ආ-(හෙ) බුද්ධ, බුද්ධා | බුද්ධා |
| දු-බුද්ධං | බුද්ධෙ |
| ත-බුද්ධෙන | බුද්ධෙහි, බුද්ධෙභි |
| ච-බුද්ධාය, බුද්ධස්ස | බුද්ධානං |
| ප-බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා | බුද්ධෙහි බුද්ධෙභි |
| ඡ-බුද්ධස්ස | බුද්ධානං |
| ස-බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං | බුද්ධෙසු. |

---

### නපුංසක ලිඞ්ගයෙහි විශෙෂරූප

| අකාරාන්ත ආවාරණය. | | "චිත්ත" නාමය. | |
|---|---|---|---|
| එක | බහු | එක | බහු |
| ප-අං | ආ, ආනි | චිත්තං | චිත්තා-චිත්තානි |
| ආ-අ | ආනි | චිත්ත | චිත්තානි |
| දු-අං | එ, ආ | චිත්තං | චිත්තෙ-චිත්තානි |

---

සෙසු විභක්තිරූප පුල්ලිඞ්ගයෙහි මෙනි.

### විභක්ත්‍යර්ථ සූචනය.

| පාළි. | සිංහල. |
|---|---|
| ලිඞ්ගාර්ථ-බුද්ධො භවති | බුදුරජ වේ |
| ආලපනාර්ථ-බුද්ධ භවං ධම්මං දෙසෙතු | බුදුරජානෙනි පින්වතුන්වහන්සේ දහම් දෙසන සේක්වා |

කර්මාර්ථ-බුද්ධං වන්‍දෙ — බුදුන් වඳිමි.
කර්තෘඅර්ථ-බුද්ධෙන දෙසිතො ධම්මො — බුදුන් විසින් දෙසනලද ධර්මය.
කරණාර්ථ-බුද්ධෙන ලොකො සුඛිතො — බුදුන් කරණ කොට ගෙණ ලොකයා සුවපත්විය.
සම්ප්‍රදානාර්ථ-බුද්ධස්ස මනං දදෙ — බුදුන්ට සිත දෙමි.
අපාදානාර්ථ-බුද්ධා විනිග්ගතොමාරො — බුදුන් කෙරෙන් මාරයා නික්ම ගියේය.
සම්බන්ධාර්ථ-බුද්ධස්ස ධම්මො — බුදුන්ගේ ධර්මය.
ආධාරාර්ථ-බුද්ධෙ මම භත්ති — බුදුන්කෙරෙහි මාගේ ආදරය වේ.

මේ අනුසාරයෙන් බහුවචනාර්ථද "බුදුවරු, බුදුවරුනි, බුදුවරයන්" යනාදි වශයෙන් දතයුතුයි. මෙහි "බුද්ධො" යන්නෙන් "බුද්ධ" යන නාමයාගේ ප්‍රකෘති අර්ථය පමණක් ප්‍රකාශිතයි. "බුද්ධ" යන්නෙන් "බුද්ධ" යන නාමය ධර්මදෙශනා වෙහි අභිමුඛකරගත් බැව් ප්‍රකාශිතයි. මේ දෙකෙන්ම නාම යාගේ ප්‍රකෘතිය මුත් වෙනසක් නොහැගේ. කර්මාර්ථාදියෙන් විශෙෂයක් ද හැගේ. ඒ මෙසේයි. "බුද්ධං" යන්නෙන් වන්‍දන ක්‍රියාව විඳින "බුද්ධ" යන නාමය බවද, "බුද්ධෙන" යන්නෙන් දෙශන ක්‍රියාවට කර්තෘවූ "බුද්ධ" යන නාමය බව හා ලොකයාගේ සුඛිත භාවයට ඉවහල්වූ "බුද්ධ" යන නාමය බවද, "බුද්ධස්ස" යන්නෙන් දානක්‍රියාවට යොග්‍යවූ "බුද්ධ" යන නාමය බවද, "බුද්ධා" යන්නෙන් අපගමන ක්‍රියාවට ඉම්වූ "බුද්ධ" යන නාමය බවද, "බුද්ධස්ස" යන්නෙන් ධර්මයෙහි ස්වාමියා (අයිතිකාරයා) වූ "බුද්ධ" යන නාමය බවද, "බුද්ධෙ" යන්නෙන් භක්තියට ආධාරවූ "බුද්ධ" යන නාමය බවද හැගේ. තවද ආලපන එකවචනයෙහි අකාරාන්තරූපය සමීපවූවෙකුට ආමන්ත්‍රණය කිරීමෙහිද, ආකාරාන්ත රූපය දුරවූවෙකුට ආමන්ත්‍රණය කිරීමෙහිද යෙදේ. චතුර්ථී එකවචනයෙහි "ආය" යන්නෙන් අන්තවූ රූපය තාදර්ථ්‍යයෙහි (පිණිස යන අර්ථ යෙහි) යෙදේ.

## 7. පාඩම.

### ආඛ්‍යාතපද.

## 11. අවසාන ක්‍රියාවාචකයෝ ආඛ්‍යාතයි.

වාක්‍යයක් අවසන් කිරීමට යෙදෙන ක්‍රියා වාචක පදයෝ ආඛ්‍යාත නම් වෙත්. සෙසු පදයන්ගේ සම්බන්ධයෙන් අදහස් කරණ අර්ථය ප්‍රකාශකිරීමට ඉවහල් යන අර්ථයෙන් "ආඛ්‍යාත"යයි කියනුලැබේ. ඒ ආඛ්‍යාතයෝ වනාහි ධාතුමය (ධාතුවලින් නිපන්නෝ) වෙත්. ධාතු නම් "භූ, කර" ආදියයි. අර්ථ විශෙෂයන් දරණ හෙයින් ධාතුයයි කියනු ලැබේ. ඒ ධාතු ගත අර්ථවිශෙෂයෝ ඇතැම් කෙනෙක් අකර්මකද ඇතැම් කෙනෙක් සකර්මකද වෙත්. කර්මය (ක්‍රියාර්ථය විඳින ඵලය) අපෙක්ෂාකිරීමෙහි ශක්තිය ඇති අර්ථයෝ සකර්මක නම්ද ඒ ශක්තිය නැති අර්ථයෝ අකර්මක නම්ද වෙත්.

**"සො භවති"** (හෙතෙමේ වෙයි) කීකල්හි වීමේ කර්තෘ කෙනෙක් හා ඊට ආධාරවූ ස්ථානාදියක් මුත් කර්මයක් අපෙක්ෂා කිරීමේ ශක්තියක් නැත්තේ වේ. **"සො කරොති"** (හෙතෙමේ කෙරේ) කීකල්හි ඒ කිරීම විඳින **"ගෙහං"** (ගේ) ආදි කර්මයක් අපෙක්ෂාකිරීමේ ශක්තිය ඇත්තේවේ. පාළි භාෂාව්‍යවහාරයෙහි ඇතැම් ධාත්වර්ථයන්ට කර්ම දෙකක් අපෙක්ෂාකිරීමෙහි ශක්තිය ඇත්තේ වේ. ඒ ධාතු ද්විකර්මක ධාතු නම් වෙත්. **"දාසො හරති"** (දාසතෙමේ ගෙණ යයි) කීකල්හි ගෙණ යන දෙයක් ද ඊට විෂයවූ තැනක් ද අපෙක්ෂාකිරීමේ ශක්තිය ඇත්තේ වේ. එකල්හි **"දාසො භණ්ඩං ගාමං හරති"** යනු වේ. මෙහි 'භණ්ඩංගාමං" යන දෙකම කර්මයි. පාළි භාෂාව්‍යවහාරයෙහි මෙබඳු තන්හි ඒ දෙකම කර්මරූපයෙන් යෙදේ. ඉන් එක් කර්මයෙක්හි කර්මාර්ථය ප්‍රකට නොවේ. එනම් මෙහි "ගාමං" යන්නෙහිය. ඊට අකථිත කර්මයයිද කියත්, කර්මාදි කාරකාර්ථ වශයෙන් නොකී කර්මය යන අර්ථයි.

ධාතුගත අර්ථවිශෙෂයන් **වර්තමාන අතීත අනාගත** යන කාලත්‍රයටද, **පඨම මජ්ඣිම උත්තම** යන පුරුෂත්‍රයටද, **කත්තු කම්ම** යන කාරකවයට හා **භාවයටද එකවචන බහුවචන** යන වචනවයටද, විධිනිමන්ත්‍රණාදි අර්ථවිශෙෂයන්ට ද සාධාරණ බැවින් ආඛ්‍යාතය ඒ භෙදයන්ගෙන් යුක්තයි.

එවේලෙහි පවත්නා ක්‍රියාව වර්තමාන නම්ද, ඉක්ම ගිය ක්‍රියාව අතීත නම්ද, පටන් නොගත් ක්‍රියාව අනාගත නම්ද වේ.

ධාත්වර්ථ සඞ්ඛ්‍යාත ක්‍රියාව විසින් අපෙක්ෂාකරණ නාම යෝ ලොකව්‍යවහාර වශයෙන් තුණට බෙදෙත්. එනම් තමාය යන මමත්වයෙන් 'මමය අපිය" යි ව්‍යවහාරකිරීමට යෙදෙන "අම්හ" ශබ්දය එක් කොටසක්ද, තමාට අභිමුඛ භාවයෙන් "තෝය තෙපිය"යි ව්‍යවහාරකිරීමට යෙදෙන "තුම්හ" ශබ්දය එක් කොටසක්ද, ඉන් අතිකෙකු වෙනුවට ව්‍යවහාරකරණ සෙසු නාම සියල්ලම එක් කොටසක්ද වේ.

ලොකයෙහි වනාහි තමා අන් අයට වඩා උතුම්කොට සැලකීම සවභාවයක් බැවින් ඒ මමත්වය ප්‍රකාශකරණ "අම්හ" ශබ්දයේ ප්‍රථමා විභක්තියවූ **"අහං මයං"** (මම අපි) යන දෙක අපෙක්ෂාකරණ ක්‍රියාව උත්තම පුරිසයයිද, ඊලඟට තමාට අභිමුඛවූ අය උතුම්යයිද සැලකියහැකි බැවින් ඒ අභිමුඛයා ප්‍රකාශකරණ 'තුම්හ" ශබ්දයේ ප්‍රථමාවිභක්තියවූ **"ත්වං තුම්හෙ"** (තෝ තෙපි) යන දෙක අපෙක්ෂාකරණ ක්‍රියාව මජ්ඣිම පුරිසයයිද, ඉන් අන්‍යවූවෙකු ප්‍රකාශකරණ නාමයන්ගේ ප්‍රථමාවිභක්තිය අපෙක්ෂාකරණ ක්‍රියාව පඨම පුරිසයයිද කියනුලැබේ. සිංහල ව්‍යාකරණයෙහි මේ තුණ වෙනුවට පිළිවෙළින් "මසදකරු, තසදකරු අන්කරු" යයි කියත්. ඒ ව්‍යවහාරය ඉතාම අර්ථාන්විත බැව් සැලකිය යුතුවේ. ක්‍රියා නිෂ්පත්තියට නිමිත්තවූයේ මසද ("අම්හ"ශබ්දය) නම් ඒ අපෙක්ෂාකරණ ක්‍රියාව මසදකරු කිරිය යනාදි වශයෙන් එහි අර්ථ ගතයුතුයි.

මෙකී පිළිවෙළින් ගතහොත් උත්තමපුරිසය මුලින් යොදා ව්‍යවහාර කටයුතු වේ. එහෙත් පාලි සංස්කෘතාදි ව්‍යාකරණ යන්හි පඨමපුරිසය මුලටත් උත්තමපුරිසය අගටත් යොදා ව්‍යවහාර කරණු ලැබේ. "අම්හ" ශබ්දගත "මයං (අපි)" යන අර්ථය ලැබෙන්නේ සෙසු නාමයක් හෝ "තුම්හ" ශබ්දය හෝ දෙකොටසම හෝ සම්බන්ධ වීමෙනි, එබැවින් පුරුෂ ව්‍යවහාරය මේ පිළිවෙළින් කරණලදි. ඒ මෙසේයි:-

**"සො ච ගච්ඡති"** (හෙතෙමේත් යෙයි) **"ත්වං ච ගච්ඡසි"** (උඹත් පලයන්) **අහං ච ගච්ඡාමි** (මමත් යෙමි) කීකල්හි ඒ සියල්ල සම්බන්ධවීමෙන් **"මයං ගච්ඡාම,** (අපි යමු)"යි යෙදේ.

ක්‍රියාතිෂ්පත්තියට (ප්‍රධාන) නිමිත්තවූයේ කර්තෘ නම් ඒ ක්‍රියාව කර්තෘකාරකයයිද, කර්මය නම් කර්මකාරකයයි ද, එසේ ක්‍රියාතිෂ්පත්තියට (ප්‍රධාන) නිමිත්තක් බලාපොරොත්තු නොවී මෙන් ධාත්වර්ථ මාත්‍රය පමණක් ප්‍රකාශකිරීමට යෙදෙන ක්‍රියාව භාව නම්ද වේ.

8 පාඩම.

**ආඛ්‍යාත විභත්ති.**

## 12. ධාත්වර්ථය බෙදන්නී ආඛ්‍යාත විභත්තියයි.

ධාතූන් පිළිබඳ අර්ථයන් කාලපුරුෂාදි වශයෙන් බෙදන්නී ආඛ්‍යාතවිභත්ති නමි.

## 13. ආඛ්‍යාත විභත්ති අටක් හා තදීය ප්‍රත්‍යයෝ අනූසයකි.

**"වත්තමානා, පඤ්චමී, සත්තමී, හීයත්තනී, අජ්ජතනී පරොක්ඛා, කාලාතිපත්ති, භවිස්සන්ති"** යන මේ අට ආඛ්‍යාත විභත්ති නම් වෙත්. මේ අටෙහි එකක් පාසා දොළොස බැගින් විභක්ති ප්‍රත්‍යයයෝ අනූසයෙකි. ඒ දොළො

සකිනුදු සයක් "පරස්සපද" නම් ද, සයක් "අත්තනොපද" නම් ද වේ. ඒ සයකින් මුල දෙක "පඨමපුරිස" නම් ද ඊළඟ දෙක "මජ්ඣිමපුරිස" නම් ද, ඉතිරි දෙක "උත්තම පුරිස" නම් ද වේ. ඒ දෙකකින් එකක් එකවචන හා එකක් බහුවචන වේ.

"වත්තමානා" යනාදි විභත්ති අටෙන් මුල තුණ වර්තමාන කාලික ද, ඊළඟ සතරක් අතීත කාලික ද "භවිස්සන්ති" විභත්තිය අනාගත කාලික ද වේ.

## ධාතු.

ආඛ්‍යාතයන්ගේ සිඩියට මුල්වූ ධාතු අප්‍රමාණ වෙත්. පෙර මේ වියරණ කළ පණ්ඩිතයෝ ඒ ධාතු සමූහය ගණවශයෙන් බෙදා පාළියෙහි ධාතුගණ සතක් දැක්වූහ. එනම් **"භවාදිගණය, රුධාදිගණය, දිවාදිගණය, සවාදිගණය, කියාදිගණය, තනාදිගණය, චුරාදිගණය"** කියායි. (ඇතැම් කෙනෙක් ධාතුගණ අටයයි ද කියත්) භවාදිගණය යන්නේ අර්ථය "භූ" ධාතුව පටන් කොට ඇති ධාතු සමූහයක් යනුයි, සෙස්ස ද එසේයි. මෙසේ ධාතුන්ගේ බෙදීම වූයේ භාෂාවෙහි ක්‍රියාරූප සිඩිය ප්‍රධාන වශයෙන් සතට බෙදී පවත්නා බැවිනි. ඒ බෙදීම සඳහා ප්‍රත්‍යය කොටසක් යෙදේ, ඒ ප්‍රත්‍යයන්ට "විකරණ" යයි නම් කරණු ලැබේ. ධාතුගණය වෙන්කිරීමට ඉවහල් යනු එහි අර්ථයි.

ආඛ්‍යාත පදයන්ගේ සිඩියේදී "ති" ආදි විභක්තිප්‍රත්‍යය යෙන් පූර්වභාගයෙහි සිටි ධාතු රූපය වෙනස්වීමෙන් රූපයක් සෑදේ, ඒ රූපය සෑදෙන්නේ ඒ විකරණ යොගාදියෙනි. පාළිභාෂාවෙහි හුදකලා සවරධාතු හා එක් ව්‍යඤ්ජන වර්ණය කින් යුත් ධාතු පමණක් සවරාන්ත වශයෙන් දතයුතුයි. සෙසු ධාතුන්ගේ අන්තයෙහි සවරයක් ඇතත් එය නැති හැටියට සැලකිය යුතුයි. මෙහි ඒ පිළිවෙළ හා ආඛ්‍යාතයේ තත්ත්වය පෙන්වනු සඳහා ධාතු කීපයක් දක්වන්නෙමු.

## භවාදි ගණ්ක ධාතු.

මෙහි විකරණය "අ" යනුයි.

| සිංහලාණී. | ධාතු | ධාතුවිකෘති. | ක්‍රියා. |
|---|---|---|---|
| වීම | භූ | භව | භවති |
| ,, | හූ | හො | හොති |
| සිටීම | ඨා | තිඨ-ඨා | තිඨති-ඨාති |
| හිදීම | නි-සද | නිසීද | නිසීදති |
| හොවීම | සි | සය-සෙ | සයති-සෙති |
| විසීම | වස | වස-වච්ඡ | වසති-වච්ඡති |
| වැටීම | පත | පත | පතති |
| මැරීම | මර | මීය-මර | මීයති-මරති |
| දිරීම | ජර | ජීර-ජීය | ජීරති-ජීයති |
| බැලීම | දිස | පස්ස | පස්සති |
| යාම | ගම | ගච්ඡ | ගච්ඡති |
| රිසිවීම | ඉසු | ඉච්ඡ-එස | ඉච්ඡති-එසති |
| ලැබීම | ලභ | ලභ | ලභති |
| කෑම | ඛාද | ඛාද | ඛාදති |
| බීම | පා | පිබ | පිබති |
| දීම | දා | දද | දදාති |

මෙහි ධාතු කෙරෙන් "අ" යන විකරණ ප්‍රත්‍යය හා ආදෙශාදිය වීමෙන් සිඩ "භව" ආදිය සමග "ති" ආදි විභක්ති ප්‍රත්‍යයයන් යෙදීමෙන් "භවති, භවන්ති" ආදි වශයෙන් ආඛ්‍යාතපද වරනැගෙත්. මෙහි "නි-සද" යන තන්හි "නි" යන්න උපසර්ගයි.

### 9. පාඩම.

## සන්ධි.

භාෂාවෙහි ඒ ඒ තන්හි එක්පදයක් පිළිබඳවූ හෝ පද දෙකක් පිළිබඳවූ හෝ වර්ණවයක් එකට ගැළපීම සන්ධි නම්. එසේ ගැළපීමෙන් උච්චාරණයෙහි පහසුව හා ඇසීමෙහි

මිහිරි බවද ඇති වේ. යථොක්ත ධාතුරූප හා විභක්ති ප්‍රත්‍යය යෙදීම් ආදියෙහිද වාක්‍යයන් ගැළපීමෙහි ද ඒ සන්ධි විධිය උවමනා වේ.

## ලොප සන්ධි.

---

### 14. පූර්වස්වරයාගේ හා පරස්වරයාගේ ලොපයෙන් සන්ධිවිධිවයක් සිඬයි.

ස්වර දෙක දෙක එකතුවූ ඇතැම් තන්හි ඒ දෙකෙන් පූර්වවූ ස්වරය ලොප්වීමෙන් එක් සන්ධි විධියක් ද, පරවූ ස්වරය ලොප්වීමෙන් එක් සන්ධි විධියක් ද වේ. එහි පූර්වස්වරලොපය සාමාන්‍යවිධි වශයෙන් දතයුතුයි. එබැවින් කොයි ස්වර දෙකක් එකතුවුවත් එහි පූර්වස්වරය ලොප් කට හැකි වේ. පරස්වරය ලොප්වන්නේ එකතුවූ ස්වරදෙක රූපවශයෙන් නොසම නම් එහි පමණෙකි.

එකපදික පූර්වස්වරලොප-භව=අන්ති-භවන්ති.
,, ,, පරස්වරලොප-කාරෙ=අන්ති-කරෙන්ති.
භින්නපදික පූර්වස්වරලොප-මයා=එව-මයෙව.
,, ,, පරස්වරලොප-ධම්මො=ඉති-ධම්මොති.
සමාසයෙහි පූර්වස්වරලොප-ලොක=අග්ගො-ලොකග්ගො.
,, ,, පරස්වරලොප-චක්ඛු=ඉන්ද්‍රියං-චක්ඛුන්ද්‍රියං.

සන්ධිවිධියෙහි එකපදික සන්ධි හා සමාස පිළිබඳ සන්ධි නිත්‍ය සන්ධි වශයෙන් සැලකිය යුතුයි. "අප-එති-අපෙති" යනාදි වශයෙන් සිඬවූ ධාතු උපසර්ග පිළිබඳ සන්ධි ද එසේයි. සෙසු සන්ධි කියන්නාගේ කැමැත්ත වශයෙනි.

තවද මෙහි පූර්වස්වරලොපය කොතන්හි වුවත් කට හැකියයි කිවද භාෂානුසාරයෙන් කටයුතුයි. "චක්ඛු ඉන්ද්‍රියං" යන තන්හි පූර්වස්වරය ලොප් කළහොත්

"චක්ඛින්ද්‍රියං" යනු වේ. එහෙත් එසේ නොවේ. පරස්වර ලොපය ද එසේයි. එනම් "ලොක උත්තමො" යන තන්හි පරස්වරය ලොප් කළහොත් "ලොකත්තමො" යනු වේ. එසේ නොවේ. මේ ආදි වශයෙන් දතයුතුයි.

## වත්තමානකාලික.

පරස්සපද කත්තුකාරක ආඛ්‍යාත.

---

### වත්තමානා.

| විභක්තිප්‍රත්‍යය | | භූධාතුසක්‍රියා | |
|---|---|---|---|
| එක | බහු | එක | බහු |
| ප-ති | අන්ති | භවති | භවන්ති |
| ම-සි | ථ | භවසි | භවථ |
| උ-මි | ම | භවාමි | භවාම |

### පඤ්චමී.

| | | | |
|---|---|---|---|
| ප-තු | අන්තු | භවතු | භවන්තු |
| ම-හි | ථ | භව-භවාහි | භවථ |
| උ-මි | ම | භවාමි | භවාම |

### සත්තමී.

| | | | |
|---|---|---|---|
| ප-එය්‍ය | එය්‍යුං | භවෙ-භවෙය්‍ය | භවෙය්‍යුං |
| ම-එය්‍යාසි | එය්‍යාථ | භවෙය්‍යාසි | භවෙය්‍යාථ |
| උ-එය්‍යාමි | එය්‍යාම | භවෙය්‍යාමි | භවෙය්‍යාම |

මේ විභක්ති තුණ සාමාන්‍යයෙන් වර්තමානකාලිකවුවත් පඤ්චමිය බොහෝ සෙසින් "**ආණත්ති** (ඇණවීම) **පත්ථනා** (නොපත් ඉටුදේ පැතීම) යනාදි අර්ථයන්හි ද, සත්තමිය **අනුමති** (ක්‍රියාව කිරීම සඳහා කැමැත්තෙන් ඉන්නෙකුට ඒ යහපතැයි අනුදැනීම) **පරිකප්ප** (ක්‍රියාර්ථයාගේ නිශ්චය රහිතභාවය) යන මේ ආදි අර්ථයන්හි ද යෙදෙන බැව් සැල කිය යුතුයි.

**ආණත්ති**-ධම්මිකො භවතු භවං. (පින්වත් තෙමේ ධාර්මිකයෙක් වන්නේ)

**පත්‍ථනා**-සුඛී භවතු භවං. පින්වත් තෙමේ සුවපත් වේවා.)

**අනුමති** ඉහ නිසින්නො භවෙය්‍ය භවං. (පින්වත් තෙමේ මෙහි සිටින්නෙක් වන්නේ)

**පරිකප්ප**-යදි ලජ්ජී භවෙය්‍ය, පාපා විරතො භවෙය්‍ය. (ලජ්ජියෙක් වන්නේ නම් පාපයෙන් වෙන් වන්නේය.)

මේ විභක්තිවය විධිනිමන්ත්‍රණාදි අර්ථයන්හි ද යෙදේ. භාෂානුසාරයෙන් දතයුතුයි. තවද මෙහි දැක්වූ ඉතිරි ධාතූන්ගේ ක්‍රියාරූපද මේ අනුසාරයෙන් දතයුතුයි. ' හොති හොන්ති, හොසි හොථ, හොමි හොම'' යනාදි වශයෙනි.

10 පාඩම.

**වාක්‍ය විධිය.**

## 15. පදසම්බන්ධය වාක්‍යයයි.

මෙහි පද සතර පිළිබඳ තත්ත්වය සැකෙවින් කියන ලදී. දැන් ඒ පදසතර සම්බන්ධකිරීම දතයුතු වේ. පද සමුදය යක් සම්බන්ධවීමෙන් ඒ ඒ අදහස් පහළකරන්නේ වාක්‍ය යයි කියනු ලැබේ.

පද සතරෙන් ආඛ්‍යාතපදය ප්‍රධාන යයි සැලකිය යුතුයි. **''භවති''** යනු ආඛ්‍යාතපදයි. එහි අර්ථය ''වෙයි'' යනුයි. එසේ ''භවති, (වේ)'' කීකල්හි වන්නාවූ කිසිවක් ඇති වියයුතු මැයි. ඒ සොයත් හොත් ඒ හා යෙදෙන **''පුරිසො''** (පුරිස්) ආදි නාමපදයක් ඒ හා සම්බන්ධ කට යුතු වේ. එකල **''පුරිසො භවති''** යනු වේ. (පුරුෂයා වේ) යන අර්ථයි. මේ පදද්වයකින්වූ වාක්‍යයෙකි. මේ ''භවති'' යන හුදකලා ක්‍රියාව උපසර්ග යොගයෙන් විශෙෂාර්ථ ඇත් තාක් විය හැකි වේ. ඒ විශෙෂාර්ථයක් ගතයුතුවුව හොත්

අදහස් කළ අර්ථයට යොග්‍ය උපසර්ග පදයක් ද ඒ හා යොදා ගතයුතුයි. පුරුෂයාගේ වීම සමර්ථභාවයෙන් යුත් වීමක්යයි ප්‍රකාශකිරීමට අදහස් කරත්හොත් ඒ “භවති” යන්න හා “ප” යන උපසර්ගපදය සම්බන්ධ කොට කියයුතු වේ. එකල්හි **“පුරිසො පහවති”** යනු වේ. (පුරුෂයා සමර්ථ වේ) යන අර්ථයි. මේ පද තුණකින් වූ වාක්‍යයෙකි. සමර්ථ වන්නේ ඒ පුරුෂයා පමණක් නොවේ. අන් අයටත් ඒ සමර්ථභාවය සාධාරණ බැව් ප්‍රකාශ කොට කියනු කැමැති කල්හි ඒ ප්‍රකාශ කිරීමට යොග්‍ය නිපාතපදයක් ද ඒ හා සම්බන්ධ කොට කියහැකි වේ. “ච” යන නිපාත පදය ඊට යොග්‍ය වේ. ඒ සම්බන්ධ කළ කල්හි **“පුරිසො ච පහවති”** යනු වේ. (පුරුෂයාද සමර්ථ වේ යන අර්ථයි.) මේ පදසතරම සම්බන්ධ වීමෙන් වූ වාක්‍යයෙකි.

මේ පදයන්ගේ යෙදීම අදහස් වශයෙනි. එක් වාක්‍යයෙක්හි නාමාර්ථ නවයම උවමනා නම් එහි එසේ ද යෙදේ. ඒ මෙසේයි:

**2 යො පුරිස 1 සො සද්ධො 8 අත්තනො 9 ගෙහෙ 4 තෙනෙව 3 පක්කං භොජනං 5 සහත්ථෙනෙව සඞ්ඝස්ස දත්වා භවා පරිමුච්චි.**

මේ නාමාර්ථ නවයෙන් යුත් පදයන්ගේ සම්බන්ධයෙන් වූ වාක්‍යයෙකි. මෙහි ඒ ඒ නාමාර්ථ අඞ්කානුසාරයෙන් දතයුතුයි. “පින්වත් පුරුෂය ඒ සැදැහැවත් තෙමේ තම ගෙහි ඔහු විසින්ම පිසනලද භොජනය සියතින්ම සඟනට දී බෙවෙන් මිදුනේය” යනු එහි අර්ථයි. මේ වාක්‍යයෙහිදු “මුච්චි” යනු ආඛ්‍යාතපදයි. “පරි” යනු උපසර්ගපදයි. “එව” යනු නිපාතපදයි. “දත්වා” යනු පූර්ව ක්‍රියාපදයි. සෙසු පද නාමපදයි. මෙසේ ඒ ඒ අදහස් පහළ කිරීමට උවමනා පද යෙදීමෙන් වාක්‍ය ගැළපීම කටයුතුයි.

### උක්තකර්තෘක අකර්මක වාක්‍ය සම්බන්ධය.

වාක්‍ය සම්බන්ධයෙහි ප්‍රධාන වශයෙන් ආඛ්‍යාතපදය ගැණ සෙවිය යුතුයි. ආඛ්‍යාතපදය කර්තෘකාරක නම් එයින්

උක්තවන්නේ (කියවෙන්නේ) කර්තෘපදයයි. ඒ උක්ත කර්තෘ යයි කියනු ලැබේ. උක්තවූ කොයිපදයක් වුවත් ප්‍රථමා විභක්තියෙන්ම යෙදෙන බැව් දතයුතුයි.

අකර්මකධාතුක කර්තෘකාරක ආඛ්‍යාතපදයෙන් උක්තවන කර්තෘ හා සෙසු විභක්ත්‍යර්ථයන් අතුරෙන් කර්මාර්ථ ද්විතීයාව හැර සෙසු විභක්ත්‍යන්තයෝ යෙදෙන පරිද්දෙන් දතයුතුයි. (ද්විතීයා විභක්තිය ද ක්‍රියාවිශෙෂණ වශයෙන් යෙදේ.)

**පුරිසො** තිට්ඨති ගෙහෙ (පුරුෂයා ගෙහි සිටී.)

**සො** සුඛං වසතු භොජනෙන (හෙතෙමේ බොදුනෙන් සුවසේ වෙසේවා)

රුක්ඛා **ඵලානි** පතෙය්‍යුං (රුකෙන් ගෙඩි වැටෙන්නාහ)

11 පාඩම.

## උක්තකර්තෘක අනුක්තකර්මවාක්‍ය.

සකර්මකධාතුවකින් සිද්ධ කර්තෘකාරක ආඛ්‍යාතයක් වුවොත් එහි අනුක්ත වශයෙන් කර්මයක් යෙදේ. සෙසු විභක්ත්‍යර්ථයන්ගෙන් යුත් පද ද අදහස් පරිද්දෙන් යෙදිය හැකි වෙත්.

සො පුරිසො **ගෙහං** කාරෙති (ඒ මිනිහා ගෙයක් කෙරේ)

**ත්වං** අපි තත්‍ර **ගෙහං** කාරෙහි (උඹත් එහි ගෙයක් කරපන්)

යදි ඔකාසො භවෙය්‍ය, අහං අපි කාරෙය්‍යං (ඉඩ තිබුනොත් මමත් කරන්නෙමි)

මෙහි "අපි, තත්‍ර, යදි" යන මොහු නිපාත පදයෝයි. තවද ඇතැම් තන්හි එක් ක්‍රියාවකින් කර්තෘ පද දෙකක් හෝ කර්මපද දෙකක් බලාපොරොත්තු විය හැකි වේ.

සො පුරිසො සප්පුරිසො භවති. (ඒ මිනිහා සත්පුරුෂ යෙක් වේ.)

සො පුරිසො කාඨං හසමං කාරෙති. (ඒ මිනිහා කාෂාය හලු කෙරේ.)

මෙහි "පුරිසො, සප්පුරිසො" යන දෙකම "භවති" යන ක්‍රියාවේ උක්තකර්තෘ පදයි. "පුරිසො" යන්න ප්‍රකෘති කර්තෘ ද, "සප්පුරිසො" යන්න විකෘති කර්තෘ ද වේ. එසේම "කාඨං" යන්න "කාරෙති" යන ක්‍රියාවේ ප්‍රකෘති කර්ම ද "හසමං" යන්න විකෘති කර්ම ද වේ. මුල් ආකාරය ප්‍රකාශකිරීමට යෙදූ පදය ප්‍රකෘති නම් ද, එහි වෙනසක් ප්‍රකාශකිරීමට යෙදූ පදය විකෘති නම් ද වේ. (ප්‍රකෘතිය විශෙෂ්‍ය ද, විකෘතිය විශෙෂණ ද වියයුතුයි.

1 මිනිසුන්ගේ රූපය දිරයි.

2 සත්තු මැරෙත්.

3 තවුසෝ පත් ඇතිරියෙහි හිඳිත්.

4 උඹ පුටුවේ හිඳපන්.

5 ඉදින් ඇඳක් ඇත්නම් සැතපෙන්න.

6 ඒ මිනිහා පිරිසිදු කෙනෙක් වේ.

7 යදියන්ට ධනය දීපන්.

8 ගමට පලයන්.

9 ගස්වලින් මල් වැටෙත්.

මේ වාක්‍යයන් පාළියට පෙරළනු.

| සිංහල | පාළි | සිංහල | පාළි | සිංහල | පාළි |
|---|---|---|---|---|---|
| සත් | සත්ත | ඇඳ | මඤ්ච | යදි | යාචක |
| තවුස් | තාපස | පිරිසිදු | පරිසුද්ධ | ගම | ගාම |
| පුටු | පීඨ | උණුදිය | උණ්හොදක | ගස් | රුක්ඛ |
| ඉදින් | සචෙ | සිහිල් | සීත | මල් | පුප්ඵ |

## 12 පාඩම.

## විශෙෂ අකාරාන්ත නාම.

| 1 | | 2 | | 3 | |
|---|---|---|---|---|---|
| පුං:න:ලිඞ්ග | | තිලිඞ්ග | | තිලිඞ්ග | |
| පාළි | අර්ථ | පාළි | අර්ථ- | පාළි | අර්ථ |
| මන | සිත් | ගුණවන්තු | ගුණැති | ගච්ඡන්ත | යන |
| වච | වදන් | ධනවන්තු | දනැති | කුබ්බන්ත | කරණ |
| වය | වයස් | සිරිමන්තු | සිරිඇති | පචන්ත | හදූරණ |
| තප | තපස් | සතිමන්තු | සිහිඇති | ජානන්ත | දන්න |
| චෙත | සිත් | චක්ඛුමන්තු | ඇස්ඇති | දදන්ත | දෙන |
| තම | අඳුරු | භානුමන්තු | රැස්ඇති | සුණන්ත | අසන |
| යස | යසස් | කතවන්තු | කළ | භවන්ත | වන |
| පය | කිරි | ගතවන්තු | ගිය | තිට්ඨන්ත | සිටින |

මෙහි 1 කොටසේ නාම බොහෝ සේ පුන්නපුංසක ලිඞ්ගද්වයෙහි පවත්නා බැව් පෙණේ. පුංලිඞ්ගාවස්ථාවෙහි “බුද්ධ” ශබ්දයාගේ මෙන් ද, නපුංසකලිඞ්ගාවස්ථාවෙහි “චිත්ත” ශබ්දයාගේ මෙන් ද විභක්තිරූප සිඬයි. මේ ගණයට අයත් නාම පාළියෙහි අකාරාන්ත වුවත් සංස්කෘතයෙහි මනස් ආදි වසයෙන් සකාරාන්ත වෙත්. පාළියෙහිදු පද සිද්ධි විෂයෙහි බොහෝ තන්හි සකාරය ආගම වේ.

“මන” ශබ්දයාගේ තතියා එකවචනයෙහි “මනසා” යන රූපය ද, චතුත්ථී ඡට්ඨී එකවචනයන්හි ‘මනසො” යන රූපයද, සත්තමී එකවචනයෙහි “මනසි” යන රූපය ද විශෙෂ රූපයෝයි. “සිර උර තෙජ රජ ඔජ” යන ආදිය ද මේ ගණයෙහි නාමයි.

2 කොටසෙහි නාම උකාරාන්තභාවයෙන් පෙණෙතත් පදසිද්ධි විෂයෙහි අකාරාන්ත වන බැවින් පෞරාණිකයන් ද අකාරාන්ත ගණයෙහි ඇතුළත් කරණ ලද්දුහ. මේ නාමයෝ

සංස්කෘතයෙහි "ගුණවත්" ආදි වශයෙන් තකාරාන්ත වෙත්. "ගච්ඡන්ත" ශබ්දාදිය ද සංස්කෘතයෙහි "ගච්ඡත්" ආදි වශයෙන් තකාරාන්තයි. මේ ශබ්දයන්ගේ අර්ථ "යමින්" යනාදි වශයෙන් ද දතයුතුයි.

### "ගුණවන්තු" ශබ්දය.

| | එක | බහු |
|---|---|---|
| ප- | ගුණවා | ගුණවන්තො, ගුණවන්තා |
| ආ- | ගුණවං, ගුණව, ගුණවා | " " |
| දු- | ගුණවන්තං | ගුණවන්තෙ |
| ත- | ගුණවතා, ගුණවන්තෙන | ගුණවන්තෙහි, ගුණවන්තෙභි |
| ච- | ගුණවතො, ගුණවන්තස්ස | ගුණවතං, ගුණවන්තානං |
| ප- | ගුණවතා, ගුණවන්තම්හා, ගුණවන්තස්මා | ගුණවන්තෙහි, ගුණවන්තෙභි |
| ඡ- | ගුණවතො, ගුණවන්තස්ස | ගුණවතං, ගුණවන්තානං |
| ස- | ගුණවති, ගුණවන්තෙ, ගුණවන්තම්හි, ගුණවන්තස්මිං | ගුණවන්තෙසු |

3 කොටසෙහි නාමයන්ගේ පඨමා එකවචන "ගච්ඡං ගච්ඡන්තො, කුබ්බං-කුබ්බන්තො" යන ආදි වශයෙනි. සෙසු රූප 2 කොටසෙහි මෙනි.

### නපුංසකලිඞ්ගයෙහි

| | | |
|---|---|---|
| ප- | ගුණවං | ගුණවන්තා, ගුණවන්තානි - ගුණවන්ති |
| ආ- | ගුණව | " " |
| දු- | ගුණවන්තං | ගුණවන්තෙ, ගුණවන්තානි- ගුණවන්ති |

---

| | | |
|---|---|---|
| ප- | ගච්ඡන්තං | ගච්ඡන්තා-ගච්ඡන්තානි |
| ආ- | ගච්ඡං-ගච්ඡන්ත | " " |
| දු- | ගච්ඡන්තං | ගච්ඡන්තෙ-ගච්ඡන්තානි |

සෙසු විභක්තිරූප පුල්ලිඞ්ගයෙහි මෙන් යොදාගත යුතුයි. මේ නාම ස්ත්‍රීලිඞ්ගයෙහි යෙදෙන කල්හි "ගුණවතී-ගුණවන්තී, ගච්ඡතී-ගච්ඡන්තී" යනාදි වශයෙන් ඊකාරාන්ත වෙත්. ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගයන්ගේ මෙන් විභක්තිරූප දතයුතුයි.

**සතිමන්තා ධම්මං සුණන්තා තුස්සන්ති**
**ගුණවන්තා පුඤ්ඤානි කුබ්බන්තා වසන්තු**
**සිරිමන්තා පුඤ්ඤං කතවන්තා භවෙය්‍යුං.**

මේ වාක්‍යයන්හි අර්ථ දක්වා ක්‍රියා කර්තෘ කර්ම උක්තානුක්ත වශයෙන් පැවසිය යුතුයි.

ඇස් ඇත්තෝ රූපයන් බලත්.
ධනය ඇත්තෝ දන් දෙමින් සතුටු වෙත්වා.
පින් කළාහු යසසින් උතුම් වන්නාහ.

මේ වාක්‍යයන් පාළියට පෙරළනු.

13 පාඩම.

## අතීතකාලික ආඛ්‍යාත.

### හියත්තනී පරස්සපද

| විභක්තිප්‍රත්‍යය. | | කර්තෘකාරකක්‍රියා. | |
|---|---|---|---|
| **එක** | **බහු** | **එක** | **බහු** |
| ප: පු-ආ | ඌ | අහවා | අහවූ |
| ම: පු-ඔ | ත්ථ | අහවො | අහවත්ථ |
| උ: පු-අ | ම්හා | අහව-අහවං | අහවම්හා |
| **අජ්ජතනී** | | | |
| ප: පු-ඊ | උං | අහවී-හවි | අහවුං-හවුං<br>අහවිංසු-හවිංසු |
| ම: පු-ඔ | ත්ථ | අහවො-හවො | අහවිත්ථ හවිත්ථ |
| උ: පු-ඉං | ම්හා | අහවිං-හවිං | අහවිම්හා-හවිම්හා |

ඊයේයයි කිය හැකි දින පටන් ඉක්ම ගිය ක්‍රියාව හියත්තනීයයි ද, අදය කිය හැකි දිනයෙහි ඉක්ම ගිය ක්‍රියාව අජ්ජතනීයයි ද කියනු ලැබේ. (එසේ වුවත් මේ විභක්තිවය අවිශෙෂයෙන් සාමාන්‍ය අතීතයට ව්‍යවහාර කරණලදී.)

මේ ක්‍රියාපදයන්ගේ ආදියෙහි "අ" යන්න ආගම වශයෙන් යෙදීමෙන් "අහවා, අහවී" යන ආදිය සිද්ධයි. ඇතැම් තන්හි ඒ අයන්න නොයෙදීමෙන් 'හවා හවී' යනාදී වශයෙන් ද සිද්ධයි. ආඛ්‍යාත පදයන්ගේ සිද්ධියෙහි භෙදයෝ බොහෝයි. මෙහි ඒ භෙදයන් දක්වීම නොව ආඛ්‍යාත විභක්තිප්‍රත්‍යයන් හැඳින්වීම පමණක් අදහස් කරණු ලැබේ. එයින් භාෂාව්‍යවහාරයෙහි ක්‍රියාරූප හැඳිනගත යුතුයි.

## "භූ" ආදි ධාතූන්ගේ අතීත ක්‍රියාරූප,

| ධාතු | පඨමපුරිස | | මජ්ඣිමපුරිස | | උත්තමපුරිස | |
|---|---|---|---|---|---|---|
| භූ— | අහොසි | අහෙසුං | අහොසි | අහොසිත්ථ | අහොසිං | අහුම්හ |
| ඨා— | අඨාසි | අඨංසු | අඨාසි | අඨාසිත්ථ | අඨාසිං | අඨම්හ |
| සද— | නිසීදි | නිසීදිංසු | නිසීදි | නිසීදිත්ථ | නිසීදිං | නිසීදිම්හ |
| සී— | සයි* | සයිංසු | සයි | සයිත්ථ | අසයිං | අසයිම්හ |
| වස— | වසි | වසිංසු | වසි | වසිත්ථ | වසිං | වසිම්හ |
| පත— | පති | පතිංසු | පති | අපතිත්ථ | අපතිං | අපතිම්හ |
| මර— | මීයි | මීයිංසු | මීයි | මීයිත්ථ | මීයිං | මීයිම්හ |
| ජර— | ජීයි-ජීරි | ජීයිංසු-ජීරිංසු | ජීයි-ජීරි | ජීයිත්ථ-ජීරිත්ථ | ජීයිං-ජීරිං | ජීයිම්හ ජීරිම්හ |
| දිස— | පස්සි | පස්සිංසු | පස්සි | පස්සිත්ථ | පස්සිං | පස්සිම්හ |
| ගම— | අගමි | අගමිංසු | අගමි | අගමිත්ථ | අගමිං | අගමිම්හ |
| ඉසු— | ඉච්ඡි | ඉච්ඡිංසු | ඉච්ඡි | ඉච්ඡිත්ථ | ඉච්ඡිං | ඉච්ඡිම්හ |
| ලභ— | ලභි | ලභිංසු | ලභි | ලභිත්ථ | ලභිං | ලභිම්හ |
| බාද— | බාදි | බාදිංසු | බාදි | බාදිත්ථ | බාදිං | බාදිම්හ |
| පා— | පිවි | පිවිංසු | පිවි | පිවිත්ථ | පිවිං | පිවිම්හ |
| දා— | අදාසි | අදංසු | අදාසි | අදාසිත්ථ | අදාසිං | අදදිම්හ |

* මේ ක්‍රියා "අසයි" ආදි වශයෙන් ද සිඩයි. භාෂානුසාරයෙන් දතයුතුයි.

මේ අර්ථයන්හිවූ මේ ධාතූන්ගේ ක්‍රියාරූප මීට වෙනස් ආකාරයෙන්ද සිඩයි, භාෂානුසාරයෙන් දතයුතුයි.

**තෙ බාලා ගමනං කරොන්තා ඛාදිංසු**-(ඒ මෝඩයෝ ගමන් කරමින් කැවාහ)

**මයං පුබ්බෙ විහාරං අගම්මහ**-(අපි පෙර විහාරයට ගියෙමු)

**තුම්හෙපි අගමිත්ථනු**-(තෙපිත් ගියහුද?)

මෙහි "අපි, නු" යන දෙක නිපාත පදයි. මේ වාක්‍යත්‍රයේ ක්‍රියා හා ඉන් උක්ත අනුක්ත කර්තෘ කර්මයන් දක්වනු.

"ජීයිංසු, ඉච්ඡිත්ථ, ලභිම්හ" යන මේ ක්‍රියා තුණට කර්තෘ කර්මාදිය යොදා වාක්‍ය තුණක් ගලපනු.

14 පාඩම.

## විශෙෂ අකාරාන්ත නාම.

---

### රාජ (රජ) අත්ත (තම) බ්‍රහ්ම (බඹ) කම්ම (කම්)

මේ ආදි අකාරාන්ත නාමයන්ගේ ඇතැම් විභක්තිරූප සෙසු අකාරාන්තයන්ගේ මෙන් නොව වෙනස් වශයෙන් සිඩයි. මේ නාමයෝ සංස්කෘතයෙහි "රාජන්" ආදි වශයෙන් නකාරාන්ත වෙත්. පාළියෙහි ද මොවුන්ගේ විභක්තිරූප සිඩියේදී බොහෝ සෙයින් නකාරවත්වීම පෙණේ.

#### "රාජ" ශබ්දය

| | එක | බහු |
|---|---|---|
| **ප**- | රාජා | රාජානො |
| **ආ**- | රාජ, රාජා | ,, |
| **දු**- | රාජානං, රාජං | ,, |
| **ත**- | රඤ්ඤා, රාජෙන | රාජූභි, රාජූහි, රාජෙභි, රාජෙහි |
| **ච**- | රඤ්ඤො රාජිනො | රඤ්ඤං, රාජූනං, රාජානං |
| **ප**- | රඤ්ඤා | රාජූභි, රාජූහි, රාජෙභි, රාජෙහි |
| **ඡ**- | රඤ්ඤො, රාජිනො | රඤ්ඤං, රාජූනං, රාජානං |
| **ස**- | රඤ්ඤෙ, රාජිනි | රාජූසු, රාජෙසු |

තතියාවේ පටන් "අත්ත" ශබ්දාදීන්ගේ විභක්තිරූප මීට වෙනස් වෙත්. මේ සියලු ශබ්දයන්ගේම තතියා පචමී දෙකද චතුත්ථී ඡට්ඨී දෙකද රූපවශයෙන් සමයි. එබැවින් පචමී ඡට්ඨී දෙක බොහෝසේ නොකියනු ලැබේ.

**"අත්ත" ශබ්දය**

| | |
|---|---|
| **ත**-අත්තනා, අත්තෙන | අත්තනෙහි, අත්තනෙභි |
| **ච**-අත්තනො | අත්තානං |
| **ස**-අත්තනි | අත්තනෙසු |

**"බ්‍රහ්ම" ශබ්දය**

| | |
|---|---|
| **ත**-බ්‍රහ්මුනා | බ්‍රහ්මෙහි, බ්‍රහ්මෙභි |
| **ච**-බ්‍රහ්මුනො, බ්‍රහ්මස්ස | බ්‍රහ්මානං, බ්‍රහ්මුනං |
| **ස** බ්‍රහ්මනි | බ්‍රහ්මෙසු |

ආලපන එකවචනයෙහි "බ්‍රහ්මෙ" යන රූපය ද වේ. සෙසුරූප "රාජ" ශබ්දයෙහි මෙන් දතයුතුයි.

**නපුංසක ලිඞ්ග "කම්ම" ශබ්දය**

| එක | බහු |
|---|---|
| **ප**-කම්මං | කම්මා, කම්මානි |
| **ආ**-කම්ම | " " |
| **දු**-කම්මං | කම්මෙ-කම්මානි |
| **ත**-කම්මුනා, කම්මනා, කම්මෙන | කම්මෙහි, කම්මෙභි |
| **ච**-කම්මුනො, කම්මස්ස | කම්මානං |
| **ප**-කම්මුනා, කම්මා, කම්මස්මා, කම්මම්හා | කම්මෙහි, කම්මෙභි |
| **ඡ**-කම්මුනො, කම්මස්ස | කම්මානං |
| **ස**-කම්මනි, කම්මෙ, කම්මම්හි, කම්මස්මිං | කම්මෙසු |

---

**නිග්ගහීතය පිළිබඳ ලොප සන්ධි**

---

## 16. නිග්ගහීතලොපයෙන් හා නිග්ගහීතයෙන් පරවූ සවරලොපයෙන් සන්ධි විධිවයක් සිඬයි.

ඇතැම් තන්හි සවරයෙන් හෝ ව්‍යඤ්ජනයෙන් පූර්ව නිග්ගහීතය ලොප්වීමෙන් සන්ධි විධියක්ද, ඇතැම් තන්හි නිග්ගහීත

යෙන් පරවූ සවරය ලොප්වීමෙන් සන්ධිවිධියක්ද සිඩයි. මේ නිග්ගහීතලොපය වනාහි ගාථාබන්ධනවිෂයෙහි ඡන්දස් නොපිරිහීම පිණිස හෝ සුබොච්චාරණය පිණිස කරණු ලැබේ.

**සවරයෙන් පූර්ව නිග්ගහීතලොපය**-තාසං=අහං=තාසාහං
**ව්‍යඤ්ජනයෙන් ,, ,, ,,** -බුද්ධානං=සාසනං=බුද්ධානසාසනං
**නිග්ගහීතයෙන් පර සවරලොපය**-චක්කං=ඉව=චක්කංව.

"තාසාහං" යන තන්හි නිග්ගහීතලොපයෙන් පසු සකාරයට අකාර ලොපය ද පරසවර දීර්ඝය ද විය.

**ලොපාගමසන්ධි.**

---

# 17. සො එසො යන පදයන්ගේ අන්තලොපයෙන් හා අකාරාගමයෙන් සන්ධිවිධියෙකි.

ඇතැම් තන්හි ' සො, එසො" යන පදයන්ගේ ඔකාරය ලොප්වීමෙන් හා එහි අකාරයක් ආගම වීමෙන් සන්ධිවිධියක් සිඩයි. ඒ වැඩි වශයෙන් වන්නේ ව්‍යඤ්ජනවර්ණයකින් ආදියෙහි සිටි පදයන් පිළිබඳවයි. ' එසො" යන්නේ අන්තලොපය සවරයෙන් පූර්ව තන්හි ද වේ. 'සො=සීලවා=සසීලවා. එසො=ධම්මො=එසධම්මො. එසො=අත්ථො=එස අත්ථො" යනාදී වශයෙනි.

15 පාඩම.

**අකාරාන්ත සර්ව නාමයන්ගේ විභක්තිරූප.**

| **පාළි** | **සිංහල** | **පාළි** | **සිංහල** |
|---|---|---|---|
| සබ්බ | සියලු | අඤ්ඤතර | එක්තරා |
| කතර | කවර | අඤ්ඤතම | ,, |
| කතම | ,, | ය | යම් |

| | | | |
|---|---|---|---|
| උභය | දෙක | ත | ඒ |
| ඉතර | සෙසු | එත | ඔය |
| අඤ්ඤ | අන් | කිං | කිම් |

මේ සර්වනාම ශබ්දයන්ගේ තවත් බොහෝ අර්ථයෝ වෙත්. ඒ අර්ථ මෙහි දක්විය හැකි නොවෙත්. සර්වනාම ශබ්දයන්ගේ තත්ත්වය නම් වෙන කවර නාමයකට වුවත් සාධාරණව පැවැත්මයි. එබැවින් සර්වනාමයෝ ලිඞ්ගත්‍රයෙහි නාමයන්ට විශෙෂණව ලිඟුතුණෙහිම පවතිත්. මේ නාම පුංලිඞ්ගයෙහි හා නපුංසක ලිඞ්ගයෙහි අකාරාන්ත වෙත්. සත්‍රීලිඞ්ගයෙහි ආකාරාන්ත වෙත්. මෙහි පුංලිඞ්ග නපුංසකලිඞ්ග දෙක්හි විභක්තිරූප පමණක් දක්වනු ලැබෙත්. සත්‍රීලිඞ්ග විභක්තිරූප ආකාරාන්ත ගණයෙහි දක්වන්නෙමු. "එක' යන සර්වනාමය (එක් යන) සඞ්ඛ්‍යා, අසමාන, අන්‍ය, අසහාය යන මේ අර්ථයන්හි වේ. විභක්තිරූපාදිය "සබ්බ" ශබ්දයේ මෙනි. සඞ්ඛ්‍යාර්ථ තන්හි එකවචනයි.

මෙහි දක්වන විශෙෂ විභක්තිරූප හැර සෙසුරූප අකාරාන්තපුංලිඞ්ග "බුඩ" ශබ්දයේ මෙන් ද, නපුංසකලිඞ්ග "චිත්ත" ශබ්දයේ මෙන් ද දතයුතුයි.

පුංලිඞ්ග පඨමා බහුවචනයෙහි වූ "බුඩා" යන අකාරාන්ත රූපය සර්වනාමයන් විෂයෙහි "සබ්බෙ"යි එකාරාන්ත වේ. නපුංසක ලිඞ්ගයෙහි "චිත්ත" ශබ්දයෙහි මෙන් "සබ්බානි" යනු වේ. චතුත්ථි එකවචනයෙහි "බුඩාය"යි සිඞරූපය ද, පචමියෙහි "බුඩා"යි සිඞ ආකාරාන්ත රූපය ද, සත්තමියෙහි "බුඩෙ" යි සිඞ එකාරාන්ත රූපය ද සර්වනාම විෂයෙහි නොයෙදෙත්. චතුත්ථි ඡට්ඨි බහුවචනයන්හි "සබ්බෙසං-සබ්බෙසානං" යනාදි වශයෙනි.

"ත" ශබ්දයාගේ පඨමා එකවචනයෙහි "සො" යනු ද "එත" ශබ්දයෙහි 'එසො" යනු ද වේ.

සෙසු විභක්තීන්හි "ත" ශබ්දයට විකල්පයෙන් "න" ආදෙශ වීමෙන් "තෙ-නෙ, තං නං" යන ආදි වශයෙන්

සිඩයි. තවද "ත" ශබ්දයාගේ චතුත්‍ථි ඡට්ඨි එක වචනයන්හි "අස්ස" යන රූපය ද, සත්‍තමි පචමි එකවචන දෙක්හි "අස්ම, අස්මිං" යන දෙක ද වේ·

"කිං" ශබ්දය තිලිඞ්ගිතානනතවුවත් විභත්තිරූප සිඩ්යේදී "කිං" යන්නට "ක" ආදෙශ වීමෙන් "සබ්බ" ශබ්ද විභත්ති රූප මෙන් සිඩයි. විශෙෂ වශයෙන් චතුත්‍ථි ඡට්ඨි එකවචන දෙක්හි "කිස්ස" යන රූපය ද, සත්‍තමි එකවචනයෙහි "කිමහි-කිස්මිං" යන රූප දෙක ද වේ.

---

16 පාඩම.

## විශෙෂණ විශෙෂ්‍ය විධිය.

## 18. වෙසෙසන පදය විශෙෂණ හා ඒ ලැබූ පදය විශෙෂ්‍යයි.

වාක්‍ය විෂයෙහි ඒ ඒ තන්හි පදකිපයකින් එක්පදයක් ප්‍රධාන පදවශයෙන් ද ඒ පිරිවර කොට සිටින සෙසු පද අප්‍රධාන පද වශයෙන් ද සැලකිය යුතුයි. ඒ අප්‍රධාන පද යෙදෙන්නේ ප්‍රධාන පදයේ වෙනසක් ඇඟවීම පිණිසයි. එබැවින් ඒ වෙනස කිරීමට ඉවහල් වශයෙන් යෙදෙන ඒ අප්‍රධාන පදය විශෙෂණ නම් ද, ඒ වෙනස ලබන ප්‍රධාන පදය විශෙෂ්‍ය නම් ද වේ. විශෙෂණය වනාහි නාමවිශෙෂණ ක්‍රියාවිශෙෂණ වශයෙන් දෙපරිදි වේ.

## 19. නාමය වෙසෙසනුයේ නාම විශෙෂණයි.

වාක්‍ය විෂයෙහිවූ යම්කිසි නාම පදයක් වෙසෙසීමට ඉවහල්වූ පදය නාමවිශෙෂණ නම් වේ. විශෙෂණ පදය තුල්‍යාධිකරණ භින්නාධිකරණ යයි දෙපරිදි වේ. එහි විශෙෂණ පදයෙන් කියවෙන ගුණය විශෙෂ්‍යපදයෙහි පිහිටා

තිබේ නම් ඒ විශෙෂණය තුල්‍යාධිකරණ යයි ද එසේ නැත් නම් භින්නාධිකරණ යයි ද දතයුතුයි. "පුප්ඵං භවති" (මලක් වේ) කීකල්හි මලෙහි වෙනසක් නොහැඟේ. "නීලං පුප්ඵං භවති" (නිල් මලක් වේ) කී කල්හි මලෙහි ඇති වෙනසක් හැඟේ. ඒ වෙනස කීමට ඉවහල් වූයේ "නීලං" යන පදයයි එබැවින් ඒ විශෙෂණයි. ඒ පදයෙන් කී ගුණය "පුප්ඵං" යන විශෙෂ්‍ය පදයේ පිහිටි බැවින් ඒ විශෙෂණය තුල්‍යාධිකරණයි.

විශෙෂ්‍යපදයෙහි ලිඞ්ග විභක්ති වචන තුල්‍යාධිකරණ විශෙෂණයෙහි බොහෝ සේ යෙදෙත් යයි වෛයාකරණයෝ කියත්. ඒ තුණෙන් විභක්තිය යෙදීම නියම වශයෙන් වේ. ලිඞ්ගය හා වචනය භින්නව ද යෙදේ. යම් විශෙෂණ පදයක් ලිඞ්ගත්‍රයට හා වචනද්වයට සාධාරණ වේ නම් එබඳු විශෙෂණ පමණක් ලිඞ්ගවචනයන්හි ද සමව යෙදෙත්. මෙහි කී "නීල" ශබ්දය එසේ සම බැවින් "පුප්ඵං" යන පදයේ නපුංසක ලිඞ්ගයේ හා එකවචනය ද "නීල" ශබ්දයෙහි යෙදීමෙන් "නීලං" යි විය. "වීසති චිත්තානි භවන්ති" (විසි සිත් වෙත්) යන මෙහි "චිත්තානි" යනු විශෙෂ්‍යයි. "වීසති" යනු විශෙෂණයි. "චිත්ත" යන්නෙහි ඒ වීසති සඞ්ඛ්‍යාව ඇති බැවින් තුල්‍යාධිකරණයි. එහෙත් "වීසති" ශබ්දය නියත ස්ත්‍රීලිඞ්ග හා එකවචන බැවින් විශෙෂ්‍ය පදයවූ "චිත්තානි" යන පදයෙහි නපුංසක ලිඞ්ගය හා බහු වචනය එහි නොයෙදුනේයි.

සර්වනාම ශබ්ද සියලු තන්හි ම විශෙෂණභාවයෙන් යෙදෙත්. ඔවුහු ලිඞ්ගත්‍රයට හා වචනද්වයට සාධාරණ බැවින් ලිඞ්ගාදියෙන් විශෙෂ්‍යයට සමානව යෙදෙත්.

**පුංලිඞ්ග**-සබ්බො පුරිසො (සියලු පුරිස්තෙමේ)
**ඉත්ථිලිඞ්ග** සබ්බා කඤ්ඤා සියලු කන්‍යා තොමෝ)
**නපුං-ලිඞ්ග**-සබ්බං චිත්තං (සියලු සිත)
**බහුවචන**-සබ්බෙ පුරිසා (සියලු පුරුෂයෝ තුමූ)

වාක්‍යයන්හි සර්වනාමපද විශෙෂ්‍යපද රහිතව හුදකලා වද යෙදෙත්. එහෙත් ඔවුන්ගෙන් විශෙෂ්‍ය පදයක් ගම්‍ය මාන වේ. ඒ මෙසේයි:-

උපාසකා අජ්ජ විහාරං ආගච්ඡන්ති (උවසුවෝ අද විහාරයට එත්)

**තෙ** සබ්බෙ දන්තානි දදෙය්‍යුං වෙ (ඒ සියල්ලෝ දන්දෙත් නම්)

**තානි** සග්ගමොක්ඛාය වත්තෙය්‍යුං (ඒ දන් සගමොක් පිණිස පවත්නාහ)

මෙහි "තෙ සබ්බෙ" යන සර්වනාම පද දෙක විශෙෂ්‍ය රහිතව යෙදී තිබේ. එහෙත් ඒ දෙක පූර්වවාක්‍යයෙහි 'උපාසකා" යන පදය අපෙක්ෂා කෙරෙත්. එහෙයින් ඒ දෙක "උපාසකා" යන්නෙහි තුල්‍යාධිකරණ විශෙෂණයි. එසේම "තානි' යන පදය "දන්තානි" යන පදය අපෙක්ෂා කෙරේ.

17 පාඩම.

## විශෙෂ සර්වනාම.

| පාලි | අර්ථ | පාලි | අර්ථ |
|---|---|---|---|
| පුබ්බ | පෙරකාල ආදිය | දක්ඛිණ | දකුණුදික් ආදිය |
| පර | අන් කාල ආදිය | උත්තර | උතුරුදික් ආදිය |
| අපර | අවර දික් ආදිය | අධර | යට දික් ආදිය |

මේ ශබ්දයන්ගේ පඨමා බහුවචනයෙහි "පුබ්බෙ, පුබ්බා" යනාදි වශයෙන් රූප දෙක දෙක වීමද, පුංනපුංසක ලිඞ්ග වයෙහි ම පචමී එකවචනයෙහි "පුබ්බා" යනාදි වශයෙන් රූපයක් හා සත්තමී එකවචනයෙහි ' පුබ්බෙ" යනාදි වශයෙන් රූපයක් වීමද "සබ්බ" ශබ්දාදීන්ට වැඩි වෙනසි.

### ("මේ" අර්ථ) "ඉම" ශබ්ද රූප.

| | එක | බහු |
|---|---|---|
| **ප**- | අයං | ඉමෙ |
| **දු**- | ඉමං | ,, |
| **ත**- | අනෙන, ඉමිනා | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |
| **ච** | අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| **ප**- | අස්මා, ඉමම්හා, ඉමස්මා | එහි, එභි, ඉමෙහි, ඉමෙභි |
| **ඡ**- | අස්ස, ඉමස්ස | එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං |
| **ස**- | අස්මිං, ඉමම්හි, ඉමස්මිං | එසු, ඉමෙසු |

"අර, අසවල්" යන අර්ථයත්හිවූ "අමු" ශබ්දය උකාරාන්ත වුවත් සර්වනාම බැවින් මෙහි දක්වනු ලැබේ.

| | |
|---|---|
| ප–අසු | අමූ |
| දු–අමුං | " |
| ත–අමුනා | අමූහි, අමූභි |
| ච–අමුස්ස, අදුස්ස | අමූසං, අමූසානං |
| ප–අමුම්හා, අමුස්මා | අමූහි, අමූභි |
| ඡ–අමුස්ස, අදුස්ස | අමූසං, අමූසානං |
| ස–අමුම්හි, අමුස්මිං | අමූසු |

සියලු සර්වනාමයන් කෙරෙන් කයන්තක් වීමෙන් "සබ්බකො" යනාදි වශයෙන් වියහැකි වේ. ඒ කයන්ත "අමු" ශබ්දයෙන් පරව වැඩිවසයෙන් වන බැව් පෙණේ. "අසුකො-අමුකො යනාදි වශයෙනි. "බුද්ධ" ශබ්ද රූපමෙනි. මේ "ඉම, අමු" ශබ්දවය ද ආලපනයෙහි නොයෙදේ.

නපුංසකලිඞ්ග "ඉම" ශබ්ද ප්‍රථමා විතියා එකවචනයන්හි "ඉදං ඉමං" යනුද බහුවචනයන්හි "ඉමානි" යනුද "අමු" ශබ්ද ප්‍රථමා එකවචනයෙහි "අදුං" යනුද විතියා එකවචන යෙහි "අදුං-අමුං" යනුද දෙක්හිම බහුවචනයන්හි "අමූ-අමූනි" යනුද වේ. සෙසු රූප පුල්ලිඞ්ගයෙහි මෙනි.

## භින්නාධිකරණ විශෙෂණ.

පුබ්බෙ මනුස්සානං චරිතානි සොභනානි අහෙසුං
(පෙර මිනිසුන්ගේ සිරිත් යහපත් වූහ.)

තස්මා තෙසං සරීරානි ච සොභනානි අහෙසුං
(එහෙයින් ඔවුන්ගේ ශරීරද යහපත් වූහ.)

මෙහි "චරිතානි" යනු විශෙෂ්‍යයි. චරිතයෝ සර්වසාධාර ණයහ, එහෙත් මෙහි මිනිසුන්ගේ චරිත යයි වෙනස්කරණ ලද බැවින් ඊට ඉවහල්වූ "මනුස්සානං" යන්න විශෙෂණයි, චරිතත් මිනිසුනුත් එකක් නොවන බැවින් භින්නාධිකරණයි. "මනුස්සානං" යනු විශෙෂ්‍යයි. මනුෂ්‍යයෝ කාලත්‍රයට ද

සාධාරණයහ. එහෙත් මෙහි පෙර මිනිසුන්ගේ යයි වෙනස් කරණලද බැවින් ඊට ඉවහල්වූ "පුබ්බ" යන්න විශෙෂණයි. ඒ දෙක එකක් නොවන බැවින් භින්නාධිකරණයි. "සොභනානි" යනු "චරිතානි" යන්නෙහි තුල්‍යාධිකරණ විශෙෂණයි. සොභනත් චරිතත් දෙකම එකක් බැවිනි.

මේ පිළිවෙළින් දෙවන වාක්‍යයෙහි විශෙෂණ විශෙෂ්‍යභාවය කියයුතුයි. එහි "තෙසං" යන සර්වනාමපදය කුමක් අපෙක්ෂා කොට යොදන ලදූයි කියයුතුයි.

අර මිනිසුන්ගේ කිනම් සිරිත් අයහපත් වෙද්ද.
ඒ මේ සිරිත් කවුරුන්ගේ යහපත් ද?

මේ වාක්‍යවය පාළියට පෙරළා එහි විශෙෂණ විශෙෂ්‍ය පද දක්විය යුතුයි.

---

18 පාඩම.

## පරොක්ඛා විභත්තිය.

| විභත්තිප්‍රත්‍යය. | | ක්‍රියාපද. | |
|---|---|---|---|
| එක | බහු. | එක. | බහු. |
| ප-අ | උ | බභූව | බභූවු |
| ම-එ | ත්ථ | බභූවෙ | බභූවිත්ථ |
| උ-අ | ම්හ | බභූව | බභූවිම්හ |

## කාලාතිපත්ති විභත්තිය.

| විභත්තිප්‍රත්‍යය. | | ක්‍රියාරූප | |
|---|---|---|---|
| එක | බහු | එක | බහු |
| ප-ස්සා | ස්සංසු | අභවිස්සා, භවිස්සා | අභවිස්සංසු |
| ම-ස්සෙ | ස්සථ | අභවිස්සෙ, භවිස්සෙ | අභවිස්සථ |
| උ-ස්සං | ස්සම්හා | අභවිස්සං, භවිස්සං | අභවිස්සම්හා |

මෙහි පරොක්ඛා විභත්තිය ඉන්ද්‍රිය විෂය නුවූ අතීත ක්‍රියාවක් කීමෙහි (ඉක්මගිය ආරංචියක් කීමෙහි) යෙදේ.

"සො පුබ්බෙ සීලවා බභූව, (හෙතෙමේ පෙර සිල්වත් වීලු) යනාදි වශයෙනි. මෙහි උත්තම පුරිසය බොහෝසේ යෙදෙන්නේ තමා සිහියෙන් තොරව කළ කී දේ සිහි ඇති කාලයෙහි කියන කලය යි කියනලදි. 'සුපිනෙහං ගීයො රොදකො බභූව කිර" (රැයේ නිදද්දී මම හැඬුවෙම්ලු)" යනාදි වශයෙනි.

කාලාතිපත්ති විභත්තිය යෙදෙන්නේ විරුඬ දේ ලැබීමෙන් හෝ හේතු විකල වීමෙන් ක්‍රියාසිඬිය නුවූ බැව් ප්‍රකාශ කිරීම පිණිසයි. "සචෙ සො ගුණවා අභවිස්සා කිත්තිමා අභවිස්සා" (හෙතෙමේ ගුණවත්වී නම් කීර්ත්තිය ඇත්තෙක් විය) යනාදි වශයෙනි. මෙහි කීර්ත්තියට හෙතුවූ ගුණය නැතිවීමෙන් කීර්ත්තිමත් නුවූ බැව් සූචිතයි.

**ක්‍රියාවිශෙෂණය.**

---

## 20. ක්‍රියාර්ථය වෙසෙසන්නේ ක්‍රියා විශෙෂණයි.

යම් පදයකින් ක්‍රියාර්ථයෙක්හි වෙනසක් හැගේ නම් ඒ පදය ක්‍රියා විශෙෂණ නම් වේ. ඒ ක්‍රියා විශෙෂණය ද තුල්‍යාධිකරණ භින්නාධිකරණ වශයෙන් දෙපරිදි වේ. එහි තුල්‍යාධිකරණ ක්‍රියා විශෙෂණය නපුංසක ලිඞ්ග ද්විතීයා එක වචනයෙන්ද, භින්නාධිකරණ ක්‍රියා විශෙෂණය ලිඞ්ගත්‍රයේම තෘතීයා විභක්ත්‍යන්ත පදයකින් ද යෙදේ. බොහෝ තන්හි නිපාතපදයෝ ද ක්‍රියා විශෙෂණ වශයෙන් යෙදෙත්.

"දාරකො සෙති, දරුවා ශයනය කෙරේ) කී කල්හි ශයනක්‍රියාවෙහි වෙනසක් නොහැගේ. "දාරකො සුඛං සෙති" (දරුවා සැපවූ ශයනයක් කෙරේ හෙවත් සැපසේ ශයනය කෙරේ) කීකල්හි ශයන ක්‍රියාවෙහි වෙනසක් හැගේ, ඒ වෙනස හැගෙන්නේ 'සුඛං යන පදයෙනි. එබැවින් ඒ පදය ක්‍රියාවිශෙෂණයි. ඒ පදය නපුංසකලිඞ්ග ද්විතීයා

එකවචනය වූ බැවින් නපුංසකලිඞ්ගවිතීයා එකවචන වූ විශෙෂ්‍යපදයක් ද ඇතිවිය යුතුයි. ඒ සොයත්හොත් ඒ "සෙති" යන ක්‍රියාවේ අර්ථය සෙවිය යුතුයි. එහි අර්ථය නම් "සයනං කරොති" (ශයනය කෙරේ) යනුයි. මෙහි වූ "සයනං" යන පදය නපුංසකලිඞ්ග විතීයා එකවචනයි. එහෙයින් ඊට විශෙෂණවූ "සුඛං" යන්නද එසේයි. මේ තුල්‍යාධිකරණ ක්‍රියා විශෙෂණයි.

"දාරකො සුඛෙන සෙති" (දරුවා සුවයෙන් ශයනය කෙරේ) කීකල්හි "සුඛෙන" යනු භින්නාධිකරණ ක්‍රියා විශෙෂණයි. "දාරකො සුඛු සෙති, (දරුවා මනාකොට ශයනය කෙරේ) යන තන්හි "සුඛු" යන නිපාත පදය ක්‍රියා විශෙෂණයි.

පෙර ලක්දිව සිංහලයෝ හොඳට තුනුරුවන්
අදහන්නෝ වූවාහුලු.
උඹලත් එසේ වූවහු නම් සිරගෙට නොපැමිණෙනෝ වූවහු.

මේ වාක්‍යවය පාළියෙන් ලියනු.

| සිංහල | පාළි | සිංහල | පාළි |
|---|---|---|---|
| ලක්දිව් | ලඞ්කාදීප | අදහන | සද්දහන්ත |
| සිංහල | සීහල | එසේ | තථා |
| හොඳ | සුන්දර | සිරගේ | බන්ධනාගාර |
| තුනුරුවන් | රතනත්තය | පැමිණෙන | පාපුණන්ත |

19 පාඩම.

## "උභ, ති, ති, චතු" ශබ්දරූප.

මේ ශබ්ද සතර බහුවචන වෙත්. 'උභ, ති" ශබ්දවයේ විභක්තිරූප ලිඟු තුණටම සම වෙත්.

| "උභ" ශබ්දරූප | "ති" ශබ්දරූප |
|---|---|
| ප-උභො-උභෙ | දුවෙ-වෙ |
| ආ- " | " " |
| දු- " " | " " |
| ත උභොහි-උභොභි-උභෙහි-භි | විහි-වීභි |

| | |
|---|---|
| ච-උභින්නං | වින්නං-දුවින්නං |
| ප-උභොහි-උභොභි-උභෙහි-භි. | වීහි-වීභි |
| ෂ-උභින්නං | වින්නං-දුවින්නං |
| ස-උභොසු-උභෙසු | වීසු |

| පුල්ලිඞ්ග | ඉත්ථිලිඞ්ග | පුල්ලිඞ්ග | ඉත්ථිලිඞ්ග |
|---|---|---|---|
| ප-තයො | තිස්සො | චත්තාරො | චතස්සො |
| ආ- ,, | ,, | ,, ,, | ,, |
| දු- ,, | ,, | ,, ,, | ,, |
| ත-තීහි- තීභි | තීහි-තීභි | චතුහි, චතූහි චතුබ්භි | චතූහි, චතුහි චතුබ්භි |
| ච-තිණ්ණං තිණ්ණන්නං | තිස්සන්නං | චතුන්නං | චතස්සන්නං |
| ප-තීහි-තීභි | තීහි-තීභි | චතුහි-චතූහි චතුබ්භි | චතූහි, චතුහි චතුබ්භි |
| ෂ-තිණ්ණං තිණ්ණන්නං | තිස්සනනං | චතුන්නං | චතස්සතං |
| ස-තීසු | තීසු | චතූසු | චතූසු |

නපුංසකලිඞ්ගයෙහි පඨමා ආලපන දුතියාවන්හි 'තීණි" යන රූපයවේ. සෙසු රූප පුංලිඞ්ගයෙහි මෙනි.

### අනාගත ආඛ්‍යාත.

භවිස්සන්ති විභත්තිය.

| විභක්තිප්‍රත්‍යය | | ක්‍රියාරූප | |
|---|---|---|---|
| එක | බහු | එක | බහු |
| ප-ස්සති | ස්සන්ති | භවිස්සති | භවිස්සන්ති |
| ම-ස්සසි | ස්සථ | භවිස්සසි | භවිස්සථ |
| උ-ස්සාමි | ස්සාම | භවිස්සාමි | භවිස්සාම |

### ආදෙශ සන්ධි.

ස්වරාදෙශ.

පාළි සන්ධි විධියෙහි 'එ ඔ" යන ස්වර බොහෝසේ ආදෙශ වශයෙන් ලැබෙන වර්ණයෝයි.

## 21. අවර්ණයෙන් පර ඉවර්ණඋවර්ණයන්ට එඔ වීමෙන් සන්ධිවිධිවයෙකි.

ඇතැම් තන්හි පූර්ව සිටි අයන්ත හෝ ආයන්ත ලොප්වීමෙන් පරව සිටි "ඉඊ" දෙකට එයන්ත ද "උඌ" දෙකට ඔයන්ත ද වීමෙන් සන්ධිවිධිවයක් සිඩයි. "පුරිසස්ස= ඉව-පුරිසස්සෙව, ජින=ඊරිතං-ජිනෙරිතං, වන්ද=උදයො-වන්දොදයො, ගඞ්ගා=ඌමියො-ගඞ්ගොමියො" යනාදි වශයෙනි.

"අව" උපසර්ගය ව්‍යඤ්ජන වර්ණයකින් පූර්ව සිටියහොත් ඒ "අව" යන්නට ද සන්ධිවිධිවශයෙන් ඔකාරය වේ. "අව= කාසො-ඔකාසො" යනාදි වශයෙනි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|
| තිට්ඨති | ආගමිස්සති | ගමිස්සති | සල්ලපිස්සාමි |
| ය | ත | ත | අම්හ |
| තර | සෙව | පරසුවෙ | ත |
| අත්ත | ඉම | අත්ත | සද්ධිං |
| ඝර | ගාම | ඝර | මුහුත්ත |

මේ වාක්‍ය සතරක්යයි සැලකිය යුතුයි. මෙහි මුලින් තිබෙන ක්‍රියාපද සමග ඒ ඒ නාමයන් යෙදෙන පරිද්දෙන් විභක්ත්‍යන්ත කොට පේළි වශයෙන් සරසට ලියනු.

ඝර-ගේ, සෙව-සෙට, පරසුවෙ-අනිද්දා, සද්ධිං-සමග, මුහුත්ත-මොහොත. "සෙව, පරසුවෙ, සද්ධිං" යනු නිපාත පදයි

### 20 පාඩම.

### "තුම්හ" ශබ්දය.

| එක | බහු |
|---|---|
| ප-ත්වං, තුවං | තුම්හෙ-වො |
| දු-තං, තවං, තුවං, ත්වං | තුම්හාකං, තුම්හෙ වො |

ත-ත්වයා, තයා-තෙ තුම්හෙහි, තුම්හෙහි-වො
ච-තව, තුය්හං, තුම්හං-තෙ තුම්හං, තුම්හාකං වො
ප-ත්වයා, තයා තුම්හෙහි, තුම්හෙහි
ඡ-තව, තුය්හං, තුම්හං-තෙ තුම්හං, තුම්හාකං-වො
ස-ත්වයි, තයි තුම්හෙසු.

### "අම්හ" ශබ්දය.

ප-අහං මයං, අම්හෙ-නො
දු-මං, මමං අම්හාකං, අම්හෙ-නො
ත-මයා-මෙ අම්හෙහි, අම්හෙහි-නො
ච-මම, මය්හං, අම්හං, මමං-මෙ අම්හාකං, අම්හං, අස්මාකං-නො
ප-මයා අම්හෙහි, අම්හෙහි
ඡ-මම, මය්හං, අම්හං, මමං-මෙ අම්හාකං, අම්හං, අස්මාකං-නො
ස-මයි අම්හෙසු

මේ සර්වනාමවය අලිඞ්ග සර්වනාම යයි කියති. එසේ කියන්නේ වාග්ව්‍යවහාරයේදී මොවුන්ගේ ලිඞ්ග විශෙෂයක් නැති හෙයිනි. මේ "ත්වං, අහං" ආදි විභක්තිරූප ලිඞ්ගත්‍රයටම සමාන වෙත්.

තවද මේ ශබ්ද දෙකෙන් සිඞ "වො නො තෙ මෙ" යන විභක්තිරූප වෙන පදයකින් පරව මුත් වාක්‍යයක හෝ ගාථා පදයක මුල නොයෙදෙත්. එසේම "ච, ඉව, එව" යන නිපාත යන්ගේ ආදියෙහි ද නොයෙදෙත්.

### අනාගත ආඛ්‍යාත.

පූර්වොක්ත "භූ" ආදි ධාතුවලින් "භූ" ධාතුවේ පමණක් අනාගත කාලික පරස්සපද ක්‍රියාරූප දක්වන ලද්දුහ. "භූ" ආදි ධාතුන්ගේ ක්‍රියාරූප දැනගැණීම ද සප්‍රයෝජන වේ. එහෙත් මෙහි දක්වනු ලබන්නේ "ස්සති" ආදි විභක්ති ප්‍රත්‍යය යෙදීමෙන් පෙර සිටින ධාතුවිකෘති පමණෙකි. ඔවුන් කෙරෙන් "ස්සති-ස්සන්ති" ආදිය යොදා ක්‍රියාරූප

යොදාගත යුතුයි. මෙසේ දූත ගැණීමෙන් මෙහි නොදක් වන ධාතුන්ගේ ක්‍රියාරූප යොදා ගැණීමට ද පුරුද්දක් ඇති වේ.

| ධාතු | ධා: විකෘති | ධාතු | ධා: විකෘති | ධාතු | ධා: විකෘති |
|---|---|---|---|---|---|
| හූ | හෙහි | පත | පති | ඉසු | ඉච්ඡි-එසි |
| ඨා | ඨ | මර | මරි-මීයි | ලභ | ලභි |
| සද | සිදි | ජර | ජීරි-ජීයි | බාද | බාදි |
| සි | සයි-සෙ | දිස | පස්සි-දක්ඛි | පා | පිවි |
| වස | වසි | ගම | ගමි-ගච්ඡි | දා | දදි-දජ්ජි |

"හූ" ධාතුවෙන් "හෙහිති හෙහිනති, හොහිති හොහිනති" යන ආදි වශයෙන් ද "පති, උප" ආදි උපසර්ග පූර්ව කොට ඇති "ඨා" ධාතුවෙන් "පතිඨිස්සති-පතිඨහිස්සති, උපඨිස්සති-උපඨහිස්සති" යන ආදි වශයෙන් ද, "දිස" ධාතුවෙන් "දක්ඛිති" යන ආදි වශයෙන් ද "ලභ" ධාතුවෙන් "ලච්ඡති" යන ආදි වශයෙන් ද අනාගත ක්‍රියාරූප සිඩයි.

### "වො, නො, තෙ, මෙ" පද යුක්ත වාක්‍ය.

ප: බ:-ගාමං වො ගච්ඡෙය්‍යාථ-(තෙපි ගමට යව්)
,, ගාමං නො ගච්ඡෙය්‍යාම-(අපි ගමට යන්නෙමු)
දු: බ:-පහාය වො ගමිස්සාමි-(තොප හැර යන්නෙමි)
,, පහාය නො අගමිත්ථ-(අප හැර ගියහුය)
තු: එ:-කතං තෙ තං කම්මං-(තා විසින් ඒ කර්මය කරණලදී)
,, කතං මෙ තං කම්මං-(මා විසින් ඒ කර්මය කරණලදී)
තු: බ:-භුත්තං වො භොජනං-(තොප විසින් බොජුන් බුදිනලදී)
,, භුත්තං නො භොජනං-(අප විසින් බොජුන් බුදිනලදී)
ච: එ:-දින්නං තෙ තං-(උඹට ඒ දෙනලදී)
,, දින්නං මෙ තං-(මට ඒ දෙනලදී)
ච: බ:-ධාරෙම වො ජිත්තානි-(තොපට සත් දරමු)
,, ධාරෙථ නො ජිත්තානි-(අපට සත් දරව්)

ෂ: එ:-ඉදං තෙ රට්ඨං-(මේ තුබේ රටයි)
,, ඉදං මෙ රට්ඨං-(මේ මාගේ රටයි)
ෂ: බ:-සුන්දරං වො කම්මං-(තොපගේ කර්මය සොඳුරුයි)
,, ඉමානි නො කම්මානි-(මේ අපගේ කර්මයි)

මෙහි "වො ගාමං ගවෙසෙය්‍යාථ" යන ආදි වශයෙන් "වො" ආදිය පූර්වපදව හෝ "ගාමං වො ච ගවෙසෙය්‍යාථ" යන ආදි වශයෙන් "වො" ආදිය "ච" ආදි නිපාතයන්ගේ ආදියෙහි හෝ නොයෙදේ. එසේ කියත් හොත් "වො" යන්න වෙනුවට "තුම්හෙ" යන්න යොදා "තුම්හෙ ගාමං ගවෙසෙය්‍යාථ, ගාමං තුම්හෙ ච ගවෙසෙය්‍යාථ" කියා යෙදියයුතුයි. සෙසු තන්හි ද මෙසේ බැව් දතයුතුයි.

උඹලා තමන්ගේ ගේවල සිටපල්ලා.
මම උඹලාටත් හෙට වැටුප් දෙන්නෙමි.
තුබේ පියා අනිද්දා කොහි යන්නේද?
මට උඹ දෙන්නෙහි නම් උඹටත් මම දෙන්නෙමි.

මේ වාක්‍යයෝ පාළියට පෙරළිය යුතුයි.

ගේ-ඝර. වැටුප්-වට්ට. පිය-ජනක.

## 21 පාඩම.

### අත්තනොපද ආඛ්‍යාත.

#### වත්තමානා

**විභත්තිප්‍රත්‍යයා.** **ක්‍රියාරූප.**

| | එක | බහු | එක | බහු |
|---|---|---|---|---|
| ප | තෙ | අන්තෙ | භවතෙ | භවන්තෙ |
| ම | සෙ | ව්හෙ | භවසෙ | භවව්හෙ |
| උ | එ | ම්හෙ | භවෙ | භවාම්හෙ |

#### පඤ්චමී.

| | එක | බහු | එක | බහු |
|---|---|---|---|---|
| ප | තං | අන්තං | භවතං | භවන්තං |
| ම | ස්සු | ව්හො | භවස්සු | භවව්හො |
| උ | එ | ආමසෙ | භවෙ | භවාමසෙ |

**සත්තමී.**

| | | | |
|---|---|---|---|
| ප–එථ | එරං | භවෙථ | භවෙරං |
| ම–එථො | එය්‍යවෙහො | භවෙථො | භවෙය්‍යවෙහො |
| උ–එය්‍යං | එය්‍යාමෙහ | භවෙය්‍යං | භවෙය්‍යාමෙහ |

**හීයත්තනි.**

| | | | |
|---|---|---|---|
| ප–ත්ථ | ත්ථුං | අභවත්ථ | අභවත්ථුං |
| ම–සෙ | ව්හං | අභවසෙ | අභවව්හං |
| උ–ඉං | ම්හසෙ | අභවිං | අභවාම්හසෙ |

පාළි භාෂාවෙහි පරස්සපද ක්‍රියාරූප මෙන් අත්තනො පද ක්‍රියාරූපයෝ ද වාක්‍ය විෂයෙහි අවිශෙෂයෙන්, යෙදෙත්. අර්ථවශයෙන් ද සමාන වේ. (එහෙත් "පරස්සපද, අත්තනොපද" යන නාමවය අන්වර්ථයයි ද, එහෙයින් යම් ක්‍රියාවක ඵලය තමා කරු (ක්‍රියාව කරන්නහු කරු) පැමිණෙන සුලු නම් එහි අත්තනොපද ක්‍රියාව යෙදේ යයි ද, ඒ ඵලය අන්‍යයෙකු කරු යන සුලු නම් පරස්සපද ක්‍රියාව යෙදේ යයි ද කියත්.) මෙසේ සෙසු ධාතුකෙරෙන් ද මේ ආත්මනෙපද ප්‍රත්‍යයන් යෙදීමෙන් ක්‍රියාරූප සිඩයි. භාෂානුසාරයෙන් දතයුතුයි.

**ආකාරාන්තනාම.**

ආකාරාන්ත පුංලිඞ්ග වූ හෝ නපුංසකලිඞ්ග වූ නාම ප්‍රකෘති පාළිභාෂාවෙහි ඉතා විරල වෙත්. ආකාරාන්ත නාමයෝ බොහෝ සෙයින් ස්ත්‍රීලිඞ්ග වූවෝ වෙත්. එබැවින් මෙහි පළමු කොට ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාමයෝ දක්වනු ලැබෙත්.

| පාළි | අර්ථ | පාළි | අර්ථ | පාළි | අර්ථ |
|---|---|---|---|---|---|
| විජ්ජා | විද්‍යා | ලඞ්කා | ලක් | සෙනා | සෙන් |
| පඤ්ඤා | ප්‍රඥා | පාඨශාලා | පාසැල් | ගඞ්ගා | ගං |
| සද්ධා | ශ්‍රද්ධා | මඞ්ගලසිලා | මඟුල්ගල් | සමා | අවුරුදු |
| තණ්හා | තෘෂ්ණා | විජ්ජුල්ලතා | විදුලි | සීමා | ඉම් |
| වචා | වාක් | වස්සධාරා | වැසිධාරා | වෙලා | කල් |

## "විජ්ජා" නාමය.

| අනෙනාවචාරණය. | | විභක්තිරූප. | |
|---|---|---|---|
| එක | බහු | එක | බහු |
| ප-ආ | ආ, ආයො | විජ්ජා | විජ්ජා, විජ්ජායො |
| ආ-එ | " " | විජ්ජෙ | " " |
| දු-අං | " " | විජ්ජං | " " |
| තා-ආය | ආහි, ආභි | විජ්ජාය | විජ්ජාහි, විජ්ජාභි |
| ච-ආය | ආනං | විජ්ජාය | විජ්ජානං |
| ප-ආය | ආහි, ආභි | විජ්ජාය | විජ්ජාහි, විජ්ජාභි |
| ඡ-ආය | ආනං | විජ්ජාය | විජ්ජානං |
| ස-ආයං ආය | ආසු | විජ්ජායං | විජ්ජාය, විජ්ජාසු |

"මාතෘ (මවු) වාචක වූ "අම්මා, අම්බා, අත්තා" ශබ්ද යන්ගේ ආලපන එකවචනයෙහි "අම්ම-අම්මා, අම්බ-අම්බා, අත්තා"යනු වේ. සඞ්ඛ්‍යා නාම හැර සෙසු ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාම යන්ගේ විභක්තිරූප "විජ්ජා" ශබ්දයේ මෙන් දතයුතුයි.

දැන් ලඞ්කාවේ ගම්වල පාසැල් මද වෙත්.
එහෙයින් විද්‍යාවෙන් හීන වූ මිනිස්සු ඉතා බහුල වෙත්.
එසේ නුමුත් අවුරුද්දකින් පසු පාසැල් බහුල වන්නාහ.
මැතියනි! තමුන්නාන්සේ ශ්‍රද්ධාවෙන් උතුම් වන්නෙහි.

මේ වාක්‍ය සතර පාළියෙන් ලිය යුතුයි.

මද-මන්ද, එහෙයින්-තතො, හීන-හීන, ඉතා බහුල-අති බහුල, එසේ නුමුත්-තථාපි, පසු-පච්ඡා, උතුම්-උත්තම.

## 22 පාඩම.

### අත්තනොපද ආඛ්‍යාත.

#### අජ්ජතනී.

| විභක්තිය. | | ක්‍රියාපද. | |
|---|---|---|---|
| එක | බහු | එක | බහු |
| ප-ආ | ඌ | අභවා-භවා | අභවූ |
| ම-සෙ | වහං | අභවිසෙ | අභවිවහං |
| උ-අ | මෙහ | අභව | අභවිමෙහ |

#### පරොක්ඛා.

| | | | |
|---|---|---|---|
| ප-ත්ථ | රෙ | බභූවිත්ථ | බභූවිරෙ |
| ම-ත්ථො | ව්හො | බභූවිත්ථො | බභූවිව්හො |
| උ-ඉ | ම්හෙ | බභූවි | බභූවිම්හෙ |

#### භවිස්සන්ති.

| | | | |
|---|---|---|---|
| ප-ස්සතෙ | ස්සන්තෙ | භවිස්සතෙ | භවිස්සන්තෙ |
| ම-ස්සසෙ | ස්සව්හෙ | භවිස්සසෙ | භවිස්සව්හෙ |
| උ-ස්සං | ස්සාම්හෙ | භවිස්සං | භවිස්සාම්හෙ |

#### කාලාතිපත්ති.

| | | | |
|---|---|---|---|
| ප-ස්සථ | ස්සිංසු | අභවිස්සථ | අභිවිස්සිංසු |
| ම-ස්සසෙ | ස්සව්හෙ | අභවිස්සසෙ | අභවිස්සව්හෙ |
| උ-ස්සං | ස්සාම්හෙ | අභවිස්සං | අභිවිස්සාම්හෙ |

## යකාර වකාරාදෙශසන්ධි.

---

**22. ඉවර්ණයට හෝ එකාරයට යකාරය හා උවර්ණයට හෝ ඔකාරයට වකාරය වීමෙන් සන්ධිවිධියක් සිඩයි.**

ඉවර්ණය හැර අන්‍යවූ ස්වරයකින් පූර්ව සිටි ඉවර්ණයට හා අකාරයෙන් පූර්වයෙහි පදාන්තව සිටි එකාරයට යකාරය වීමෙන් එක් සන්ධිවිධියක් ද, එසේම පදාන්තව සිටි උවර්ණයට හෝ ඔකාරයට වකාරය වීමෙන් එක් සන්ධිවිධියක් ද සිඩයි. එකාරයට යකාරය වීම "තෙ, මෙ, යෙ" යන මේ පදයන්ගේ එකාරයට යයි ද, උකාරයට හා ඔකාරයට වකාරය වීම "නු, දු, ථු, හු, කො, බො, යො, සො, තො" යන මොවුන් පිළිබඳ උකාර ඔකාරයන්ට යයි ද කියනු ලැබේ.

**ඉකාරයට යකාරය**—වි=ආකරණං-ව්‍යාකරණං
**ඊකාරයට ,, ,,** —සාමී=ආදයො-සාම්‍යාදයො.
**එකාරයට ,, ,,** —තෙ=අජ්ජ-ත්‍යජ්ජ.
**,, ,, ,, ,,** —මෙ=අයං-ම්‍යායං.
**උකාරයට වකාරය**—අනු=ආගතො-අන්වාගතො.
**ඔකාරයට ,, ,,** —යාවතකො=අස්ස-යාවතක්වස්ස.

තවද "ති" යන්නේ ඉකාරයට යකාරය වූ තන්හි සිඩ "ත්‍ය" යන තකාර යකාර සංයොගයට "ච්ච" යන්න ද, "දි" යන්නේ ඉකාරයට යකාරය වූ තන්හි "ද්‍ය" යන දකාර යකාර සංයොගයට "ජ්ජ" යන්න ද වේ. "ඉති=ආදයො ඉච්චාදයො, යදි=එවං-යජ්ජෙවං" යන ආදි වශයෙනි.

23 පාඩම.

## කම්මකාරක ආඛ්‍යාත.

යම්කිසි ආඛ්‍යාත පදයක් කර්මය අපේක්ෂා කොට නිපන්නේ නම් ඒ ආඛ්‍යාතපදය කම්මකාරක නම් වේ. ඔවුහු සකර්මක ධාතුවලින් සිද්ධයි. ඔවුන්ගේ සිද්ධියේදී ධාතුවට හා "ති" ආදි විභක්තිප්‍රත්‍යයන්ට අතර "ය" යන ප්‍රත්‍යය යෙදේ. ඇතැම් තන්හි ඒ ය යන්න ප්‍රකෘතියෙන් සිටී මෙන් ද, ඇතැම් තන්හි ධාත්වන්තය සහිත ය යන්න ආදේශාදියෙන් විකාර වීමෙන් ද පදසිද්ධිය වේ, යකාරය ප්‍රකෘතියෙන් සිටි බොහෝ තන්හි ධාත්වන්තයෙහි ඊකාරය වේ. මෙහි ඒ කර්මකාරක ආඛ්‍යාතයන්ගේ තත්ත්වය ඇඟවීමට පමණක් ස්වල්පයක් දක්වනු ලැබේ. එහිදු කාලත්‍රය හා විධිනිමන්ත්‍රණාදි අර්ථයන් පැවසීමට විභක්ති පසෙක්හි ක්‍රියා රූපයන්ගේ තත්ත්වය දක්වනු ලැබේ.

### කම්මකාරකයෙහි සිද්ධ ධාතු විකෘති.

### වත්තමානා, පඤ්චමී, සත්තමී, හීයත්තනී, භවිස්සන්ති.

| | | | | | |
|---|---|---|---|---|---|
| දිස | දිස්ස | — | — | අපස්සිය | |
| | පස්සිය | — | — | අදිස්ස | දක්ඛියි |
| | දක්ඛිය | — | — | අදක්ඛිය | පස්සීයි |
| ගම | ගච්ඡිය | — | — | අගච්ඡිය | ගච්ඡීයි |
| | ගම්ම | — | — | අගමීය | ගමීයි |
| | ගමීය | — | — | අගම්ම | |
| ඉසු | ඉච්ඡිය | — | — | — | ඉච්ඡියි |
| | එසීය | — | — | — | එසීයි |
| | ඉස්ස | — | — | — | |
| ලභ | ලබ්භ | — | — | අලබ්භ | ලභීයි |
| ඛාද | ඛජ්ජ-ඛාදීය | — | — | අඛජ්ජ-අඛාදීය | ඛාදීයි |
| පා | පීය | — | — | අපීය | පීයි |
| දා | දීය | — | — | අදීය | දීයි |

මේ ධාතු විකෘති කෙරෙන් "ති" ආදිය යොදා 'දිස්සති, දිස්සතෙ" යන ආදි වශයෙන් ක්‍රියාරූප යොදා ගතයුතුයි.

කත්තෘකාරක-චක්ඛුමන්තො රූපෙ පස්සන්ති. (ඇස් ඇත්තෝ රූපයන් දකිත්.)

කම්මකාරක- චක්ඛුමන්තෙහි රූපා දිස්සන්ති. (ඇස් ඇත්ත වුන් විසින් රූපයෝ දකිනු ලැබෙත්.)

කත්තෘකාරක-සද්ධාය පුඤ්ඤානි කරොන්තා සග්ගං ඉච්ඡන්තු. (ශ්‍රද්ධාවෙන් පින්කරන්තෝ ස්වර්ගය කැමැති වෙත්වා.)

කම්මකාරක - සද්ධාය පුඤ්ඤානි කරොන්තෙහි සග්ගො ඉච්ඡීයතු. (ශ්‍රද්ධාවෙන් පින්කරන්තවුන් විසින් ස්වර්ගය කැමතිවනු ලැබේවා.)

කත්තෘකාරක-අහං සෙව තස්ස තං වරං දස්සාමි. (මම හෙට ඔහුට ඒ වරය දෙන්නෙමි.)

කම්මකාරක - මයා සෙව තස්ස සො වරො දීයිස්සති.(මා විසින් හෙට ඔහුට ඒ වරය දෙනුලබන්නේය.)

කත්තෘකාරක-සො පුරිසො මං පස්සති. (ඒ පුරුෂ තෙමේ මා දකී.

කම්මකාරක - තෙන පුරිසෙන අහං පස්සියිස්සාමි. (ඒ පුරුෂයා විසින් මම දකිනු ලබන්නෙමි.)

| 1 | 2 | 3 |
|---|---|---|
| බාද-බජ්ජ | ඉච්ඡ-ඉච්ඡීය | පස්සි-දක්ඛීය |
| සබ්බ | අම්හ | ත |
| එව | තුම්හ | අම්හ |
| සුතබ | කාළං | සෙස |
| උපාහනා | භො | දිවා |

මේ වාක්‍ය පඞ්ක්ති තුනෙහි මුලින් තිබෙන "බාද-බජ්ජ" ආදි ධාතුවිකෘති සයෙන් ක්‍රියාපදයන් සිද්ධකොට ඒ යට තිබෙන අවිභක්තික නාමයන් ඒ ක්‍රියාපදයන්ට යොග්‍ය පරිද්දෙන් විභක්ත්‍යන්ත කොට වාක්‍ය සයක් ගැළපිය යුතුයි.

සුනඛ - (බලු) උපාහනා - (වහන්) කථං - (කෙසේ) භො - (පින්වත්නි) දිවා -- (දවල්)

24 පාඩම.

## අකර්මක ධාතූන්ගේ සකර්මකත්වය හා සකර්මක ධාතූන්ගේ විකර්මකත්වය.

අකර්මකධාතු ඇතැම් උපසර්ගයන් පූර්ව වීමෙන් හෝ ප්‍රයොජ්‍ය ප්‍රත්‍යය යුක්තවීමෙන් සකර්මක වෙත්. ප්‍රයොජ්‍ය ප්‍රත්‍යය යුක්තවීමෙන් සකර්මකධාතු විකර්මක වෙත්. (විකර්මක ධාතු ත්‍රිකර්මක වෙත්.) මෙසේ වීමට හෙතුව නම් උපසර්ගයන් පූර්ව වීමෙන් ධාතුවේ ප්‍රකටව තුබුනු අර්ථය වෙනස් වීමයි.

අකර්මක වූ "භූ" ධාතුව මෙසේ උපසර්ගයොගාදියෙන් සකර්මක වූ පරිදි මෙහි දක්වනු ලැබේ. ඒ අනුසාරයෙන් සෙස්ස ද දතයුතුයි.

**උපසර්ග** **සකර්මක වාක්‍ය**

**අනු**–පඤ්ඤවා සුඛමනුභවති. (පැණැත්තේ සුව අනුභව කෙරේ.)

**පරා**–බලවා රිපුං පරාභවති. (බලැත්තේ සතුරු පරදවයි.)

**අභි**–විජ්ජා මොහං අභිභවති. (විද්‍යා තොමෝ මොහය යට කෙරේ.)

**පරි**–අසාධු සාධුං පරිභවති. (අසත්පුරුෂයා සත් පුරුෂයාට අවමන් කෙරේ.)

මේ ක්‍රියාවෝ කර්මකාරකයෙහි ද යෙදෙත්. ඒ මෙසේයි.

පඤ්ඤවතා සුඛමනුභූයතෙ. (පැණැත්තහු විසින් සුව අනුභව කරණු ලැබේ.)

බලවතා රිපු පරාභූයතෙ. (බලවත්හු විසින් සතුරු පරදවනු ලැබේ.)

විජ්ජාය මොහො අභිභූයතෙ. (විද්‍යාව විසින් මොහය යට කරණු ලැබේ.)

අසාධූනං සාධු පරිභූයතෙ. (අසත්පුරුෂයා විසින් සත්පුරුෂ තෙමේ අවමන් කරණු ලැබේ.)

### ප්‍රයොජ්‍යප්‍රත්‍යය.

"ණෙ, ණය, ණාපෙ, ණාපය" යන මේ ප්‍රත්‍යය සතර ප්‍රයොජ්‍යප්‍රත්‍යය යි. මොවුහු කාරිතප්‍රත්‍ය යයි ද කියනු ලැබෙත්. පදසිද්ධිවිෂයෙහි මොවුන්ගෙන් ගැණෙන්නේ 'එ, අය, ආපෙ, ආපය" යන සතරයි.

උවර්ණාන්ත ධාතුකෙරෙන් "ණෙ, ණය" යන දෙක ද, ආකාරාන්ත ධාතු කෙරෙන් 'ණාපෙ, ණාපය" යන දෙක ද, සෙසු ධාතු කෙරෙන් සතරම හෝ දෙකක් ද වේ යයි කියන ලදී. භාෂානුසාරයෙන් දතයුතුයි.

**ධාතු ප්‍රයොජ්‍යප්‍රත්‍යය හා ක්‍රියාරූප.**

භූ- (ණෙ) – භාවෙති. (ණය) භාවයති.

දා- (ණාපෙ) දාපෙති. (ණාපය) දාපයති.

සද-(ණෙ) නිසීදෙති. (ණය) නිසීදයති. (ණාපෙ) නිසීදාපෙති. (ණාපය) නිසීදාපයති.

### උදාහරණ වාක්‍ය.

| ප්‍රයොජ්‍ය රහිත වාක්‍ය | ප්‍රයොජ්‍ය සහිත වාක්‍ය |
|---|---|
| චිත්තං භවති. (සිත වේ.) | භික්ඛු චිත්තං භාවෙති. (භික්ෂු තෙමේ සිත වඩයි.) |
| උපාසකො දානං දදාති (උපාසකතෙමේ දන් දෙයි. | ධනිකො උපාසකං දානං දාපෙති. (ධනවතා උපාසකයා ලවා දන් දෙවයි.) |
| භික්ඛු ආසනෙ නිසීදති. (භික්ෂුතෙමේ අස්නෙහි හිඳී.) | උපාසකො භික්ඛුං ආසනෙ නිසීදෙති. (උපාසක තෙමේ භික්ෂූහු අස්නෙහි වඩාහිඳුවයි.) |

මෙහි පූර්ව වාක්‍යයෙහි "චිත්තං" යන්න "භවති" යන ක්‍රියාවේ උක්ත කර්තෘපදයයි. ප්‍රයොජ්‍යාවස්ථාවෙහි සකර්මක වීමෙන් එය අනුක්ත කර්මය විය. දෙවන වාක්‍යයෙහි "උපාසකො" යනු "දදති" යන ක්‍රියාවේ උක්ත කර්තෘපද යයි. "දානං" යනු අනුක්ත කර්මයි. ප්‍රයොජ්‍යාවස්ථාවෙහි ද්විකර්මක වීමෙන් පූර්වාවස්ථාවෙහි "උපාසකො"යි සිටි කර්තෘ පදය ද "උපාසකං" යි අනුක්ත කර්මය විය. මේ වාක්‍යය 'ධනිකො උපාසකෙන දානං දාපෙති" කියා ද යෙදේ. එකල්හි "උපාසකෙන" යනු අනුක්ත කර්තෘයි. අර්ථය සමානයි. තෙවන වාක්‍යයෙහි "භික්ඛු" යනු "නිසීදති" යන්නෙහි උක්ත කර්තෘපදයයි. ප්‍රයොජ්‍යාවස්ථාවෙහි සකර්මක වීමෙන් ඒ කර්තෘපදය "භික්ඛුං" යි කර්මය විය. "උපාසකො" යනු උක්ත කර්තෘපදයි.

ප්‍රයොජ්‍ය රහිත වාක්‍යයෙහි සිටි කර්තෘපදය අනුක්ත කර්මය හෝ කර්තෘ වීම ද ප්‍රයොජ්‍ය ක්‍රියාවට අන්‍ය වූ කර්තෘ පදයක් යෙදීම ද සෑම තන්හි නියමයයි.

ප්‍රයොජ්‍ය ක්‍රියාවෝ කර්මකාරක වශයෙන් ද යෙදෙත්. ඒ මෙසේයි:

භික්ඛුනා චිත්තං භාවීයතෙ. (භික්ෂුහු විසින් සිත වඩනු ලැබේ.)

ධනිකෙන උපාසකෙන දානං දාපීයතෙ. (ධනවතා විසින් උපාසකයා ලවා දන් දෙවනු ලැබේ.)

උපාසකෙන භික්ඛු ආසනෙ නිසීදාපීයතෙ. (උපාසකයා විසින් භික්ෂුතෙමේ අස්නෙහි වඩාහිඳුවනු ලැබේ.)

ප්‍රයොජ්‍යප්‍රත්‍යයන් යෙදීමෙන් ධාතුවිකෘති සෑදෙන පිළිවෙළ ඇඟවීමට මෙහි "ඨා" ආදි ධාතූන්ගෙන් සිද්ධ රූප ද දක්වනු ලැබෙත්.

## "ඨා" ආදි ධාතූන්ගේ ප්‍රයෝජ්‍ය විෂයෙහි විභක්ති.

| ධාතු | ණෙ | ණය | ණාපෙ | ණාපය |
|---|---|---|---|---|
| ඨා– | | | තිට්ඨාපෙ | තිට්ඨාපය |
| සි– | සායෙ | සායය | සයාපෙ | සයාපය |
| වස– | වාසෙ | වාසය | වසාපෙ | වසාපය |
| පත– | පාතෙ | පාතය | පාතාපෙ | පාතාපය |
| මර– | මාරෙ | මාරය | මාරාපෙ | මාරාපය |
| ජර– | ජීරෙ | ජීරය | ජීරාපෙ | ජීරාපය |
| දිස– | දස්සෙ | දස්සය | දස්සාපෙ | දස්සාපය |
| ගම– | ගමෙ | ගමය | ගච්ඡාපෙ | ගච්ඡාපය |
| ඉසු– | එසෙ | එසය | ඉච්ඡාපෙ | ඉච්ඡාපය |
| ලභ– | ලාභෙ | ලාභය | ලභාපෙ | ලභාපය |
| ඛාද– | ඛාදෙ | ඛාදය | ඛාදාපෙ | ඛාදාපය |
| පා– | පායෙ | පායය | | |

දූත් ඒ මිනිහා ගමට යයි.
ළමයා හඳ බලයි.
සඞ්ඝයා විහාරයෙහි වසයි.

මේ වාක්‍යයන් ප්‍රයෝජ්‍යාවස්ථාවට ද, ප්‍රයෝජ්‍යාවස්ථාවෙන් කර්මකාරකාවස්ථාවට ද පමුණුවනු.

### 25 පාඩම.

## ආකාරාන්ත සර්වනාමයන්ගේ විභක්තිරූප.

සර්වනාමශබ්ද ස්ත්‍රීලිඞ්ගයෙහි යෙදෙන කල්හි "සබ්බා" ආදි වශයෙන් ආකාරාන්ත වෙත්. ඔවුන්ගේ චතුර්ථී ෂෂ්ඨී විභක්ති දෙක හා සප්තමී එකවචනය හැර සෙසු විභක්ති

රූප පූර්වෝක්ත "විජ්ජා" ශබ්දයාගේ රූප මෙනි. එහිදු චතුර්ථී ෂෂ්ඨී දෙක සමාන වේ.

### "සබ්බා" ශබ්දය.

| එක | බහු |
| --- | --- |
| ච-සබ්බස්සා-සබ්බාය | සබ්බාසං-සබ්බාසානං |
| ස-සබ්බස්සං-සබ්බායං | |

"කතරා" ශබ්දාදියෙහි විභක්තිරූප ද මෙසේ දතයුතුයි. එහිදු මේ දක්වන ශබ්දයන්ගේ රූප මෙසේ දතයුතුයි.

### "තා" ශබ්දය.

| එක | බහු |
| --- | --- |
| ච-තිස්සාය, තිස්සා | |
| තස්සාය, තස්සා | |
| නස්සාය, නස්සා | |
| අස්සාය, අස්සා -තාය-තාය | තාසං, තාසං, තාසානං |
| ස-තස්සං, තිස්සං, නස්සං, අස්සං | |
| තායං, තායං | තාසු, තාසු |

### "එතා" ශබ්දය.

| | |
| --- | --- |
| ච-එතිස්සා, එතිස්සාය, එතාය | එතාසං, එතාසානං |
| ස-එතිස්සං, එතායං, එතාය | එතාසු |

### "අඤ්ඤා, එකා, ඉතරා" ශබ්ද.

මේ ශබ්දයන්ගේ චතුර්ථීෂෂ්ඨී එකවචනරූප "අඤ්ඤිස්සා-අඤ්ඤාය; එකිස්සා-එකාය, ඉතරිස්සා ඉතරාය" කියා ද, සත්තමී එකවචනරූප "අඤ්ඤිස්සං-අඤ්ඤායං, එකිස්සං-එකායං, ඉතරිස්සං-ඉතරායං" කියා ද වෙත්.

### "ඉමා" ශබ්දය.

මෙහි චතුත්ථී එකවචනයෙහි "අස්සා, අස්සාය, ඉමිස්සා, ඉමිස්සාය, ඉමාය" යනු ද, සත්තමී එකවචනයෙහි "අස්සං, ඉමිස්සං, ඉමිස්සා, ඉමායං" යනු ද වේ.

### "අමු" ශබ්දය.

මේ ශබ්දයාගේ චතුත්ථී ඡට්ඨී එකවචනයෙහි "අමුස්සා, අමුයා" යනු ද, බහුවචනයෙහි "අමූසං, අමූසානං" යනු ද, සත්තමී එකවචනයෙහි "අමුස්සං, අමුයං" යනු ද, බහුවචන යෙහි "අමූසු" යනු ද වේ.

---

### ආකාරාන්ත පුංලිඞ්ග ශබ්ද.

ආකාරාන්ත පුංලිඞ්ග ශබ්දප්‍රකෘති "සා (සුනඛ), මා (චන්ද්‍ර)" ආදි කීපයෙකි. සමාස වශයෙන් සිඬ "පච්චක්ඛ ධම්මා (ප්‍රත්‍යක්ෂ වූ ධර්මයන් ඇති) ගාණ්ඩිවධන්වා (ගැට සහිත දුනු ඇති) යනාදි ඇතැම් ශබ්දයෝ ද ආකාරාන්ත පුංලිඞ්ග වශ යෙන් දක්නා ලැබෙත්. මේ ශබ්ද ස්ත්‍රීලිඞ්ග හා නපුංසකලිඞ්ග ද වියහැකි වෙත්. ස්ත්‍රීලිඞ්ග තන්හි ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගයන්ගේ මෙන් ද, නපුංසකලිඞ්ග තන්හි අන්තය හ්‍රස්ව වීමෙන් ආකා රාන්ත නපුංසකලිඞ්ගයන්ගේ මෙන් ද රූප දතයුතුයි.

### පුංලිඞ්ග "සා" ශබ්දරූප.

| එක | බහු |
|---|---|
| ප - සා | සා |
| ආ - ස - සා | ,, |
| දු - සං | සෙ |
| ත - සෙන | සාහි - සාභි |
| ච - සස්ස - සාය | සානං |
| ප - සා - සස්මා - සම්හා | සාහි - සාභි |
| ඡ - සස්ස | සානං |
| ස - සෙ - සස්මිං, සම්හි | සාසු |

"මං" ඒ ශබ්දාදීන්ගේ විභක්තිරූප ද මෙසේ දතයුතුයි.

### සිංහල වාක්‍ය.

මේ අවුරුද්දෙහි ලඞ්කාවේ වර්‍ෂධාරාවෝ බහුල වූහ.

එහෙයින් සියලු ගඞ්ගාවෝ නිතරම දියෙන් පිරුණෝවූහ.

ඊයේ දවල් ඒ පාසැලේ මගුල්ගල (මුල්ගල) පිහිටුවන ලද්දීය.

ඒ සභාවෙහි බොහෝ ගරුකටයුතු මිනිස්සු සිටියාහ.

ඒ වේලාවේ ඒ සියලු මිනිසුන්ගේම සිත් සතුටු වූහ.

මේ වාක්‍යයෝ පාළියට පෙරළිය යුතුයි.

නිතරම-නිච්චං එව, දිය-ජල, පිරුණ-පුණ්ණ, පිහිටුවනලද-පතිඨාපිත, ගරුකටයුතු-ගරුකාතබ්බ, සතුටු-තුඪ.

26 පාඩම.

## ඉකාරාන්තනාම.

| පුල්ලිඞ්ග | | ඉත්ථිලිඞ්ග | | නපුංසකලිඞ්ග | |
|---|---|---|---|---|---|
| පාළි | අර්ථ | පාළි | අර්ථ | පාළි | අර්ථ |
| අග්ගි | ගිනි | මති | ප්‍රඥා | අඬි | ඇට |
| අරි | සතුරු | සති | සමෘති | සත්ථි | කලව |
| මුනි | ඍෂි | ගති | ගමන් | දධි | දී |
| ගිරි | පර්වත | වුඩ්ඩි | වැඩීම් | වාරි | දිය |
| රවි | සූර්‍ය්‍ය | දිඨි | දැකුම් | අක්ඛි | ඇස් |
| කවි | පණ්ඩිත | පාළි | පෙල | අච්ඡි | ,, |
| ආදි | මූල | රත්ති | රාත්‍රි | අච්චි | ගිනිසිලු |

## විභක්තිරූප.

| අන්තාවධාරණය. | | | "අග්ගි" ශබ්දයේ විභක්තිරූප. | |
|---|---|---|---|---|
| | එක | බහු | එක | බහු |
| ප- | ඉ | ඊ, අයො | අග්ගි | අග්ගී-අග්ගයො |
| ආ- | ,, | ,, ,, | ,, | ,, ,, |
| දු- | ඉං | ,, , | අග්ගිං | ,, ,, |
| ත- | ඉනා | ඊහි- ඊභි | අග්ගිනා | අග්ගීහි-අග්ගීභි |
| ච- | ඉනො-ඉස්ස | ඊනං | අග්ගිනො-අග්ගිස්ස | අග්ගීනං |
| ප- | ඉනා, ඉම්හා-ඉස්මා | ඊහි- ඊභි | අග්ගිනා-අග්ගිම්හා-අග්ගිස්මා | අග්ගීහි-අග්ගීභි |
| ඡ- | ඉනොඉස්ස | ඊනං | අග්ගිනො-අග්ගිස්ස | අග්ගීනං |
| ස- | ඉම්හි-ඉස්මිං | ඉසු- ඊසු | අග්ගිම්හි-අග්ගිස්මිං | අග්ගිසු-අග්ගීසු |

"ආදි" ශබ්දයාගේ සත්තමී එකවචනයෙහි "ආදිං-ආදෙ" යන විභක්තිරූප දෙක ද වේ.

| අන්තාවධාරණය. | | | "මති" ශබ්දයාගේ විභක්තිරූප. | |
|---|---|---|---|---|
| | එක | බහු | එක | බහු |
| ප- | ඉ | ඊ-ඉයො | මති | මතී-මතියො |
| ආ- | | ,, ,, | ,, | ,, ,, |
| දු- | ඉං | ,, ,, | ,, | ,, ,, |
| ත- | ඉයා-යා | ඊහි ඊභි | මතියා-මත්‍යා | මතීහි-මතීභි |
| ච- | ඉයා | ඊනං | මතියා | මතීනං |
| ප- | ඉයා-යා | ඊහි-ඊභි | මතියා-මත්‍යා | මතීහී මතීභි |
| ඡ- | ඉයා | ඊනං | මතියා | මතීනං |
| ස- | ඉයං-යං-ඉයා-යා | ඉසු-ඊසු | මතියං-මත්‍යං මතියා-මත්‍යා | මතිසු-මතීසු |

"රත්ති" ශබ්දයාගේ සත්තමී එකවචනයෙහි "රත්තිං, රත්තො" යන රූප දෙක ද වේ.

**අනෙනාවචාරණය.** **"අඝී" ශබ්දයාගේ විභක්ති රූප**

| | | | |
|---|---|---|---|
| ප-ඉ | ඊ-ඊනි | අඝී | අඝී-අඝීනි |
| ආ- ,, | ,, ,, | ,, | ,, ,, |
| දු- ඉං | ,, ,, | ,, | ,, ,, |

සෙසු රූප පුංලිඞ්ග "අග්ගි" ශබ්දයේ මෙන් දත යුතුයි.

## "ඤ ල ම ද" ආදෙශසන්ධි.

## 23. නිග්ගහීතයට ඤ ල ම ද වර්ණයන් වීමෙන් සන්ධිවිධි සතරෙකි.

"එ, හ" යන මේ වර්ණයකින් පූර්වයෙහි සිටි නිග්ගහීත යට හා "ංය" යන්නට ඤකාරය වීමෙන් එක් සන්ධිවිධියක්ද, ලකාරයෙන් පූර්වයෙහි සිටි නිග්ගහීතයට ලකාරය වීමෙන් එක් සන්ධිවිධියක්ද, ස්වරයකින් පූර්වයෙහි සිටි නිග්ගහීතයට මයන්න වීමෙන් එක් සන්ධිවිධියක් ද, දයන්න වීමෙන් එක් සන්ධිවිධියක් ද සිඩයි.

මෙහි එයන්නෙන් පූර්ව නිග්ගහීතයට වූ ඤයන්න හා "ංය" යන්නට වූ ඤයන්න විරූකතාවූ "ඤ්ඤ" යන්නයයි දතයුතුයි.

එයන්නෙන් පූර්ව නිග්ගහීතයට ඤයන්න—තං=එව-
තඤ්ඤෙව.
යයන්නෙන් " " " " —සං=යොගො-
සඤ්ඤොගො.
හයන්නෙන් " " " " —තං=හි-තඤ්හි.
ලයන්නෙන් " " ලයන්න—සං=ලීනො
සල්ලීනො.
ස්වරයෙන් " " මයන්න—තං=අහං-
තමහං.
" " " දයන්න—එතං=අවොච-
එතදවොච.

## උපසර්ගපූර්වකයෙන් වූ "භූ" ධාතුගත අර්ථවිශෙෂ.

උපසර්ගයන් පූර්ව වීමෙන් "භූ" ධාතුවෙන් ලැබෙන සකර්මකාර්ථ මෙහි දක්වනලද්දැහ. එසේම උපසර්ග පූර්ව වීමෙන් ධාතුවේ ප්‍රකටවූ අකර්මකාර්ථය හැර තවත් අකර්ම කාර්ථයෝ ද වෙත්. එනම්:

ප උපසර්ග පූර්ව "භූ" ධාතුවෙන් "පහළවීම, ඉසුරුමත් වීම, සමර්ථවීම" යන මේ අර්ථයෝ ද, "පරා" පූර්ව "භූ" ධාතුවෙන් "පිරිහීම" යන අර්ථය ද, "සං" පූර්ව "භූ" ධාතුවෙන් "ලැබීම" යන අර්ථය ද, "උ" පූර්ව "භූ" ධාතුවෙන් "ඉපදීම" යන අර්ථය ද වෙත්. මේ හැර තවත් අර්ථයෝ ද වෙත්, භාෂානුසාරයෙන් දතයුතුයි. මේ උපසර්ගයන් පූර්ව වීමෙන් වූ ධාතුවිකෘති නම් "පභව, පරාභව, සම්භව, උබ්භව" යන මොහුයි.

පර්වතයෙන් ගඞ්ගාවෝ පහළ වෙත්.
පණ්ඩිතයෝ ප්‍රඥාවෙන් ඉසුරුමත් වෙත්.
භාවනාවෙන් පහවූයේ දැහැනෙන් පිරිහේ.
විද්‍යාවෙන් උතුම් සම්පත්තිය ලැබේ.
සිහියෙන් සියලු ගුණයෝ උපදිත්.

මේ වාක්‍යයෝ පාළියෙන් ලියයුතුයි.

## රුධාදිගණයෙහි ධාතු.

මෙහි විකරණය "ං-අ" යනුයි.

මෙහි ධාතුන්ගේ අර්ථ හා කාලත්‍රය පිළිබඳ කර්තෘ කර්ම කාරකවයෙහි ක්‍රියාරූප යොදාගැණීමට උවමනා ධාතු විකෘති හා කත්තුකාරකපයොජ්ජයෙහි ධාතුවිකෘති ද දක්වනු ලැබෙත්, ඔවුන් කෙරෙන් "ති" ආදි විභක්ති ප්‍රත්‍යයන් යොදා ක්‍රියාරූප නිපදවා ගතයුතුයි. මෙහි ඒ ඒ ධාතුගණයන්හි ධාතුවිකෘති සිඩ ආකාරය අවබොධ කරවනු සඳහා සවල්ප මාත්‍රයක් දැක්වීම මුත් ක්‍රියාරූප හෙද මෙහි ප්‍රකාශ නොකොට හැකි වෙත්.

| | | වත්ත- | | අනා- | | |
|---|---|---|---|---|---|---|
| **අත්ථ** | **ධාතු** | **මාන** | **අතීත** | **ගත** | **කම්ම** | **පයොජ්ජ** |
| ඇවිරීම | රුධි | රුන්ධ | අරුන්ධි | රුන්ධි | රුජ්ඣ | රොධෙ |
| කැපීම | ඡිදි | ඡින්ද | ඡින්දි | ඡින්දි | ඡිජ්ජ | ඡෙදෙ |
| බිදීම | භිද | භින්ද | භින්දි | භින්දි | භිජ්ජ | භෙජෙ |
| යෙදීම | යුජ | යුඤ්ජ | අයුඤ්ජි | යුජි | යුජ්ජ | යොජෙ |
| බුදීම | භුජ | භුඤ්ජ | අභුජි | භුජි | භුජ්ජ | භොජෙ |
| මිදීම | මුච | මුඤ්ච | මුචි | මුචි | මුච්ච | මොචෙ |

මේ ධාතුන්ගෙන් සිද්ධ මෙකී ධාතු විකෘති වනාහි සාමාන්‍ය විධි වශයෙන් සැලකිය යුතුයි. ඇතැම් තන්හි මීට වඩා විශෙෂවශයෙන් සිද්ධ රූපයෝ ද දක්නාලැබෙත්. පයොජ්ජ විෂයෙහි "රොධය, රුධාපෙ, රොධාපය" යන ආදිය ද, කම්මකාරකපයොජ්ජ විෂයෙහි "රොධාපිය" යන ආදිය ද යොදා ගතයුතුයි. මේ "රුන්ධ" යනාදියෙන් වත්තමානා පඤ්චමී සත්තමී විභක්තිප්‍රත්‍යයන් යොදා "රුන්ධති, රුන්ධතු, රුන්ධෙය්‍ය" යනආදි වශයෙන් ද, අතීතයෙහි "අරුන්ධි" යනආදි වශයෙන් ද, අනාගතයෙහි "රුන්ධිස්සති" යනආදි වශයෙන් ද ක්‍රියාරූප යොදාගතයුතුයි.

තවද මේ ධාතුගණයෙහි වූ විකරණය යෙදීමෙන් ධාතුවිකෘතීන්ගේ සිද්ධිය මෙසේ දතයුතුයි. එනම්: 'රුධි" ධාතුවෙන් "අ" යන්න වූ කල්හි "රුධ" යනු වේ. "රු" යන්නෙන් පරව බින්දුව ආගම වශයෙන් යෙදුන කල්හි 'රුංධ" යනු වේ. පසුව ඒ බින්දුවට වර්ගාන්තාදෙශ තයන්න වූ කල්හි "රුන්ධ" යනු වේ. සෙස්ස ද ඒ පිළිවෙළින් දතයුතුයි.

### වර්ගාන්තාදේශසන්ධි.

## 24. වර්ගව්‍යඤ්ජනයෙන් පෙර සිටි බින්දුවට තද්වර්ගාන්තය වීමෙන් සන්ධිවිධි පසෙකි.

වර්ගව්‍යඤ්ජනයකින් පෙර බින්දුව සිටියයොත් ඇතැම් තන්හි ඒ බින්දුවට ඒ ඒ වර්ගාන්තයන් වීමෙන් සන්ධිවිධි පසක් සිඬයි. ‘තණ්හං=කරො=තණ්හඞ්කරො, මුං=චති-මුඤ්චති, සං=ඨිතො- සණ්ඨිතො, රුං=ධති- රුන්ධති, සං=මතො-සම්මතො’’ යන ආදි වශයෙනි.

### ඊකාරාන්ත නාම.

පාළියෙහි ‘ඊකාරාන්ත නාමයෝ ඇතැම් කෙනෙක් ස්ත්‍රීලිඞ්ග වශයෙන් නිපන්නෝ ද වෙත්. එහි ලිඟු තුණට සාධාරණව නිපන්නෝ නම් තද්ධිතයෙහි ඊප්‍රත්‍යයෙන් සිඬ “දණ්ඩී” ආදිය ද, කිතකයෙහි ‘‘ණී, (ඊ) ආවී, තාවී’’ ආදි ප්‍රත්‍යයන්ගෙන් සිඬ ‘‘සච්චවාදී, භයදස්සාවී, කතාවී’’ යන ආදිය ද වෙත්. මේ ශබ්ද පාළියෙහි ඊකාරාන්ත වුවත් සංස්කෘත භාෂාවෙහි ‘‘දණ්ඩින්, සත්‍යවාදින්’’ ආදි වශයෙන් නකාරාන්ත වෙත්. පාළියෙහිදු මොවුන්ගේ ඇතැම් විභක්ති රූප නකාරවත් වන බැව් පෙණේ. එසේම මේ ශබ්ද ස්ත්‍රීලිඞ්ගයෙහි යෙදෙන කල්හි ද “දණ්ඩිනී, සච්චවාදිනී” යන ආදි වශයෙන් නකාරවත් වෙත්.

### පුල්ලිඞ්ග.

| පාළි | අර්ථ | පාළි | අර්ථ |
|---|---|---|---|
| දණ්ඩී | දඬුඇති | සච්චවාදී | සත්‍යය කියනසුලු |
| ධනී | ධනඇති | බ්‍රහ්මචාරී | උතුම් පිළිවෙතෙහි හැසිරෙණසුලු |

| | | | |
|---|---|---|---|
| ගුණී | ගුණඇති | භයදස්සාවී | බිය දක්නාසුලු |
| ඤාණී | නැණඇති | ආදීනවදස්සාවී | දෙස් දක්නාසුලු |
| හත්ථී | ඇත් | කථාවී | කථා |
| කරී | ” | භුත්තාවී | අනුභවකළ |

| අනෙකාවචාරණය | | විභක්තිරූප | |
|---|---|---|---|
| **එක** | **බහු** | **එක** | **බහු** |
| **ප**- ඊ | ඊ, ඉනො | දණ්ඩී | දණ්ඩී, දණ්ඩිනො |
| **ආ**- ඉ | ” ” | දණ්ඩි | ” ” |
| **දු**- ඉනං, ඉං | ” ” | දණ්ඩිනං, දණ්ඩිං | ” ” |
| **ත**- ඉනා | ඊහි, ඊභි | දණ්ඩිනා | දණ්ඩීහි, දණ්ඩීභි |
| **ච**- ඉනො, ඉස්ස | ඊනං | දණ්ඩිනො, දණ්ඩිස්ස | දණ්ඩීනං |
| **ප**- ඉනා, ඉම්හා- ඉස්මා | ඊහි, ඊභි | දණ්ඩිනා, දණ්ඩිම්හා, දණ්ඩිස්මා | දණ්ඩීහි, දණ්ඩීභි |
| **ඡ**- ඉනො, ඉස්ස | ඊනං | දණ්ඩිනො, දණ්ඩිස්ස | දණ්ඩීනං |
| **ස**- ඉනි, ඉස්මිං,- ඉම්හි | ඊසු | දණ්ඩිනි, දණ්ඩිස්මිං, දණ්ඩිම්හි | දණ්ඩීසු |

සෙසු ඊකාරාන්තපුල්ලිඞ්ග නාමයන්ගේ විභක්තිරූප ද මෙසේ දතයුතුයි.

**ස්ත්‍රීලිඞ්ග ශබ්ද**

| පාලි | අර්ථ | පාලි | අර්ථ | පාලි | අර්ථ |
|---|---|---|---|---|---|
| ඉත්ථී | ස්ත්‍රී | වාපී | වැව් | දණ්ඩිනී | දඬු ඇති ස්ත්‍රී |
| මහී | පෘථිවි | කුමාරී | කුමරි | භයදස්සාවිනී | බිය දක්නා සුලු ස්ත්‍රී |
| නදී | ගඞ්ගා | සඛී | යෙහෙළි | කථාවිනී | කථා ස්ත්‍රී |

| අනෙනාවචාරණය | | විභක්තිරූප | |
|---|---|---|---|
| එක | බහු | එක | බහු |
| ප–ඊ | ඊ, ඉයො | ඉත්ථී | ඉත්ථී, ඉත්ථියො |
| ආ–ඉ | ,, ,, | ඉත්ථි | ,, ,, |
| දු–ඉං, ඉයං | ,, ,, | ඉත්ථිං, ඉත්ථියං | ,, ,, |
| ත–ඉයා | ඊහි, ඊභි | ඉත්ථියා | ඉත්ථීහි, ඉත්ථීභි |
| ච–ඉයා | ඊනං | ඉත්ථියා | ඉත්ථීනං |
| ප–ඉයා | ඊහි, ඊභි | ඉත්ථියා | ඉත්ථීහි, ඉත්ථීභි |
| ඡ–ඉයා | ඊනං | ඉත්ථියා | ඉත්ථීනං |
| ස–ඉයං, ඉයා | ඊසු | ඉත්ථියං, ඉත්ථියා | ඉත්ථීසු |

"නදී" ශබ්දයාගේ පඨමාදුතියා බහුවචනයෙහි "නජ්ජෝ" යන රූපයද, තතියා චතුත්ථී පඤ්චමී ඡට්ඨී එකවචනයන්හි "නජ්ජා" යන රූපයද, සත්තමී එකවචනයෙහි "නජ්ජං" යන රූපයද වේ.

## නපුංසක ලිඞ්ග.

| අනෙනාවචාරණය. | | විභක්තිරූප. | |
|---|---|---|---|
| එක | බහු | එක | බහු |
| ප–ඉ | ඊ, ඊනි | දණ්ඩි | දණ්ඩී, දණ්ඩීනි |
| ආ–,, | ,, ,, | ,, | ,, ,, |
| දු–ඉං, ඉනං | ,, ,, | දණ්ඩිං, දණ්ඩිනං | ,, ,, |

සෙසු රූප පුංලිඞ්ගයෙහි මෙනි.

බියදක්නාසුලු මිනිස්තෙමේ පාපයෙන් මිදේ. අන්‍යයා ද මුදවයි.

ධනය ඇත්තහු විසින් සුවසේ ආහාරය අනුභව කරණු ලැබේ.

ඔහු විසින් දිළින්දා ද එසේ ආහාරය අනුභව කරවනු ලැබේ.

මේ වාක්‍යයෝ පාළියෙන් ලිය යුත්තාහ.

"ඡින්ද, ඡිජ්ජ, ඡේදෙ" යන මොවුන් කෙරෙන් වර්ත්තමාන පඨමපුරිස මජ්ඣිමපුරිස දෙක්හි බහුවචන විභත්ති ප්‍රත්‍යයන් යොදා ඔවුන් හා යෙදිය හැකි නාමපදයන් ද යොදා වාක්‍ය තුණක් ගැළපිය යුතුයි.

## 28 පාඩම.

### උකාරන්ත පුංලිඞ්ගනාම.

පාළියෙහි උකාරන්ත නාමයෝ ප්‍රධානවශයෙන් දෙකට බෙදෙත්. සාමාන්‍යයෙන් උකාරන්තව නිපන් නාම කොට සක්ද, "තු" ප්‍රත්‍යයෙන් උකාරන්තව නිපන් නාම කොට සක්ද කියායි. එහි "තු" ප්‍රත්‍යයෙන් නිපන්නෝ නම් කිතක යෙහි සිඩ ක්‍රියාවාචක නාමයෝයි.

### සාමාන්‍ය උකාරන්ත නාම.

| පාළි | අර්ථ | පාළි | අර්ථ | පාළි | අර්ථ |
|---|---|---|---|---|---|
| භික්ඛු | භික්ෂු | සෙතු | හෙය | සින්ධු | සමුද්‍ර |
| භානු | හිරු | කෙතු | කොඩි | වෙළු | හුණ |
| මච්චු | මරු | සත්තු | සතුරු | හෙතු | හේ |
| බන්ධු | ඥාති | මෙරු | මෙර | ජන්තු | සත්ව |

| අනෙනාවචාරණය. | | විභත්තිරූප | |
|---|---|---|---|
| එක | බහු | එක | බහු |
| ප-උ | ඌ, ආවො | භික්ඛු | භික්ඛූ, භික්ඛවො |
| ආ-,, | ඌ, අවෙ; අවො | ,, | භික්ඛූ, භික්ඛවෙ, භික්ඛවො |
| දු-උං | ඌ, අවො | භික්ඛුං | භික්ඛූ, භික්ඛවො |
| ත-උනා | ඌහි, ඌභි | භික්ඛුනා | භික්ඛූහි, භික්ඛූභි |
| ච-උනො | | භික්ඛුනො | |
| උස්ස | ඌනං | භික්ඛුස්ස | භික්ඛූනං |
| ප-උනා, | | භික්ඛුනා | |
| උස්මා, | | | |
| උම්හා | ඌහි, ඌභි, | භික්ඛුස්මා | |
| | | භික්ඛුම්හා | භික්ඛූහි භික්ඛූභි |

| | |
|---|---|
| **ඡ**-උනො | භික්ඛුනො |
| උස්ස උනං | භික්ඛුස්ස භික්ඛූනං |
| **ස**-උම්හි | භික්ඛුම්හි |
| උස්මිං උසු, ඌසු | භික්ඛුස්මිං භික්ඛුසු, භික්ඛූසු |

"හෙතු" ශබ්දයාගේ පඨමාදුතියා බහුවචනයන්හි "හෙතුයො" යන රූපයද, "ජන්තු" ශබ්දයාගේ පඨමා දුතියා බහුවචනයන්හි "ජන්තුනො-ජන්තුයො" යන රූප දෙක ද වේ.

## දිවාදිගණයෙහි ධාතු.

මෙහි විකරණය "ය" යනුයි.

වත්තමානා පඤ්චමී සත්තමී යන විභත්ති තුණෙහි ධාතු විකෘති සමයයි දතයුතුයි. මේ දිවාදිගණයෙහි කත්තු කම්ම කාරකවයද සම වේ.

## ධාතු විකෘති.

| අර්ථ | ධාතු | වත්තමාන | අතීත | අනාගත | පයොජ්ජ |
|---|---|---|---|---|---|
| කෙළිම | දිවු | දිබ්බ | අදිබ්බි | දිබ්බි | දෙවෙ |
| මැසීම | සිවු | සිබ්බ | අසිබ්බ | සිබ්බි | සෙවෙ |
| දැනීම | බුධ | බුජ්ඣ | අබුජ්ඣි | බුජ්ඣි | බොධෙ |
| ,, | මන | මඤ්ඤ | අමඤ්ඤි | මඤ්ඤි | මඤ්ඤෙ |
| යාම | පද | පජ්ජ | අපජ්ජි | පජ්ජි | පාදෙ |
| කිපීම | කුප | කුප්ප | අකුප්පි | කුප්පි | කොපෙ |
| තුටුවීම | තුස | තුස්ස | අතුස්සි | තුස්සි | තොසෙ |
| ඉපදීම | ජන | ජාය | අජායි | ජායි | ජනෙ |

මෙහි කී "පද" ධාතුව හා උපසර්ගයන් යෙදීමෙන් විශෙෂාර්ථව තිපන් පදයෝ බොහෝ වෙත්. ඉන් ස්වල්පයක් මෙසේ දතයුතුයි.

| උපසර්ග: | අර්ථ | ධා: වි: | උපසර්ග | අර්ථ | ධා: වි: |
|---|---|---|---|---|---|
| ආ– | පැමිණීම | ආපජ්ජ | සං– | සමෘද්ධිය | සම්පජ්ජ |
| නි– | නිපදීම | නිප්පජ්ජ | වි– | විනාශය | විපජ්ජ |
| උ– | ඉපදීම | උප්පජ්ජ | පටි– | පිළිපැදීම | පටිපජ්ජ |

මොවුන් කෙරෙන්ද "නි" ආදිය යොදා ක්‍රියාරූප නිප දවා ගතයුතුයි. ප්‍රයොජ්‍යවිෂයෙහි "ආපාදෙ" යනාදි වශයෙන් යොදාගතයුතුයි.

සප්පුරිසා තුම්හෙ ධම්මං බුජ්ඣථෙහා-(සත්පුරුෂයෙනි තෙපි දහම් දැනගණිව්.)

තං ධම්මං අඤ්ඤෙ ච බොධයථෙහා-(ඒ ධර්මය අන්‍යයන් ලවාද අවබොධ කරවව්.)

සීලවන්තෙහි භික්ඛූහි සම්මාපටිපත්ති පටිපජ්ජතෙ

(සිල්වත් භික්ෂූන් විසින් මනාපිළිවෙත පිළිපදිනු ලැබේ.)

තෙ අඤ්ඤෙපි තං පටිපත්තිං පටිපාදෙන්ති

(ඔවුහු අන්‍යයන්ද ඒ පිළිවෙත පිළිපද්දවත්)

මෙහි "අඤ්ඤෙ" යනු ප්‍රයොජ්‍යකර්මයි. එය "අඤ්ඤෙහි" කියා අනුක්ත කර්තෘ වශයෙන්ද යෙදේ.

සතුරෝ සත්පුරුෂයන්ගේ යහපත් නම් විනාශ කෙරෙත්.

මාරයා සඞ්ඝයන් නොමග යවත්.

අඥනයෝ මරුවා සතුටු කෙරෙත්.

දුර්ජනයෝ අන්‍යයන්ගේ මද දෙසට කිපෙත්.

සජ්ජනයෝ එබඳු දෙස් දෙස් වශයෙන් නොසිතත්.

මේ වාක්‍යයෝ පාළියෙන් ලිවියයුතුයි.

නොමග-අමග්ග, අඥන-අඤ්ඤාණ, දුර්ජන-දුජ්ජන දෙස්-දොස.

29 පාඩම.

## "තු" ප්‍රත්‍යයාන්ත උකාරාන්ත නාම.

"රත්ථු" ප්‍රත්‍යයෙන් නිපන් "සත්ථු" ශබ්දය ද "රිතු" ප්‍රත්‍යයෙන් නිපන් "පිතු" ශබ්දය ද "රාතු" ප්‍රත්‍යයෙන් නිපන් "භාතු" ශබ්දයද මේ ගණයෙහිම ඇතුළත් වේ. එහිදු "පිතු, භාතු" ශබ්දයන්ගේ ඇතැම් විභක්තිරූප "තු" ප්‍රත්‍යයාන්තයන්ට වඩා වෙනස් වෙත්

| **පාළි** | **අර්ථ** | **පාළි** | **අර්ථ** | **පාළි** | **අර්ථ** |
|---|---|---|---|---|---|
| කත්තු | කරන්නා | ඤාති | දන්නා | බොද්ධු | දන්නා |
| ගන්තු | යන්නා | දාතු | දෙන්නා | සත්ථු | අනුශාසනය කරන්නා |
| වත්තු | කියන්නා | ධාතු | දරන්නා | නත්තු | මුනුබුරු |
| නෙතු | පමුණුවන්නා | ජේතු | දිනන්නා | පිතු | පිතෘ (පිය) |
| සොතු | අසන්නා | ඡේත්තු | කපන්නා | භාතු | සහෝදර |

| **අන්‍යොන්‍යාවධාරණය** | | **විභක්තිරූප** | |
|---|---|---|---|
| **එක** | **බහු** | **එක** | **බහු** |
| ප-ආ | ආරො | කත්තා | කත්තාරො |
| ආ-අ-ආ | " | කත්ත, කත්තා | " |
| දු-ආරං | ආරෙ-අරො | කත්තාරං | කත්තාරෙ<br>කත්තාරො |
| ත-ආරා | ආරෙහි<br>ආරෙභි | කත්තරා | කත්තාරෙහි,<br>කත්තාරෙභි |
| ච-උ, | ආරානං, | කත්තු, | කත්තාරානං, |
| උනො. | ආනං, | කත්තුනො, | කත්තානං, |
| උස්ස | ඌනං | කත්තුස්ස | කත්තූනං |
| පං-ආරා | ආරෙහි, ආරෙභි | කත්තාරා | කත්තාරෙහි,<br>කත්තාරෙභි |

| | | | |
|---|---|---|---|
| **ස-අරි** | ආරෙසු, උසු | කත්තරි | කත්තාරෙසු |
| ඡට්ඨිය චතුත්ථිය මෙනි. | | | කත්තූසු |

"පිතු භාතු" ශබ්දයන්ගේ විභක්තිරූප විෂයෙහි "ආරෙ" යන ආදියෙහි ආයන්ත හ්‍රස්වවීමෙන් "පිතරෙ පිතරං" යන ආදි වශයෙන් විභක්තිරූප සිඩයි. තතියා පඤ්චමී බහුවචනයන්හි "පිතූභි, පිතූහි" යන රූපදෙකද වේ. චතුත්ථී ඡට්ඨීබහුවචනයන්හි "පිතුන්නං" යනුද වේ. සෙසු රූප "කත්තු" ශබ්දයෙහි මෙනි. "සත්ථු" ශබ්දයාගේ චතුත්ථීඡට්ඨී බහුවචනයන්හි 'සත්ථූනං" කියා රූපයක් නොවේ.

මේ ගණයෙහි නාමයෝ සංස්කෘතයෙහි ඍකාරාන්ත වෙත්. තවද මෙහි කී "කත්තු" ආදි "තු" ප්‍රත්‍යයාන්තයෙ කර්තෘකාරකයෙහි නිපන් ක්‍රියාවාචක කිතකයෝයි. ඔවුන් විෂයෙහි යෙදෙන කර්මය බොහෝ සෙයින් ෂෂ්ඨීවිභක්ති යෙන් යෙදේ. "කම්මස්ස කත්තා, (කර්මය කරන්නා)" යන ආදිවශයෙනි. ඇතැම් තන්හි ද්විතීයාරූපයද යෙදේ.

### ස්වාදිගණයෙහි ධාතු.

"ණු, ණා, උණා" යන තුණ මෙහි විකරණයෝයි. මෙහි "ණු" යන්න ඇතැම් තන්හි "ණෝ" කියාද යෙදේ.

### ධාතුවිඛ්‍යාති

| අර්ථ | ධාතු | වර්තමාන | අතීත | අනාගත | කර්ම | ප්‍රයෝජ්‍ය |
|---|---|---|---|---|---|---|
| ඇසීම | සු | සුණා | අසුණි | සුණී | සූය | සාවෙ |
| පැමිණීම | අප | පාපුණා | පාපුණි | පාපුණී | පාපීය | පාපෙ |
| යැවීම | හි | පහිණා | පහිණි | පහිණී | පහීය | පාහෙ |
| හැකිවීම | සක | සක්කුණා | අසක්කි | සක්ඛි | සක්ක | සක්කාපෙ |

ඇතැම් තන්හි "සු" ධාතුවෙන් 'සුණයි, සුණථ" යනාදි ක්‍රියාරූප ද සිඩයි. "අප, හි" යන ධාතුදෙකෙන් පූර්වයෙහි "ප" උපසර්ගය යෙදීමෙන් "පාපුණා, පහිණා" යනාදිය

සිඩයි. "අසුණි, අසක්ඛි" යන ධාතු විකෘති දෙක "සුණි, සක්ඛි" කියා ද යෙදේ. "සක" ධාතුව අකර්මක බැවින් එහි "සක්ක" යන ධාතු විකෘතියෙන් "සක්කතෙ" යනාදි වශයෙන් භාව යෙහි ක්‍රියාරූප යෙදෙත්.

දූතස්ස විපාකං ඤාතාරො දූතං දාතුං විහාරං පාපුණිංසු (දූතයාගේ විපාක දන්නෝ දන් දෙන්නට විහාරයට පැමිණියාහ).

විහාරෙ භික්ඛූනං නෙතා ධම්මස්ස වත්තා මහාථෙරො තෙ ධම්මං සාවෙසි (විහාරයෙහි භික්ෂූන්ට නායකවූ ධර්මය කියන්නාවූ මහාස්ථවිරතෙමේ ඔවුන් ලවා දහම් ඇස්විය)

පුඤ්ඤස්ස කත්තාරෙහි සත්ථුස්ස ධම්මො සූයතෙ (පින් කරන්නවුන් විසින් ශාස්තෘවරයන් වහන්සේගේ ධර්මය අසනු ලැබේ;

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|
| පහිය | පාපුණි | පාපෙ | සූය |
| අම්හ | ජන | ධම්ම | ඤාතු |
| පිතු | හිත | වත්තු | ධම්ම |
| දූත | කත්තු | අඤ්ඤ | වචන |
| විහාර | සුඛ | සුඛ | පිතු |

මෙහි මුලින් තිබෙන ධාතුවිකෘති ක්‍රියාපද කොට ඒ යට තිබෙන නාම වාක්‍යයන්ට යොග්‍ය පරිද්දෙන් විභක්ත්‍යන්ත කිරීමෙන් සරසට ලියනු.

30 පාඩම.

## උකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාම.

| පාළි. | අර්ථ. | පාළි. | අර්ථ. | පාළි. | අර්ථ. |
|---|---|---|---|---|---|
| යාගු | කැඳ | දද්දු | දද | මාතු | මව් |
| ධාතු | ධා | කණ්ඩු | කැසුම් | ධීතු | දූ |
| ධෙනු | දෙන් | කච්ඡු | කුෂ්ඨයක් | දුහිතු | ,, |
| කාසු | වළ | රජ්ජු | රැහැන් | කණෙරු | ඇතිනී |

| අන්තොච්චාරණය. | | විභක්තිරූප, | |
|---|---|---|---|
| **එක** | **බහු** | **එක** | **බහු** |
| ප- උ | ඌ, උයො | යාගු, | යාගූ, යාගුයො |
| ආ- " | " " | " | " " |
| දු- උං | " " | යාගුං | " " |
| ත- උයා | ඌභි, ඌහි | යාගුයා | යාගූභි, යාගූහි |
| ච- උයා | ඌනං | යාගුයා | යාගූනං |
| ප- උයා | ඌභි, ඌහි | යාගුයා | යාගූභි, යාගූහි |
| ඡ- උයා | ඌනං | යාගුයා | යාගූනං |
| ස- උයං, උයා | උසු; ඌසු | යාගුයං, යාගුයා | යාගුසු, යාගූසු |

“මාතු, ධීතු, දුහිතු” ශබ්දයන්ගේ විභක්තිරූප “පිතු” ශබ්දයෙහි මෙනි. චතුර්ථි ෂෂ්ඨී එකවචනයෙහි ‘‘මාතුයා ධීතුයා දුහිතුයා” කියාද වේ.

## උකාරාන්ත නපුංසකලිඞ්ග නාම,

| පාලි | අර්ථ. | පාලි | අර්ථ. | පාලි. | අර්ථ. | පාලි. | අර්ථ |
|---|---|---|---|---|---|---|---|
| ආයු | ආයුෂ | ධනු | දුනු | ජතු | ලහ | මධු | මී |
| චක්ඛු | ඇස් | දාරු | දර | ජම්බු | දඹ | සිඞ්ගු | සුගු |
| වසු | ධන | තිපු | ඊයම් | අස්සු | කඳුළු | වත්ථු | වස්තු |

මෙහි පුංලිඞ්ග උකාරාන්ත නාමයන්ගේ විභක්තිරූප යන්ට වඩා විශෙෂරූප පමණක් දක්වනු ලැබෙත්.

| අන්තොච්චාරණය | | විභක්තිරූප | |
|---|---|---|---|
| **එක** | **බහු** | **එක** | **බහු** |
| ප-උ | ඌ, ඌනි | ආයු | ආයූ, ආයූනි |
| ආ-" | " " | " | " " |
| දු-උං | " " | ආයුං | " " |

සෙසු රූප භික්ඛු” ශබ්දයාගේ මෙන් දතයුතුයි. ‘ආයු’ ශබ්දයාගේ තතියා පචමී එක වචනයන්හි “ආයුසා” කියාද වේ.

## ක්‍රියාදිගණයෙහි ධාතු

මෙහි විකරණය "නා" යනුයි. "ගහ" ධාතුවෙන් "ණ්හා" යනු ද වේ.

| අර්‍ථ | ධාතු | වර්‍තමාන | අතීත | අනා; | කම්ම: | පයොජ්ජ |
|---|---|---|---|---|---|---|
| බඩුගැණීම | කී | කිණා | අකිණි | කිණි | කීය | කයාපෙ |
| දිනීම | ජි | ජිනා | අජිනි | ජිනි | ජීය | ජයාපෙ |
| රැස්කිරීම | චි | චිනා | අචිනි | චිනි | චීය | චයාපෙ |
| දැනීම | ඤා | ජානා | අජානි / අඤාසි | ජානි | ඤාය | ඤාපෙ |
| ගැණීම | ගහ | ගණ්හා | අගණ්හි | ගණ්හ | ගය්හ | ගාහෙ |

"වි' පූර්‍ව "කී" ධාතුවෙන් විකිණීම යන අර්‍ථය ලැබේ. "විකක්ණාති" ආදිවශයෙනි. "පරා" පූර්‍ව "ජි" ධාතුවෙන් පැරදීම යන අර්‍ථය ද, "අව" පූර්‍ව "ඤා" ධාතුවෙන් නිඥාව යන අර්‍ථයද, "අනු" පූර්‍ව "ඤා" ධාතුවෙන් අනුමතකිරීම (අවසරදීම) යන අර්‍ථයද, "පති, (පටි) පූර්‍ව "ඤා" ධාතුවෙන් නියොගකිරීම යන අර්‍ථයද, "සං" පූර්‍ව "ඤා" ධාතුවෙන් හැඳිනීම යන අර්‍ථයද "අනු, සං, පති" යන උපසර්ග පූර්‍ව 'ගහ" ධාතුවෙන් අනුග්‍රහ සඞ්ග්‍රහ ප්‍රතිග්‍රහ (පිළිගැණීම) යන අර්‍ථද "උ" පූර්‍ව "ගහ" ධාතුවෙන් ඉගෙණීම යන අර්‍ථ යද ලැබේ.

මෙහි "කිණා" යන තන්හි "නා" යන්නට මූර්ධන්‍ය "ණ" යන්නයි.

මැතියනි, පියානෙනි, තමුන්නාන්සේලා මට පැවිදි වෙන්නට අවසර දෙනු මැනවි.

මම පැවිදිව ධර්මය ඉගෙණ ගන්නෙමි.

හිතවත් මවුපියෝ දරුවන්ට යහපත් ධර්මයද ශාස්ත්‍රයද උගන්වත්.

ඇතැම් මවුපියෝ දරුවන්ට උගන්වන්නට තමන්ගේ ආභරණ ද විකුණත්,

මේ වාක්‍යයෝ පාළියට පෙරළිය යුතුයි.

පැවිදිවෙන්නට--පබ්බජිතුං, පැවිදි වී-පබ්බජිත්වා, හිත වත්-හිතවන්ත, මවුපිය-මාතාපිතු, දරු-දාරක, ශාස්ත්‍ර-සත්‍ථ ඇතැම්-එකච්ච, උගන්වන්නට-උග්ගණ්හාපෙතුං.

31, පාඩම.

## ඌකාරාන්තපුල්ලිඞ්ගනාම.

| පාළි | අර්ථ | පාළි | අර්ථ |
|---|---|---|---|
| අභිභූ | මැඩලන්නා | සබ්බඤ්ඤු | සියල්ලදන්නා |
| සයම්භූ | බ්‍රහ්මයා | ධම්මඤ්ඤු | ධර්මය දන්නා |

| අනෙකාච්චාරණය. | | විභත්තිරූප. | |
|---|---|---|---|
| එක | බහු | එක | බහු |
| ප-ඌ | ඌ, ඌවො | අභිභූ | අභිභූ, අභිභුවො |
| ආ-, | ,, ,, | ,, | ,, ,, |
| දු-ඌං | ,, ,, | අභිභුං | ,, ,, |

සෙසු විභත්ති රූප උකාරාන්ත "භික්ඛු" ශබ්දයෙහි මෙන් යොදා ගතයුතුයි. "අභිභුනා" ආදි වශයෙනි. "සබ්බඤ්ඤු" ආදීන්ගේ වනාහි "වො" යන්නෙන් අන්‍යවූ රූපයක් නැත්තේයි. ඒ "සබ්බඤ්ඤුනො" යන ආදි වශයෙනි. සෙසු රූප "අභිභූ" ශබ්දයේ මෙනි.

## ඌකාරාන්ත ස්ත්‍රීලිඞ්ග නාම.

"ජම්බු (දඹ) වධූ (භාර්‍ය්‍යා) චමූ (පෘතිවි)" යන මේ ආදි නාමයෝ ඌකාරාන්ත ස්ත්‍රීලිඞ්ග වෙත්. මොවුන්ගේ ප්‍රථමා එකවචන "ජම්බු" ආදි වශයෙනි. සෙසු රූප "යාගු" ශබ්දයාගේ මෙන් දතයුතුයි.

## ඌකාරන්ත නපුංසකලිඞ්ග නාම.

ඌකාරාන්ත පුංලිඞ්ගවූ "අභිභූ" ආදිය නපුංසක ලිඞ්ග ද වේ. විභත්ති රූප උකාරාන්ත නපුංසක ලිඞ්ගයන්ගේ මෙනි. "අභිභු අභිභූ-අභිභූනි" යනාදි වශයෙනි.

## තනාදිගණයෙහි ධාතු.

මෙහි විකරණය "ඔ" යනුයි. "කර" ධාතුවෙන් "යිර" යනුද වේ.

## ධාතු විකෘති.

| අර්ථ | ධාතු | ව:මාන | අතීත | අනා: | කම්ම: | පයොජ්ජ |
|---|---|---|---|---|---|---|
| විස්තරය | තනු | තනො | අතනි | තනි | තාය | තානෙ |
| කිරීම | කර | කරො-<br>කයිර | අකරි<br>අකාසි | කර | කරීය | කාරෙ |

## ආගම සන්ධි.

## 25. යවමදනතරළයන් ආගම වීමෙන් සන්ධිවිධි අටෙකි.

ය-යථා=එව-යථායෙව, පරි=අන්තං-පරියන්තං

ව-භූ=ආදයො=භූවාදයො, ති-අඞ්ගුලං-තිවඞ්ගුලං

ම-ඉධ=ආහු-ඉධමාහු, හොතු=එව-හොතුමෙව

ද-උ=අග්ගො-උදග්ගො. උ=අයො-උදයො

න-ඉතො=ආයති-ඉතොනායති

ත-තස්මා=ඉහ-තස්මාතිහ, අජ්ජ-අග්ගෙ-අජ්ජතග්ගෙ

ර-නි=අන්තරං-නිරන්තරං, නි=ආලයො-නිරාලයො.

ළ-ඡ=අභිඤ්ඤා-ඡළභිඤ්ඤා, ඡ=අඞ්ගං-ඡළඞ්ගං.

ලොකයෙහි කෙළෙහි ගුණ දන්නාවූ මිනිස්සු දුර්ලභ වෙත්.

ඔවුන් විසින් වනාහි උපකාර කළවුන්ට අධික උපකාර කරණු ලැබෙත්.

යමෙක් කෙළෙහි ගුණ දන්නෙක් වේ නම් හෙතෙමේ සත්පුරුෂයෙක් වේ. කෙළෙහිගුණ නොදන්නා අසත් පුරුෂයායි.

සියල්ලන් විසින් මවුපියෝද ගුරුවරුද නිතර උවටන් කටයුතුයි. එයින් ඔවුහු සවර්ගයට පැමිණෙත්.
මෙ වාක්‍යයෝ පාළියට පෙරළිය යුතුයි.

කෙළෙහි ගුණ දන්න-කතඤ්ඤු, දුර්ලභ-දුල්ලභ, වනාහි-පන, උපකාරකළ-කතුපකාර, ගුරුවරු-ආචරිය, උවටන් කටයුතු-උපඨාතබ්බ.

## 32 පාඩම.

### ඔකාරාන්ත "ගො" ශබ්දය.

| එක | බහු |
|---|---|
| **ප**-ගො | ගාවො-ගවො |
| **ආ**- " | " " |
| **දු**-ගාවුං-ගාවං, ගවං | " " |
| **ත**-ගාවෙන-ගවෙන | ගොහි-ගොභි |
| **ච**-ගාවස්ස-ගවස්ස | ගවං, ගුන්නං ගොනං |
| **ප**-ගාවා, ගවා, ගාවම්හා, ගවම්හා, ගාවස්මා ගවස්මා | -ගොහි, ගොභි |
| **ඡ**-ගාවස්ස, ගවස්ස | ගවං, ගුන්නං, ගොනං |
| **ස**-ගාවෙ, ගවෙ, ගාවම්හි, අවම්හි, ගාවස්මිං-ගවස්මිං | ගවෙසු, ගාවෙසු, ගොසු |

මේ විභත්තිරූප පුංලිඞ්ග ස්ත්‍රීලිඞ්ග දෙකටම සමවෙත්. නපුංසක ලිඞ්ගයෙහි “චිත්තගො” ආදි ඇතැම් නාමයෝ සිද්ධයි. විභත්තිරූප සිද්ධියෙහිදී ඒ නාමයෝ “චිත්තගු” ආදි වශයෙන් උකාරාන්ත වේත්. එහි විභත්තිරූප “ආයු” ශබ්දයේ මෙනි.

## චුරාදිගණයෙහි ධාතු.

මෙහි විකරණ “ණෙ, ණය” යනුයි.

### ධාතු විකෘති.

| අර්ථ | ධාතු | වත්ත-මානා | අතීත | අනා-ගත | කම්ම | පයොජ්ජ |
|---|---|---|---|---|---|---|
| සොරා: | චුර | චොරෙ | අචොරයි | චොරෙ | චොරීය | චොරාපෙ |
| සිතීම | චින්ත | චින්තෙ | අචින්තයි | චින්තයි | චින්තීය | චින්තාපෙ |
| රැකීම | පාල | පාලෙ | අපාලයි | පාලෙ | පාලීය | පාලාපෙ |
| දැනීම | වීද | වෙදෙ | අවෙදයි | වෙදෙ | වෙදීය | වෙදාපෙ |
| ගිණීම | ගණ | ගණෙ | අගණයි | ගණෙ | ගණීය | ගණාපෙ |

මෙහි “ණය” ප්‍රත්‍යය යෙදීමෙන් “චොරය” ආදි වශයෙන් ද, ප්‍රයොජ්‍ය විෂයෙහි “ණා” ප්‍රත්‍යය යෙදීමෙන් “චොරාපය” ආදි වශයෙන් ද ධාතුවිකෘති සිද්ධයි. තවත් අතීතයෙහි “චොරෙසි” යනාදි ක්‍රියාරූප ද සිද්ධයි.

## ද්විරුක්තසන්ධි.

පාළියෙහි වර්ණයන් පිළිබඳ ද්විරුක්තවිධිය සංස්කෘත ශබ්දානුසාරයෙන් දැනගැනීම සුකර වේ. සංස්කෘත ශබ්දයන්ගේ ආදියෙහිවූ සංයොගයෝ පාළිශබ්ද විෂයෙහි නැත්තාහ. පාළියෙහි වූ ඒ ශබ්දයන්ගේ ආදි වර්ණය හ්‍රස්වස්වරයකින් පරව සිටි බොහෝ තැන්හි ද්විත්වයට පැමිණේ. ඒ මෙසේ යි:-

| සංස්කෘත | පාළි | ද්විත්ව |
|---|---|---|
| ප්‍රමාද | පමාද | අ=පමාදො=අප්පමාදො |
| ග්‍රහ | ගහ | ප=ගහො=පග්ගහො. |

| | | |
|---|---|---|
| ස්වර | සර | වි=සරෙ=විස්සරෙ |
| ත්‍යාග | චාග | පරි=චාගො=පරිච්චාගො |
| ප්‍රධාන | පධාන | ස=පධානො=සප්පධානො |

යන ආදි වශයෙනි. එසේම සංස්කෘතයෙහි ව්‍යඤ්ජනාන්ත ශබ්ද පාළියෙහි ස්වරාන්ත වෙත්. එබඳු ශබ්ද කෙරෙන් පර වර්ණයද විත්වයට පැමිණේ. ඒ මෙසේයි:-

| සංස්කෘත | පාළි | මිශ්‍ර |
|---|---|---|
| නිර් | නි | නි=ගතො-නිග්ගතො |
| දුර් | දු | දු=ලභො-දුල්ලභො |
| උත් | උ | උ=ගතො-උග්ගතො |
| සත් | ස | ස=කාරෙ-සක්කාරෙ |
| චතුර් | චතු | චතු=දිසා-චතුද්දිසා |
| ෂෂ් | ඡ | ඡ=වස්සානි-ඡබ්බස්සානි |
| මහත් | මහ | මහ=බලං-මහබ්බලං |

යන ආදි වශයෙනි. තවද එබඳු තන්හි ශබ්දයාගේ ආදි වර්ණය මහප්‍රාණ වූ "ඛ ඝ" ආදි වර්ණයක් වූ තන්හි විත්ව වශයෙන් පැමිණෙන්නේ එහි අල්පප්‍රාණ "ක, ග" ආදි යයි. ඒ මෙසේයි:-

"උ=ඛෙපො—උක්ඛෙපො, උ=ඝොසො—උග්ඝොසො, නි=ධනො-නිද්ධනො" ආදී වශයෙනි.

| පාලෙ-පාලිය | අචිනතයි-අචිනතාපයි. | අචිනතාපීයි. |
|---|---|---|
| දස | උපාසක | භික්ඛු |
| සාමි | බුද්ධ | උපාසක |
| භාණ්ඩ | ධම්ම | ධම්ම |

මෙහි තිබෙන ධාතු විකෘති ක්‍රියාපදයන් කොට ඒ යට තිබෙන නාමයන් හා යොදා අර්ථවත් වාක්‍ය පසක් සම්පාදනය කටයුතුයි.

33 පාඩම.

### ආඛ්‍යාතභෙද.

ආඛ්‍යාතයෙහි ඉච්ඡාර්‍ථක්‍රියා යි කොටසක් ද, නාමධාතුක ක්‍රියා යි කොටසක් ද දක්නාලැබේ. ඔවුන්ගේ සිද්ධියෙහි ධාතු විශෙෂ හා ප්‍රත්‍යය විශෙෂයෝ ද මෙසේ දතයුතුයි.

## 26. භුජඝසහරසුපාදියෙන් ඉච්ඡාර්‍ථයෙහි ඛඡස විහිතයි.

"තුං" ප්‍රත්‍යයෙන් යුක්තවූ "භුජ ඝස හර සු පා" ආදි ධාතු කෙරෙන් ඉච්ඡාර්‍ථයෙහි "ඛ ඡ ස" යන ප්‍රත්‍යයෝ වෙත්. මේ ප්‍රත්‍යයන් වීමෙන් සිඬ ධාතුවිකෘති මෙහි දක්වනු ලැබෙත්. ඔවුන් කෙරෙන් "ති" ආදිය යොදා ක්‍රියාරූප නිපදවා ගතයුතුයි.

| අර්‍ථ | ධාතු | වාක්‍ය | | ප: වි: ධා: | ක්‍රියා |
|---|---|---|---|---|---|
| බුදීම | භුජ | භොත්තුං | ඉච්ඡති -ඛ- | බුභුක්ඛ | - බුභුක්ඛති |
| කෑම | ඝස | ඝසිතුං | ,, -ඡ- | ජිඝච්ඡ | - ජිඝච්ඡති |
| හැරීම | හර | හරිතුං | ,, -ස- | ජිගිංස | - ජිගිංසති |
| ඇසීම | සු | සොතුං | ,, -ස- | සුස්සූස | - සුස්සූසති |
| බීම | පා | පාතුං | ,, -ස- | පිවාස | - පිවාසති |

බුභුක්ඛති අනුභව කරන්නට කැමැති වේ. ජිඝච්ඡති, කන්නට කැමැතිවේ. ජිගිංසති, හරින්නට කැමැති වේ. සුස්සූසති, අසන්නට කැමැති වේ. පිවාසති, බොන්නට කැමැති වේ. යනු මේ ක්‍රියාවන්ගේ අර්‍ථයි.

මේ ධාතුවිකෘති කෙරෙන් ප්‍රයොජ්‍යප්‍රත්‍යයන් වීමෙන් "බුභුක්ඛෙති" ආදි වශයෙන් ද "තු" ආදි විභක්තිප්‍රත්‍යයන් වීමෙන් 'බුභුක්ඛතු' ආදි වශයෙන් ද, කම්කාරකයෙහි "බුභුක්ඛීයති' ආදි වශයෙන් ද, කිතකයෙහි ප්‍රත්‍යයන් වීමෙන් "බුභුක්ඛන්ත" ආදි වශයෙන් ද සිඬයි. භාෂානු ඝාරයෙන් දතයුතුයි.

ඇතැම් ධාතු කෙරෙන් ඉච්ඡාර්ථයෙන් තොරව ස්වාර්ථයෙහි ද මේ "ඛ" ආදි ප්‍රත්‍යයන් යෙදීමෙන් සිද්ධ පදයෝ ද වෙත්. ඒ මෙසේයි: -

| අර්ථ | ධාතු | ප: | ධා: විකෘති | ක්‍රියා |
|---|---|---|---|---|
| ඉවසීම<br>තියුණුකිරීම | තිජ | -ඛ- | තිතික්ඛ | තිතික්ඛති |
| පිළිකුල්කිරීම | ගුප | -ඡ- | ජිගුච්ඡ | ජිගුච්ඡති |
| පිළියම්කිරීම | කිත | -ඡ- | තිකිච්ඡ | තිකිච්ඡති |
| විමසීම | මාන | -ස- | වීමංස | වීමංසති |

මේ ධාතුවිකෘති ද ප්‍රයෝජ්‍යාදියෙහි යොදාගත යුතුයි.

### නාමධාතුකක්‍රියා

## 27. ආචරණක්‍රියාවෙහි කර්තෘ කර්මයන්ට උපමානවූ නාමයා කෙරෙන් ආය ඊය ප්‍රත්‍යයෝ විහිතයි.

'ආචරති" යන ආදි ආචරණක්‍රියාවකට කර්තෘ වූ පදයට යම් නාමපදයක් උපමා වීනම් ඒ නාමපදයා කෙරෙන් "ආය" ප්‍රත්‍යය ද, යම් නාමපදයක් කර්මයට උපමා වීනම් ඒ නාමපදයා කෙරෙන් "ඊය" ප්‍රත්‍යය ද වේ.

'භික්ඛු පබ්බතො ඉව ආචරති" යන තන්හි "භික්ඛු" යනු "ආචරති" යන ක්‍රියාවෙහි කර්තෘපදයයි. "පබ්බතො" යනු එහි උපමාපදයි. එහෙයින් ඒ "පබ්බත" යන නාමයා කෙරෙන් "ආය" ප්‍රත්‍යය වීමෙන් "පබ්බතාය" සිද්ධයි. පසුව එය ධාතුවක් මෙන් සලකා ඉන් පරව "ති" ආදිය යෙදීමෙන් "පබ්බතායති" ආදිය සිද්ධයි. එකල්හි "භික්ඛු පබ්බතායති" (භික්ෂු තෙමේ පර්වතයක් මෙන් හැසිරේ හෙවත් පර්වතයක් වැනි වේ.) යන ආදි වශයෙන් යෙදේ.

"අචරියො සිස්සං පුත්තං ඉව ආචරති" (ආචාර්‍ය්‍යී තෙමේ ශිෂ්‍යයා පුතෙකු මෙන් කෙරේ) යන තන්හි 'සිස්සං" යන පදය 'ආචරති' යන ක්‍රියාවෙහි කර්මයි, "පුත්තං" යනු එහි උපමාපදයි. එබැවින් එහි 'පුත්ත" යන නාමයා කෙරෙන් "ඊය" ප්‍රත්‍යය වීමෙන් "පුත්තීය" යි සිඬයි. ඉන් පරව "ති" ආදිය වීමෙන් "පුත්තීයති" ආදිය සිඬයි. එකල පූර්‍වොක්ත වාක්‍යය "ආචරියො සිස්සං පුත්තීයති" කියා යෙදේ. මෙසේ ඒ ඒ තන්හි උවමනා පරිද්දෙන් අර්‍ථ සලකා නාමයන් ගෙන් ද ක්‍රියා සම්පාදනය කරගතයුතුයි. මේ පදයෝ ද පෙර මෙන් ප්‍රයොජ්‍යාදියෙහි ද යොදගතයුතුයි.

තවද "ඊය" ප්‍රත්‍යය ඉච්ඡාර්‍ථයෙහි ද යෙදේ. "සො පුරිසො ධනං ඉච්ඡති. (ඒ පුරුෂ තෙමේ ධනය කැමැති වේ.) මෙහි "ධන" ශබ්දයා කෙරෙන් "ඊය" ප්‍රත්‍යය වේ. එකල "ධනීය" යනු වේ ඉන් පරව "ති"ආදිය යෙදීමෙන් "පුරිසො ධනීයති' යන ආදිය වේ.

යහපත් ශිෂ්‍යයෝ වැඩිහිටියන්ගේ අවවාදය අසන් නට කැමැති වෙත්.

පවසින් පෙළෙනෝ කවර ජලයක් වුවත් බොන්නට කැමති වෙත්.

පවස් නැත්තෝ යහපත් ජලය ද පිළිකුල් කෙරෙත්.

මතු දියුණුව බලාපොරොත්තුවන්නවුන් විසින් ගුරු වදන් අසන්නට කැමතිවනු ලැබෙත්.

ඒ මිනිහා නිශ්චලත්‍වයෙන් මෙර වැනි වේ.

ශාස්ත්‍රයන් දන්නෝ ශාස්ත්‍රයන් කැමති වෙත්,

මේ වාක්‍යයෝ පාළියෙන් ලිවිය යුතුයි

34 පාඩම.

## කිතකනාම.

# 28 ධාතු ප්‍රත්‍යය සම්බන්ධයෙන් ෂට්කාර කාර්‍යයෙහි හා භාවයෙහි වූවෝ කිතකයෝයි.

භාෂාවෙහි වූ අර්ථවත් නාමයෝ ධාතු ප්‍රත්‍යය සම්බන්ධයෙන් “කත්තු, කම්ම, කරණ, සම්පදාන, අපාදාන, ආධාර” යන කාරකාර්ථ සය හා භාවාර්ථය ඇසුරුකොට සිද්ධවූවෝ වෙත්. ඔවුහු “කිතක” යන නමින් ව්‍යවහාර කරණුලැබෙත්. (ඉන් කොටසකට “උණාදි” යන විශෙෂ නාමයක්ද කියත්.) ඔවුන්ගේ සිද්ධියට හෙතුවූ ප්‍රත්‍යය භෙදයෝ බොහෝ වෙත්. මෙහි කිතකයෙහි තත්ත්වය ප්‍රකාශකිරීම සඳහා ඉන් ස්වල්පයක් දක්වනු ලැබේ. එහිදු කාරකාර්ථයන් දැනගැණීම නාමයන්ගේ තත්ත්වාර්ථාවබොධයට ඉවහල් වන බැවින් පළමුකොට කාරකාර්ථයන්ගේ හා භාවාර්ථයෙහි තත්ත්වය ප්‍රකාශකරණුලැබේ.

### කාරකාර්ථ.

**කත්තුකාරකය-** යම් නාමයකින් ඊට මුල්වූ ධාත්වර්ථයාගේ සිද්ධියෙහි කර්තෘත්වය සිද්ධකරණ ද්‍රව්‍යාදියක් උක්තවේ නම් (කියවේ නම්) ඒ නාමය කත්තුකාරක නම් වේ. “සත්ථු” ආදි වශයෙනි. “සත්ථු” නම් “සාස” ධාතුවේ අර්ථය වූ අනුශාසනය සිද්ධ කරන්නෙකි.

**කම්මකාරකය-** යම් නාමයකින් කර්තෘ සිද්ධකරන්නාවූ ධාත්වර්ථය ලබන (විඳින) ද්‍රව්‍යාදියක් උක්ත වේ නම් ඒ නාමය කම්මකාරක නම් වේ. “සිස්ස” ආදි වශයෙනි. “සිස්ස” නම් “සාස” ධාතුවේ අර්ථයවූ අනුශාසනය ලබන්නෙකි.

**කරණකාරකය**- යම් නාමයකින් ධාත්වර්ථයාගේ සිඩියට ඉවහල්වූ ද්‍රව්‍යාදියක් උක්ත වේ නම් ඒ නාමය කරණකාරක නම් වේ. "සත්‍ථ" ආදි වශයෙනි. "සත්‍ථ" නම් යථෝක්ත අනුශාසනයට ඉවහල්වූවකි. (ශාස්ත්‍රයයි)

**සම්පදාන කාරකය**-යම් නාමයකින් ධාත්වර්ථය පිළිගැණීමට යොග්‍යවූ ද්‍රව්‍යාදියක් උක්ත වේ නම් ඒ නාමය සම්පදාන කාරක නම් වේ. "සම්පදාන" ආදි වශයෙනි. "සම්පදාන" නම් "දා" ධාතුවේ අර්ථයවූ දානය පිළිගැණීමට යොග්‍ය වූවකි.

**අපාදාන කාරකය**- යම් නාමයකින් ධාත්වර්ථයට ඉම්වූ ද්‍රව්‍යාදියක් උක්ත වේ නම් ඒ නාමය අපාදාන කාරක නම් වේ. "භීම" ආදි වශයෙනි, "භීම" නම් "භී" ධාතුවේ අර්ථයවූ බියට ඉම්වූවෙකි. (රාක්ෂසයි)

**ආධාරකාරකය**- යම් නාමයකින් ධාත්වර්ථය පිහිටීමට ඉඩඇති ද්‍රව්‍යාදියක් උක්ත වේ නම් ඒ නාමය ආධාරකාරක නම් වේ. "ආසන" ආදි වශයෙනි. "ආසන" නම් "ආස" ධාතුවේ අර්ථයවූ උපවේශනයට ඉඩ ඇති ස්ථානයෙකි

**භාවය**- යම් නාමයකින් ධාත්වර්ථ මාත්‍රයම මූත් යම් කිසි ද්‍රව්‍යාදියක් උක්ත නොවේ නම් ඒ නාමය භාව නම් වේ. "අනුසිඪි" ආදි වශයෙනි. "අනුසිඪි" නම් "සාස" ධාතුවේ අර්ථමාත්‍රයයි. (අනුශාසනයයි).

භාෂාවෙහි වූ සියලු නාමයෝම මේ අර්ථ සතෙහි ඇතුළත් වූවෝ වෙත්. එහිදු ඇතැම් නාමයෝ මේ සතෙන් එක් අර්ථයෙක්හි වූවෝද, ඇතැම් නාමයෝ අර්ථ කීපයෙක්හි වූවෝද, වෙත්.

මෙහි කිතක හෙද සියල්ලම නොව ක්‍රියාවාචක කිතක හෙද කීපයක් දක්වනු ලැබෙත්. වාක්‍යයන් ගැළපීමට ක්‍රියාවාචක කිතක උවමනා බැවිනි.

35. පාඩම

# 29 තබ්බ අනීය ත තවන්තු තාවී අන්ත මාන තු ප්‍රත්‍යයාන්තයෝ ක්‍රියාවාචක කිතකයෝයි.

මේ "තබ්බ" ආදි ප්‍රත්‍යය අටෙන් නිපන් නාමයෝද ක්‍රියාවාචක කිතක නම් වෙත්. (සිංහලෙහි "අරුත්කිරිය හව්කිරිය" යන නම් දෙකෙන් ව්‍යවහාරප්‍රාප්තවූවෝ මොහු වෙත්).

## මේ ප්‍රත්‍යයන්ගේ කාරක භෙද

"තබ්බ-අනීය" දෙක සකර්මක ධාතු කෙරෙන් කම්මකාරකයෙහිද, අකර්මක ධාතු කෙරෙන් භාවයෙහිද වේ. "ත" ප්‍රත්‍යය සකර්මක ධාතු කෙරෙන් කම්මකාරකයෙහි හා භාවයෙහිද, අකර්මක ධාතු කෙරෙන් හා ගමනාර්ථ අවබොධාර්ථාදි ඇතැම් සකර්මක ධාතු කෙරෙන් කත්තෘකාරකයෙහිද වේ. අකර්මක ධාතු කෙරෙන් භාවයෙහිද වේ. 'තවන්තු තාවී-අන්ත තු' යන සතර සියලු ධාතුන්කෙරෙන් කත්තෘ කාරකයෙහි වේ. "මාන" ප්‍රත්‍යය සකර්මක ධාතු කෙරෙන් කත්තෘ කාරකයෙහි හා භාවයෙහිද වේ.

## කාලභෙදය

"තබ්බ-අනීය-තු" ප්‍රත්‍යයාන්තයෝ ත්‍රිකාලික වෙත්. "ත-තවන්තු-තාවී" ප්‍රත්‍යයාන්තයෝ අතීතකාලිකවූවෝද, 'අන්ත-මාන" ප්‍රත්‍යයාන්තයෝ වර්තමාන කාලික වූවෝද වෙත්. බුද්ධි පූජාදි අර්ථයන්හි පවත්නා ඇතැම් ධාතුන්ගෙන් සිද්ධ "ත" ප්‍රත්‍යයාන්තයෝ වර්තමාන කාලිකද වෙත්.

## ලිඞ්ගභෙද.

මේ ප්‍රත්‍යයන්ගෙන් කත්තෘ කම්මකාරක දෙක්හි නිපන් නාමයෝ ත්‍රිලිඞ්ගවූවෝ ද භාවයෙහි නිපන්නෝ නපුංසක ලිඞ්ගවූවෝ ද වෙත්.

### උදාහරණ

**ප්‍රත්‍යය** — **අර්ථ**

**කම්මතබ්බ**-කාතබ්බං පුඤ්ඤං සබ්බෙහි. (සියල්ලන් විසින් පින් කටයුතුයි)

**භාව ,,** -සයිතබ්බං තයා මඤ්චෙ. (තාවිසින් ඇඳෙහි ශයනය කටයුතුයි)

**කම්ම ත** -භාසිතො බුද්ධෙන ධම්මො. (බුදුන් විසින් ධර්මය වදාරණලදී)

**කත්තෘ ත** -ගතො සො ගාමං (හෙතෙමේ ගමට ගියේය)

**,, ,,** -සයිතො සො මඤ්චෙ (හෙතෙමේ ඇඳෙහි ශයනය කෙළේයි)

**භාව ත** -තෙන (තස්ස) ගතං තස්මිං (එහි ඔහුගේ යාමයි)

**,, ,,** ඨිතං තෙන තස්මිං (එහි ඔහුගේ සිටීමයි)

**තවන්තු-තාවී** බුද්ධො ලොකස්ස සුඛං කතවා (කතාවී) බුදුරජතෙමේ ලොකයාට සුවකළසේක)

**අන්ත-මාන** -බාලො හසන්තො (හසමානො) භාසති (බාලයා සිනහසෙමින් කථාකෙරේ)

**,, ,,** පුරිසො කම්මං කරොන්තො (කුරුමානො) තිඨති (පුරුෂයා කම්කරමින් සිටී)

**භාව-මාන** -තෙන තස්මිං භූයමානං (ඔහු විසින් එහි සිටීමයි)

**තෘ** -සො පුඤ්ඤස්ස කත්තා භවති (හෙතෙමේ පින් කරන්නේ වේ.)

## 36 පාඩම.

### කිතක උදාහරණ.

| අර්ථ | ධාතු | තබ්බ | ත | අනත | තු |
|---|---|---|---|---|---|
| වීම | භූ | භවිතබ්බ | භූත | භවන්ත | භවිතු |
| සිටීම | ඨා | ඨාතබ්බ | ඨිත | තිඨන්ත | ඨාතු |
| හොවීම- | සි | සයිතබ්බ | සයිත | සයන්ත | සයිතු |
| විසීම | වස | වසිතබ්බ | වුත්ථ | වසන්ත | වසිතු |
| හිඳීම | සද | නිසීදිතබ්බ | නිසින්න | නිසීදන්ත | නිසීදිතු |
| කිරීම | කර | කාතබ්බ | කත | කරොන්ත | කාතු |
| යාම | ගම | ගන්තබ්බ | ගත | ගච්ඡන්ත | ගන්තු |
| කීම | භාස | භාසිතබ්බ | භාසිත | භාසන්ත | භාසිතු |
| ඇසීම | සු | සොතබ්බ | සුත | සුණන්ත | සොතු |
| ගැනීම- | ගහ | ගහෙතබ්බ | ගහිත | ගණ්හන්ත | ගහිතු |
| දැනීම | ඤා | ඤාතබ්බ | ඤාත | ජානන්ත | ඤාතු |
| පිදීම | පූජ | පූජිතබ්බ | පූජිත | පූජෙන්ත | පූජිතු |
| කැපීම | ඡිද | ඡින්දිතබ්බ | ඡින්න | ඡින්දන්ත | ඡින්දිතු |
| වැසීම | ඡාද | ඡාදිතබ්බ | ඡන්න | ඡාදෙන්ත | ඡාදිතු |
| නැවතීම | ආස | ආසිතබ්බ | ආසීන | ආසන්ත | ආසිතු |
| වැමෑරීම- | වම | වමිතබ්බ | වන්ත | වමන්ත | වමිතු |
| ලැබීම | ලභ | ලභිතබ්බ | ලද්ධ | ලභන්ත | ලභිතු |
| දීම | දා | දාතබ්බ | දින්න | දදන්ත | දාතු |
| බීම | පා | පාතබ්බ | පීත | පිවන්ත | පාතු |
| පිසීම | පච | පචිතබ්බ | පක්ක | පචන්ත | පචිතු |
| බුදීම | භුජ | භුජිතබ්බ | භුත්ත | භුජන්ත | භුජිතු |

මෙහි 'අනීය ප්‍රත්‍යය යෙදීමෙන් "භවනීය, ඨානීය" ආදිය ද, "තවන්තු තාවී" ප්‍රත්‍යයන් යෙදීමෙන් "භූතවන්තු-භූතාවී, ඨිතවන්තු-ඨිතාවී'' ආදිය ද, 'මාන'' ප්‍රත්‍යය යෙදීමෙන්, ''භවමාන, තිඨමාන'' ආදිය ද සොයාගත යුතුයි.

තවද කත්තෘකාරකයෙහි යෙදෙන "අන්ත, මාන" දෙක ආඛ්‍යාතයෙහි කී වත්තමානධාතුවිකෘති කෙරෙන් ද, කම්භාව දෙක්හි යෙදෙන "මාන" ප්‍රත්‍යය කම්මකාරකධාතුවිකෘති කෙරෙන් ද යොදගත යුතුයි.

"තබ්බ-අනීය" දෙකෙන් නිපන් පදයන්ගේ ධාත්වර්ථය සමග "යුතු" යන අර්ථය ද කිය වේ 'භවිතබ්බං, වියයුතු" ආදී වශයෙනි. එහෙයින් පාළියෙහි ඒ ප්‍රත්‍යයන්ට "කිච්ච" යයි ද සංස්කෘතයෙහි "කෘත්‍ය" යයි ද ව්‍යවහාර කෙරෙත්. එසේම "ත-තවන්තු-තාවී" ප්‍රත්‍යාන්තයෝ ක්‍රියාර්ථය නිෂ්ඨා කළ බැව් හඟවත්. එබැවින් පාළියෙහි ඔවුන්ට 'නිඨා" යයි ද, සංස්කෘතයෙහි "නිෂ්ඨා" යයි ද ව්‍යවහාර කෙරෙත්. "තාවී" ප්‍රත්‍යය සංස්කෘතයෙහි නැත්තේයි. මොවුහු අතීත කාලික ආඛ්‍යාත වෙනුවට ද යෙදෙත්.

මේ ප්‍රත්‍යයන් වීමෙන් සිද්ධකිතකයෝ මීටවෙනස්වද සිඩ වූවෝ වෙත්. ඔහු ද, මින් පිටත් ධාතුවලින් සිඩවූවෝ ද මේ අනුසාරයෙන් දතයුතුයි. "අන්ත, මාන" ප්‍රත්‍යයාන්ත යෝ සිංහලෙහි මුසුකිරිය වශයෙන් යෙදෙත්.

ඔබවහන්සේ කරුණා කොට ඇසිල්ලක් එහි සිටියයුතුයි.
ධම්කථිකයන් උස් අස්නෙහි ඉඳිමින් ධම්ය කියයුතුයි.
ධම්ය අසන්නවුන් පහත් අස්නෙහි හිඳිමින් ඇසිය යුතුයි.

ධම්ය අසන්නවුන් එකඟ සිතින් ඇසීම යහපති.
මේ වාක්‍යයෝ පාළියෙන් ලිවිය යුතුයි.

කරුණාකොට (අනුකම්පමුපාදය) ඇසිල්ල (ඛණ) උස් අස්න (උච්ච-ආසන) පහත් (නීච) එකඟ සිත් (එකග්ගචිත්ත)

37 පාඩම.

## සමාස ලක්‍ෂණ

## 30. අන්‍යොන්‍ය සම්බන්ධය ඇති පදයන් එකක් මෙන් කිරීම සමාසයි.

ඒ ඒ අදහස් පහළ කිරීමට යෙදෙන සියලු ශබ්දයන් කොරෙන්ම අර්ථයට යොග්‍ය වූ විභක්තියක් යෙදිය යුතු වේ. එහෙත් එසේ සියලු ශබ්දයන් කෙරෙන්ම විභක්ති යෙදී මෙන් ගැළපෙන වාක්‍යයෝ දීර්ඝවෙත්. එබැවින් එහි අර්ථ වශයෙන් එකිනෙකට සම්බන්ධය ඇති පද කීපයක් එකක් මෙන් සංක්‍ෂෙප කිරීමෙන් ද වාක්‍යයන්ගේ ගැළපීම කරණ ලදි. එසේ කිරීමෙන් නිපන්නේ සමාසයයි.

භාෂාවිෂයෙහි වූ වාක්‍යයන්ගේ අර්ථාවබොධයට හා සිලුටු ලෙස වාක්‍යයන් ගැළපීමට සමාසවිධිය දතයුතු වේ. වාක්‍යයන්හි ඔජෝගුණය (පුෂ්ටිමද්භාවය) ඇතිවන්නේ සමාසවිධි වශයෙනි.

"බුදුරජාතන් වහන්සේ සියලු බ්‍රහ්මයන් විසින් ද දෙවි යන් විසින් ද අසුරයන් විසින් ද මිනිසුන් විසින් ද පිදිය යුත්තෝ වේ" යන අදහස කියනු කැමැති කල්හි "බුද්ධො සකලෙහි බ්‍රහ්මෙහි ච සුරෙහි ච අසුරෙහි ච නරෙහි ච පූජනීයො භවති' යි කියයුතු වේ. මෙහි සියලු පදයෝ ම විභක්ත්‍යන්තවෙත්. එහෙයින් මේ වාක්‍යයෙහි ඔජොගුණය හීන වේ. ඒ ඔජෝගුණය ඇතිකර ගැණීමට එහි සමාසයට යොග්‍ය පද ඇද්දැයි සලකා බැලිය යුතුයි. එසේ බලන කල්හි එහි තිබෙන "බ්‍රහ්මෙහි සුරෙහි අසුරෙහි නරෙහි" යන පද සමානව "පූජනීයො' යන පූජන ක්‍රියාව අපෙක්‍ෂා කරණ බැව් පෙණේ. එබැවින් පළමුකොට ඒ පද සතර

බ්‍රහමසුරාසුරනරෙහි" කියා එක පදයක් කටයුතු වේ. ඊට පසු "සබ්බෙහි" යන්නෙන් ගම්‍යමාන ගුණය ඒ සතරටම සමාන බැවින් "සබ්බෙහි" යන්න ද ඒ හා සම්බන්ධකොට "සබ්බබ්‍රහමසුරාසුරනරෙහි" යි කිය යුතු වේ. පසුව ඒ සියල්ලටම සමානවූ "පූජනීයො" යන්න ඒ හා සම්බන්ධ කළ කල්හි ඒ වාක්‍යය 'බුද්ධො සබ්බබ්‍රහමසුරාසුරනරපූජනීයො භවති" යනු වේ. මෙසේ කළ කල්හි ඔජොගුණ යුක්ත වූයේ වේ.

එහෙත් මේ වාක්‍යය උවමනා පරිද්දෙන් "බුද්ධො සබ්බ බ්‍රහමසුරාසුරනරෙහි පූජනීයො භවති" කියාද "බුද්ධොසබ්බෙහි සුරාසුරනරෙහි පූජනීයො භවති" කියා ද යෙදිය හැකි වේ.

### තප්පුරිසසමාසය.

## 31. භින්නාධිකරණ වූ විතියාන්තාදි පූර්වපදයක් හා සම්බන්ධය ඇත්තේ තප්පුරිසයි.

පූර්වපද භාවයෙන් භින්නාධිකරණ විශෙෂණවූ විතියාන්තාදි විභත්ත්‍යන්තයක් ඊට තිසි පරපදයක් හා යෙදීමෙන් සිඩවූ සමාසය තප්පුරිස නම් වේ.

මෙහි විතියා විභත්ත්‍යන්තය බොහෝ සෙයින් "ගත" ආදි කත්තුකාරක කිතක සමග ද, තෘතියා විභක්ත්‍යන්තය බොහෝ සේ කම්මකාරක කිතක සමග ද, ඇතැම් තන්හි කත්තුකාරක කිතක සමග ද "පුබ්බ, සදිස" ආදි ශබ්ද සමග ද, චතුර්ථීවිභක්ත්‍යන්තය දානාර්ථ ශබ්ද හා "හිත" ආදි ශබ්ද සමග ද, "තදත්ථ" (පිණිස අර්ථ) තන්හි ද, පංචමී විභක්ත්‍යන්තය අපගමනාර්ථශබ්ද භයාර්ථශබ්ද ආදිය සමග ද, ෂෂ්ඨීවිභක්ත්‍යන්තය හා සප්තමීවිභක්ත්‍යන්තය අවිශෙෂයෙන් ඔවුන් හා සම්බන්ධත්වය ඇති ශබ්ද සමගද සමාස වේ.

| | ව්‍යස්ත වාක්‍යය. | | සමස්ත වාක්‍යය. | අර්ථ. |
|---|---|---|---|---|
| දුතියා | සො ගාමං ගතො | භවති | =සො ගාමගතො | ”–(හෙතෙමේ ගමටගියේවේ) |
| | සො ධම්මං කාමෙති | ” | =සො ධම්මකාමො | ”–( ,, ධර්‍මය කැමැති වේ) |
| | සො සුඛං සයිතො | ” | =සො සුඛසයිතො | ”–( ,, සැපසේ සයනය කෙළේය) |
| තතියා | තං ඉස්සරෙන කතං | ” | =තං ඉස්සරකතං | ”–(ඒ ඊශ්වරයා විසින් කරනලදි) |
| | සො බුද්ධියා සම්පන්නො | ” | =සො බුද්ධිසම්පන්නො | ”-(හෙතෙමේ බුද්ධියෙන් යුක්තවේ) |
| | සා වෙලා මාසෙනපුබ්බා | ” | =සාවෙලා මාසපුබ්බා | ”–(ඒ වේලාව මසකින් පෙරයි) |
| | සො පණ්ඩිතෙන සදිසො | ” | =සො පණ්ඩිතසදිසො | ”–(හෙතෙමේපණ්ඩිතයෙක්සමවේ) |
| චතුත්ථී | තං චීවරංසඞ්ඝස්සදෙය්‍යං | ” | =තං චීවරං සඞ්ඝදෙය්‍යං | ”–(ඒ සිවුර සංඝයාට දියයුතු වේ) |
| | තංකම්මංලොකස්සහිතං | ” | =තං කම්මං ලොකහිතං | ” (ඒ කර්‍මය ලොකයාට හිතවේ.) |
| | තං කඨිනස්ස දුස්සං | ” | =තං කඨිනදුස්සං | ”–(ඒ කඨිනයපිණිසවූ වස්ත්‍රයෙකි) |
| පඤ්චමී | සො පාපස්මා අපෙතො | ” | =සො පාපාපෙතො | ”–(හෙතෙමේ පාපයෙන් පහවූයේය.) |
| | තං චොරෙහි භයං | ” | =තං චොරභයං | ”–(ඒසොරුන්කෙරෙන්වූ බියක්වේ.) |
| ඡට්ඨී | —සො රඤ්ඤො පුරිසො | ” | =සො රාජපුරිසො | ”–(ඒ රජගේ පුරුෂයෙකි.) |
| සත්තමී | —සො ධම්මෙ රතො | ” | =සො ධම්මරතො | ”–(හෙතෙමේ ධර්‍මයෙහිඇලුනේවේ) |

විතීයා විභක්ත්‍යන්තපදය "තවන්තු, මාන, අන්ත" ආදී ප්‍රත්‍යයාන්ත සමග සමාස නොවේ. "ධම්මං සුතවා ධර්මය ඇසීය) ධම්මං සුණමානො (සුණනෙනා) (ධර්මය අසන්නේ) යනාදි වශයෙනි.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|
| නිපුණො | විරතො | ගාරවො | වාසො |
| ධම්මො | නරෙ | භවති | සරෙ |
| බුද්ධස්ස | පාපා | ධම්මෙ | භවති |
| වෙදනීයො | භවති | ලාභාය | වාසො |
| පණ්ඩිතෙහි | පතෙනා | හිතො | සදා |
| භවති | සුඛං | සඞ්ඝස්ස | දුක්ඛං |

මේ වාක්‍ය සතරෙහි සප්පුරිස සමාසයට යොග්‍යපද සමාස කොට සරසට ලියනු.

විරතො (වෙන්වූයේ) පතෙනා (පැමිණියේ) ගාරවො (ගෞරවය) ලාභාය (ලැබීමට) වාසො (විසීම) සදා (සැමකල්හි)

37 පාඩම.

**තද්ධිතපද**

## 32 නාමයන් කෙරෙන් නානාර්ථප්‍රත්‍යයන් යෙදීමෙන් සිද්ධවූයේ තද්ධිතයි.

නාමයන් කෙරෙන් යෙදී නානාවිධ අර්ථවිශෙෂයන් ප්‍රකාශකාරණ ප්‍රත්‍යය සමූහයද එයින් නිපන් නාමසමූහය ද තද්ධිත නම් වේ.

මේ තද්ධිත විධියෙන් වනාහි වාක්‍යවිෂයෙහි පදකීපය කින් ප්‍රකාශකාරණ අර්ථය එක් පදයකින් කිවහැකි වේ,

"මේ පුරුෂයා සුවඳ බඩු විකුණන්නෙක් වේ" යන වාක්‍යය තද්ධිතරහිත කොට පාළියෙන් කියත්හොත් "එසො පුරිසො ගන්ධං භණ්ඩං වික්කිණනෙතා හොති'යි කියයුතු වේ. ඒ තද්ධිත කොට කියත් හොත් "එසො පුරිසො ගන්ධිකො හොති"යි කිව හැකි වේ. මෙහි "ගන්ධිකො"යනු තද්ධිතපදයි. "ගන්ධං භණ්ඩං වික්කිණනෙතා'යන පදත්‍රය වෙනුවට ඒ පදය ව්‍යවහාරකරණු ලැබේ. මේ තද්ධිතවිධියෙන් වාක්‍යයන්ගේ ලුහුඬුබව ද සිලුටුබව ද වේ.

තද්ධිතයෙහි අර්ථභෙදයෝ අප්‍රමාණයි. ප්‍රත්‍යයෝද බොහෝයි. මෙහි තද්ධිත ලක්‍ෂණ දක්වනු සඳහා අර්ථ ස්වල්පයක් හා ප්‍රත්‍යය ස්වල්පයක් ද පවසනු ලැබේ.

## 33. කත්තුකාරක හෝ කම්මකාරක ක්‍රියායොගයෙහි කාරකපදයා කෙරෙන් ණික ණ ඉම ඉය ප්‍රත්‍යයෝ විහිතයි.

ඇතැම් තන්හි කත්තුකාරක කම්මකාරක ක්‍රියාවන්ට කාරකවශයෙන් සිටි පද කෙරෙන් "ණික, ණ, ඉම, ඉය" යන ප්‍රත්‍යයෝ වෙත්. මෙහි "ණික, ණ" දෙකෙන් "ඉක, අ" යන දෙක ගණු ලැබේ. මෙසේ මූර්ධජණකාරයුක් ප්‍රත්‍යයන් යෙදුනු තන්හි ඒ නාමයාගේ ආදිස්වරයට වෘද්ධි වේ. වෘද්ධි නම් අයන්නට "ආ" යන්න හා "ඉඊ" දෙකට "එ" යන්න ද "උඌ" දෙකට "ඔ" යන්න ද වීමයි. සංයොගය කින් පූර්වවූ ස්වරයට වෘද්ධි නොවේ.

මේ වෘද්ධිවිධිය "නීලෙන රත්තං=නීලං, පීතෙනරත්තං= පීතං" යනාදි ඇතැම්තන්හි නොවේ. මෙහි "නීල, පීත" ශබ්දයන් කෙරෙන් "ණ" ප්‍රත්‍යයයි. ඇතැම් තන්හි විකල්ප වේ, "ඔලුම්පිකො-උලුම්පිකො" ආදී වශයෙනි.

## උදාහරණ.

| | තද්ධිතයොග්‍යවාක්‍ය. | තද්ධිතවාක්‍ය. | | අර්ථ. |
|---|---|---|---|---|
| ණික | සො අභිධම්මං ජානාති | -සො **ආභිධම්මිකො** | හොති | (හෙතෙමේ අභිධර්මය දන්නේයි) |
| | තං තිලෙන සංසට්ඨං | -තං **තෙලිකං** | " | (ඒ තල හා අනනලද්දකි) |
| | සො උළුම්පෙන තරති | -සො **ඕළුම්පිකො** | " | (හෙතෙමේ පසුරෙන් එතරවේ) |
| | සො පාදෙන චරති | -සො **පාදිකො** | " | (හෙතෙමේ පයින් හැසිරේ) |
| | සො හත්ථෙන වහති | -සො **හත්ථිකො** | " | (හෙතෙමේ අතින් බරගෙණයයි) |
| | තං කායෙන කතං හොති | -තං **කායිකං** | " | (ඒ කයින් කරණලද්දකි) |
| | සො නගරෙ නියුත්තො | ,,-සො **නාගරිකො** | " | (හෙතෙමේ නුවරෙහි නියුක්තවූයේයි) |
| | තං ධනංමාතුයා ආගතං | ,,-තං ධනං **මාතිකං** | " | (ඒ ධනය මවුගෙන් ආයේ වේ) |
| ණ | තං කසාවෙන රත්තං | ,,-තං **කාසාවං** | " | (ඒ කසටින් රඳන ලද්දකි) |
| | සා පුරෙ භවා | ,,-සා **පොරී** | " | (ඕ තොමෝ පුරයෙහි වූවාවේ) |
| | සො චිත්තාය යුත්තො | ,,-සො **චිත්තො** | " | (ඒ සිතනකතින් යුක්තයි) |
| ඉම | සො මජ්ඣෙ ජාතො | ,,-සො **මජ්ඣිමො** | " | (ඒ මධ්‍යයෙහි උපන්නේයි) |
| | සො අන්තෙ නියුත්තො | ,,-සො **අන්තිමො** | " | (ඒ අන්තයෙහි නියුක්තයි) |
| ඉය | සො ලොකෙ ජාතො | ,,-සො **ලොකියො** | " | (හේ ලෝකයෙහි උපන්නේයි) |
| | සො අන්තෙ නියුත්තො | ,,-සො **අන්තියො** | " | (හේ අන්තයෙහි නියුක්තයි) |

මෙහි "ජානාති" යන කත්තෘකාරක ආඛ්‍යාතක්‍රියායොග යෙහි "අභිධම්මං" යන කම්මකාරකයා කෙරෙන්ද, "සංසට්ඨං, කතං" යන කම්මකාරකකිතකක්‍රියායොගයෙහි 'තිලෙන කායෙන" යන කරණකාරකයා කෙරෙන්ද, "තරති, චරති, වහති" යන කත්තෘකාරක ආඛ්‍යාතක්‍රියායොගයෙහි "උලුම්පෙන, පාදෙන, හත්ථෙන" යන කාරණකාරකයා කෙරෙන් ද, "නියුත්තො, ආගතං" යන කත්තෘකාරක කිතකක්‍රියා යොගයෙහි "නගරෙ" යන ආධාරකාරකයා කෙරෙන් හා "මාතුයා" යන අපාදානකාරකයා කෙරෙන්ද, "ණික" ප්‍රත්‍ය යයි. සෙසු තන්හිද මෙසේ දතයුතුයි. මෙසේ සිඬවූ තඬිත යන්ගේ ප්‍රමාණයක් කිව නොහැකි වේ.

ඒ භික්ෂුතෙමේ සූත්‍රාන්තය දන්නේ වේ.
විනය දත් භික්ෂුව විසින් අභිධර්මය ද ඉගෙණිය යුතුයි.
ඒ පුරුෂයා දියෙන්හැනු භොජනයක් අනුභව කෙළේයි.
ඒ මිනිහා කරෙන් බරගෙණ යන්නෙකි.
ඒ භාෂාව මගධ රට ඇතිවූවා වේ.

ධර්මසෙන ඒ පවුලේ සියල්ලට පසු වූයේ වේ.
මේ වාක්‍යයන්හි තඬිතයට සුදුසුතැන් තඬිත කොට පාළියෙන් ලිවිය යුතුයි.

සූත්‍රාන්ත (සුත්තන්ත) දී (දධි) කර (ඛන්ධ) පවුල (කුටුම්බ) පසු (පච්ඡා)

---

38 පාඩම.

## කම්මධාරය සමාසය.

## 34 තුල්‍යාධිකරණ පදවයක සම්බන්ධය ඇති සමාසය කම්මධාරයයි.

තුල්‍යාධිකරණ විශෙෂණ විශෙෂ්‍ය පද දෙකක්හුගේ අන්‍යොන්‍යසම්බන්ධයෙන් සිඬ වූ සමාසය කම්මධාරය නම් වේ.

තුල්‍යාධිකරණ විශෙෂණ විශෙෂ්‍ය පද දෙකක් වීමත්, ඉන් විශෙෂණ පදය පූර්වයෙන් යෙදීමත් මේ සමාසයේ ප්‍රධාන ලක්‍ෂණයයි. "සො වීරො පුරිසො හොති (ඒ වීරවූ පුරුෂයෙක් වේ) මෙහි 'වීරො" යනු "පුරිසො" යන්නෙහි තුල්‍යාධිකරණ විශෙෂණයි. එබැවින් ඒ පදදෙක සමාස වීමෙන් ඒ වාක්‍යය "සො වීරපුරිසො හොති" කියා වේ.

ඇතැම් තන්හි විශෙෂණ පදය පරව යෙදේ. "සො වරො මුනි හොති (ඒ උතුම් වූ ඍෂියෙක් වේ). මෙහි "වරො" යනු විශෙෂණයි. "මුනි" යනු විශෙෂ්‍යයි. ඒ දෙක සමාසවූ කල්හි "සො මුනිවරො හොති" කියා වේ. "සාරිපුත්ත ත්ථෙරො බුද්ධඝොසාචරියො, විධුරපණ්ඩිතො" යන ආදිය ද මෙසේයි.

මේ සමාසයෙහි ඇතැම් තන්හි විශෙෂණ පද දෙකක් ම පමණකුදු සමාසවන බැව් පෙණේ. "ඛජො ච ඛුජ්ජො ච පුරිසො හොති" (කොරවූ ද කුදුවූ ද පුරුෂයෙක් වේ.) මෙහි "ඛජො ඛුජ්ජො"යන පද දෙකම"පුරිසො"යන්නෙහි විශෙෂණයි. ඒ විශෙෂණ පද දෙක සමාස වීමෙන් "ඛජ්ජඛුජ්ජො පුරිසො හොති" යනු වේ. "සීතුණ්හං, අඬ්ඪබධිරො, කතාකතං" යන ආදිය ද එසේයි.

ඇතැම් තන්හි මේ සමාසයෙහි උපමා උපමෙය පද දෙක ද සමාස වේ. "සීහො විය=මුනිසීහො" යනාදි වශයෙනි. (සිංහයෙකු වැනි මුනිතෙමේ" යන අර්ථයි)

"ධම්මො ඉති බුද්ධි=ධම්මබුද්ධි (ධර්මය යන බුද්ධිය) ගුණො එව ධනං=ගුණධනං (ගුණයම ධනය)" යන ආදිය ද කම්මධාරය සමාස වශයෙන් දක්වන ලදී.

"න, කු, දු, සු, ප" ආදි ඇතැම් අව්‍යය පදයන් සමග වූ සාමසයෝ ද මේ සාමාසයෙහි ඇතුළත් කරණ ලද්දාහ. (ඔවුහු සංස්කෘත ව්‍යාකරණයන්හි තත්පුරුෂ සාමාසයෙහි ඇතුළත් කරණ ලද්දාහ.) සමාසවිෂයෙහි ව්‍යඤ්ජන වර්ණයකින් පූර්වවූ "න" නිපාතයට "අ" යන්න ද, ස්වරයකින් පූර්ව නයන් නට "අන්" යන්න ද ආදෙශ වේ.

“න බ්‍රාහ්මණො=අබ්‍රාහ්මණො, න අන්‍යො=අනන්‍යො, කු (කුච්ඡිතො) පුරිසො=කුපුරිසො, දු (දුෂ්ඨ) ගන්ධො=දුග්ගන්ධො, සු (සුෂ්ඨු) ගන්ධො=සුගන්ධො” යනා ආදි වශයෙන් අව්‍යය පූර්ව සමාස දතයුතුයි

“න” නිපාතය වනාහි සාමාන්‍යයෙන් ප්‍රතිෂේධාර්ථ වේ. එහි පසජ්ජපටිසෙධයෙහි වූ නයන්ත යමක් හා යෙදුනේ නම් ඒ ඔහුගේ අභාවය කෙරේ. “න කරණං=අකරණං” ආදි වශයෙනි. අකරණ නම් කිරීමේ අභාවයයි.

පරියුදාසයෙහි වූ නයන්ත යමක් හා යෙදුනේ නම් එය ප්‍රතිෂිධ කොට (වළක්වා) ඉන් අර්ථ විශෙෂයක් ගණු ලැබේ. ඒ ගණු ලබන අර්ථය ද ඒ අර්ථය හා සමාන වූ කිසි වක් ද, ඊට විරුඬවූ කිසිවක් ද, ඉන් අන්‍යවූ කිසිවක් ද වේ. “න සමණො=අස්සමණො” (ශ්‍රමණ සමාණවූවෙක්) නකුසලං= අකුසලං (කුසලයට විරුඬවූවක්) න අස්සො=අනස්සො (අශ්ව යාගෙන් අන්‍යවූවෙක්) ආදි වශයෙනි.

මේ කම්මධාරය සමාසයෙහි යෙදෙන විශෙෂ්‍ය පදය නියත ස්ත්‍රීලිඞ්ග පදයක් වූ තන්හි විශෙෂණ පදය ද ත්‍රිලිඞ්ග පදයක් වුවොත් වාක්‍යවිෂයෙහි විශෙෂණය විශෙෂ්‍යයෙහි ලිඞ්ගය ලබා ස්ත්‍රීලිඞ්ග වේ. එහෙත් ඒ සමාසවිෂයෙහි පුංලිඞ්ග රූපයෙන් සිටින්නේ වේ. “රත්තා ලතා හොති (රතු ලියක් වේ.) මෙහි “ලතා” යන විශෙෂ්‍ය පදය නියත ස්ත්‍රීලිඞ්ග ද “රත්ත” ශබ්දය ත්‍රිලිඞ්ග ද වේ. එබැවින් එය “ලතා” යන්නට විශෙෂණ වීමෙන් ස්ත්‍රීලිඞ්ග වුවත් සමාස විෂයෙහි පුංලිඞ්ග රූපවීමෙන් “රත්තලතා” යනු වේ. “ඛත්තියා කුමාරී=ඛත්තිය කුමාරී, පරිපුණ්ණා ගඞ්ගා=පරිපුණ්ණගඞ්ගා, සුද්ධා පඤ්ඤා= සුද්ධපඤ්ඤා” ආදිය ද මෙසේයි. බහුබ්බීහි සමාසයෙහි ද මේ විධිය මෙසේයි.

තවද “මහන්ත” ශබ්දය තවත් නාමයක් හා මේ සමාස යෙහි හෝ බහුබ්බීහි සමාසයෙහි සමාස වූ තන්හි “මහන්ත” ශබ්දයට “මහා” නියා ආදෙශ වේ. “මහන්තො වීරො=මහා වීරො” ආදි වශයෙනි. ඇතැම් තන්හි “මහ” නියාද වේ.

| 1 | 2 | 3 | 4 |
|---|---|---|---|
| වර | වචන | ජනන්ත | බුද්ධ |
| බුද්ධ | පණ්ඩිත | උපාය | කදණ |
| කමල | ච | සම්මා | මහන්ත |
| ඉව | භවන්ති | ගච්ඡන්ති | මහන්තී |
| චරණ | න | න | සම්පත්ති |
| හොති | සබ්බ | අපි | කදාචි |
| මහිත | ඉට්ඨ | කදාචි | එව |
| සුරුදි | කන්ත | අපාය | අත්ත |

මේ වාක්‍යයන්හි සමාසයට සුදුසු තැන් සමාස කිරීමෙන් අවිභත්තිකයන් අර්ථයට සුදුසු සේ සවිභත්තිකයන් කොට සරසට ලියනු.

කමල (පියුම්) මහිත (පුදනලද) ඉට්ඨ (ප්‍රිය) කන්ත (මන හර) කදාචි (කිසිකාලෙක්හි)

---

39 පාඩම.

**"අපච්ච" ආදි අර්ථයන්හි තද්ධිත.**

---

## 35. අපච්චාතිසයත්ථ භාව සමූහෙදං ඨාන අර්ථයන්හි විහිත ණ තර තමිස්සිකියිට්ඨ වන්තු මන්තු වීසීකාණ්‍යත්තාතීය ප්‍රත්‍යයෝ ද තද්ධිතයහ.

"අපච්ච, අතිසය, අත්ථ, භාව, සමූහ ඉදං ඨාන" යන මේ අර්ථයන්හි කරණලද "ණ, තර, තම, ඉස්සික, ඉය, ඉට්ඨ, වන්තු, මන්තු, වී, සී, ර්, ඉක, ආලු, ණ්‍ය, ත්ත, තා, ර්ය" යන මේ ප්‍රත්‍යය සතළොස ද තද්ධිත නම්. එහි—

**අපච්ච** නම් දරු යනුයි. යම් කෙනෙකුගේ දරුවෙක් යන අර්ථය ප්‍රකාශ කිරීමට ඒ නාමයා කෙරෙන් ප්‍රත්‍යය වේ. ඒ අර්ථයෙහි යෙදෙන ප්‍රත්‍යයෝ බොහෝයි. මෙහි ඒ අර්ථය පැවසීමට "ණ" ප්‍රත්‍යය කියනු ලැබේ.

අතිසය නම් වැඩිගුණයයි. යමෙක් කීපදෙනෙකු අතුරෙන් උසස් ගුණයෙන් හෝ පහත් ගුණයෙන් වැඩි නම් එය පැවසීමට ඒ ගුණය ප්‍රකාශ කරණ නාමයා කෙරෙන් ප්‍රත්‍යය වේ. මෙහි ඒ අර්ථය පැවසීමට ''තර තම ඉස්සික ඉය ඉට්ඨ' යන ප්‍රත්‍යයෝ කියනු ලැබෙත්.

අත්‍ථි නම් ඇති යනුයි. යමෙකුට ධන ආදි යමක් ඇත් නම් ඒ ඇති බැව් පැවසීමට ඒ ''ධන'' ආදි නාම කෙරෙන් ප්‍රත්‍යය වේ. මෙහි එය ප්‍රකාශ කිරීමට ' ණ ඉය වන්තු මන්තු වී සී ර ඉක ආලු' යන මේ ප්‍රත්‍යයෝ කියනු ලැබෙත්. එහි ''ණ'' ප්‍රත්‍යය ''සද්ධා පඤ්ඤා'' ආදි ඇතැම් ස්ත්‍රීලිඞ්ගයන් කෙරෙන්ද, ''ඉය'' ප්‍රත්‍යය ''ජටා, පුත්ත'' ආදි ඇතැම් නාම කෙරෙන්ද, ''වන්තු ර ඉක'' යන තුණ ''ධන පඤ්ඤා'' ආදි අවණ්ණාන්තනාමයන් කෙරෙන් ද, ''මන්තු''ප්‍රත්‍යය අවණ්ණාන්තයන් හැර සෙසු නාමයන් කෙරෙන් ද, ''වී'' ප්‍රත්‍යය ''මෙධා මායා'' ආදි ඇතැම් ස්ත්‍රීලිඞ්ග නාම කෙරෙන් ද, ''සී'' ප්‍රත්‍යය ''තප මන වච තෙජ'' ආදි නාම කෙරෙන් ද යෙදේ. (මේ ''තප'' ආදිය නම් සංස්කෘතයෙහි සකාරාන්තයි.)

භාව නම් ශබ්දයන්ගේ පැවැත්මට නිමිතිවූ ගුණක්‍රියාදි ලක්‍ෂණයි. යම් ශබ්දයක් පිළිබඳ ඒ ලක්‍ෂණයන් පවසත් හොත් ඒ ශබ්දයා කෙරෙන් ප්‍රත්‍යය වේ. මෙහි ඒ සඳහා ''ණ, ණ්‍ය, ත්ත, තා'' යන මේ ප්‍රත්‍යයෝ කියනු ලැබෙත්. එහි 'ණ'' ප්‍රත්‍යය''විසම ගරු කුමාර'' ආදි ඇතැම් නාමයන් කෙරෙන්ද ''ණ්‍ය'' ප්‍රත්‍යය ''පණ්ඩිත, කුසල'' ආදි නාමයන් කෙරෙන් ද ''ත්ත, තා'' යන දෙක අවිශෙෂයෙන් ද යෙදේ.

යමක් පිළිබඳ සමූහයක් කීමේ දී ඒ නාමයා කෙරෙන් ''ණ කණ් තා'' යන ප්‍රත්‍යයෝ යෙදෙත්, ඒ සමූහාර්ථ වශයෙනි. යමක් පිළිබඳ කිසිවක් කීමේදී ඒ නාමයා කෙරෙන් ''ණ''ප්‍රත්‍යය වේ. ඒ ඉදං අර්ථවශයෙනි. යමක්හට කාරණ වූවක් කීමේදී ඒ නාමයා කෙරෙන් ''ඊය'' ප්‍රත්‍යය වේ. ඒ ඨාන වශයෙනි.

| ප්‍රත්‍යය. | ත: යොග්‍යවාක්‍ය | ත: වාක්‍ය | අර්ථ. |
|---|---|---|---|
| ණ | -අයංවසිට්ඨස්ස අපච්චං | -අයං වාසිට්ඨො | -(මේ වශිෂ්ඨයාගේ දරුයි) |
| තර | -අයමතිසයෙන පාපො | -අයංපාපතරො | -(මේ ඉතා පාපයෙකි) |
| ණ | -අස්ස සද්ධා අත්ථි | -අයං සද්ධො | -(මේ සැදැවතෙකි) |
| ඉල | - ,, ජටා ,, | -අයං ජටිලො | -(මේ ජටා ඇත්තෙකි) |
| වන්තු | - ,, ධනං ,, | -අයං ධනවා | -(මේ ධනවතෙකි) |
| මන්තු | - ,, මති ,, | -අයං මතිමා | -(මේ ප්‍රඥවතෙකි) |
| වී | - ,, මෙධා ,, | -අයං මෙධාවී | -(මේ ” ” |
| සී | - ,, තපො ,, | -අයං තපස්සී | -(මේ තපස් ඇත්තෙකි) |
| ඊ | - ,, ධනං ,, | -අයං ධනී | -(මේ ධනවතෙකි) |
| ඉක | - ,, ,, ,, | -අයං ධනිකො | - ,, ,, |
| ආලු | - ,, දයා ,, | -අයං දයාලු | -(මේ කරුණා ඇත්තෙකි) |
| ණ | -අයං විසමස්ස භාවො | -ඉදංවෙසමං¶ | -(මේ විසම බවයි) |
| ණ්‍ය | -අයංපණ්ඩිතස්ස,, | -ඉදං පණ්ඩිච්චං | -(මේ පඬි බවයි) |
| ණ-කණ් | -අයංපුරිසානං සමූහො,, | -අයං පොරිසො (පොරිසකො) | -(මේ පුරුෂසමූහයයි) |
| තා | -අයං ගාමානං ,, | -අයං ගාමතා | -(මේ ගම්සමූහයෙකි) |
| ණ | -ඉදං සිඞ්ගං මහිසස්ස,. | -ඉදං මාහිසං | -(මේ අඟ මීමෙකුගේයි) |
| ඊය | -ඉදංඋපාදානස්ස ඨානං,, | -ඉදං උපාදානීයං | -(මේ උපාදානයට කාරුණුයි) |

* “තම, ඉස්සික, ඉය, ඉට්ඨ” යන ප්‍රත්‍යයන් යෙදීමෙන් “පාපතම, පාපිස්සික, පාපිය, පාපිට්ඨ” යන නාමයෝ සිඩයහ.

† ‘තා, තන” ප්‍රත්‍යයන් යෙදිමෙන් “විසමතා, විසමත්තනං” යන පදයෝ සිඩයහ.

මහා පරාක්‍රමබාහු රජතෙමේ අතිශය පණ්ඩිතයෙක් වේ.
හෙතෙමේ ධනවතෙක් ද කීර්ත්තිමතෙක් ද ශාස්ත්‍ර
වතෙක් ද විය.
ඔහුගේ සන්තානයෙහි පුරුෂභාවය මනාකොට
පිහිටියේය.
ඔහු කෙරෙහි පිහිටි ගුණයෝ දෙවියන් පිළිබඳවූවෝ
වෙත්.
ඒ ගුණයෝ වනාහි සවගීයට කරුණුවූවෝ වෙත්.

මේ වාක්‍යයන්හි තද්ධිතයට යොග්‍ය තැන් තද්ධිත කොට පාළියෙන් ලියනු.

---

40 පාඩම.

**දිගුසමාසය.**

## 36. සඞ්ඛ්‍යාපූර්වක කර්මධාරය දිගු නම්.

සඞ්ඛ්‍යාවාචක පදයක් පූර්වකොට ඇත්තාවූ කම්මධාරය සමාසය දිගුයයි කියනු ලැබේ. මේ සමාසයෙහි වූ පදයෝ බොහෝ සෙයින් නපුංසකලිඞ්ග හා එකවචන වෙත්.

| **සමාසරහිතවාක්‍ය.** | **සමස්තවාක්‍ය.** | | **අර්ථ** |
|---|---|---|---|
| වෙ රත්තියො අහෙසුං | විරත්තං | අහොසි | (රෑදෙකෙකි.) |
| තයො ලොකා ,, | තිලොකං | ,, | (ලෝතුනෙකි) |
| චතස්සොදිසා ,, | චතුද්දිසං | , | (දිසාසතරෙකි.) |
| පඤ්ච සික්ඛාපදානි ,, | පඤ්චසික්ඛාපදං | ,, | (සිල්පදපසෙකි) |

මේ උදාහරණ මේ ආදි වශයෙන් දතයුතුයි. ඇතැම් තන්හි "තිනවා, චතුද්දිසා" ආදි වශයෙන් පුල්ලිඞ්ග ස්ත්‍රීලිඞ්ග හා බහුවචන ද වේ.

**ධන්දසමාසය.**

## 37. චනිපාතයුත් පදයන්ගේ සම්බන්ධය ඇත්තේ චන්දයි.

ඇතැම් වාක්‍යයන්හි වූ නාමයෝ ච යන නිපාතයෙන් යුක්තවූවෝ වෙත්, ඒ චයන්නෙන්යුත් පදයන්ගේ සම්බන්ධය ඇති සමාසය චන්ද නම් වේ.

'ච' යන නිපාතය වනාහි "කෙවලසමුච්චය, අන්වාචය, සමාහාර, ඉතිරෙතරයොග"යයි සිවුවැදෑරුම් වේ. එහි ඇතැම් තන්හි චයන්ත පද කීපයක් කම්මාදි එක් අර්ථයෙක්හි හුද කලාව වෙන් වෙන් වශයෙන් සම්බන්ධ කිරීමට යෙදේ. ඒ කෙවල සමුච්චයාර්ථ නම් වේ.

'සො චීවරං පිණ්ඩපාතඤ්ච පච්චයං සයනාසනං අදාසි' (හෙතෙමේ සිවුරු ද දුන්නේය, පිණ්ඩපාතය ද දුන්නේය, ප්‍රත්‍යය ද දුන්නේය, සයනාසනය ද දුන්නේය.) මෙහි "චීවරං"යනාදි කම්පද "අදාසි" යන ක්‍රියාව හා වෙන වෙනම සම්බන්ධ කිරීම සඳහා චයන්ත යෙදුනේ වේ, එබැවින් ඒ හා යෙදුන කම්පදයන්ගේ අන්‍යොන්‍ය අපෙක්ෂකත්වය නැත්තේ වේ. එහෙයින් එබඳු තන්හි සමාස නොවේ.

ඇතැම් තන්හි කර්තෘාදි එක් වස්තුවක් අපෙක්ෂාකොට භින්නාර්ථ ක්‍රියා කීපයක් යෙදෙත්. එහි ඒ ක්‍රියාවන් හා යෙදෙන පද ඒ කර්තෘාදි වස්තුව හා සම්බන්ධ කිරීමට ද චයන්ත යෙදේ, ඒ චයන්ත අන්වාචයාර්ථ නම් වේ. ඒ චයන්තෙන් යුත් පදද සමාස නොවෙත්. "ත්වං ගාමං ච ගච්ඡ භණ්ඩං ච ආනෙහි" (උඹ ගමට ද පලයන් බඩුත් ගෙණ වරෙන්.] මෙහි "ගච්ඡ ආනෙහි" යන ක්‍රියාවය භින්නාර්ථ වේ. එබැවින් එහි චයන්ත සමග යෙදුන "ගාමං, භණ්ඩං" යන පදද්වය සමාස නොවීය.

පද කීපයක් එකතු කොට එක් ක්‍රියාවක් හා සම්බන්ධ කිරීම සඳහා යෙදෙන චයන්ත සමාහාරාර්ථයි. ඒ චයන්තෙන් යුත් පදයෝ සමාස වෙත්. එසේ සමාහාරාර්ථ වශයෙන් සමාසවූ තන්හි නපුංසකලිඞ්ග හා එකවචන වේ.

සො ගීතං ච වාදිතං ච අසොසි-සො ගීතවාදිතං අසොසි. (හෙතෙමේ ගීත වාදිත සමූහය ඇසීය.)

ඩංසා ච මකසා ච තං ඩසිංසු=ඩංසමකසං තං ඩසි (මැසි මදුරු සමූහය ඔහු ඩැහැගත්තේය.)

සමහාර චන්‍දයෙහි උදාහරණ මේ ආදි වශයෙන් දත යුතුයි. එකාර්ථ ක්‍රියා කීපයක් හා පද කීපයක් වෙන් වශයෙන් සම්බන්ධ කිරීමට යෙදෙන චයන්ත ඉතරෙතර යොගාර්ථයි. ඒ චයන්තෙන් යුත් පදයෝ ද සමාස වෙත්.

"සාරිපුත්තො ච මොග්ගල්ලානො ච බුද්ධස්ස අග්ගසාවකා අහෙසුං" යන වාක්‍යය සමාස වීමෙන් "සාරිපුත්ත මොග්ගල්ලානා බුද්ධස්ස අග්ගසාවකා අහෙසුං" යනු වේ. (සැරියුත් මුගලන් දෙදෙනා වහන්සේලා බුදුන්ගේ අගසව් වූහ) යනු අර්ථයි. ඉතරෙතර යොගාර්ථ වශයෙන් සමාසවූ තන්හි සමාස පදය බහුවචන වේ. එහි ලිඞ්ගය වනාහි පරපදයෙහි ලිඞ්ගයයි.

## සමාහාරාර්ථ වශයෙන් සමාසවන නාම.

"චක්ඛු සොත මුඛ නාසිකා" ආදි ප්‍රාණි අවයව වාචක නාමයෝ ද, "යුග නඞ්ගල ඵාල පාචන" ආදි කෘෂි භාණ්ඩාවයව වාචක නාමයෝ ද, "හත්ථි අස්ස අසි චම්ම" ආදි සෙනාවයව වාචක නාමයෝ ද, "ඩංස මකස කුන්ථ කිපිල්ලික" ආදි ක්‍ෂුද්‍රප්‍රාණි වාචක නාමයෝද, "අහි නකුල බිළාර මූසික" ආදි විවිධ විරුද්ධ නාමයෝ ද. "නාම රූප සිරි ඔත්තප්ප" ආදි විසභාග නාමයෝ ද, "දසි දස පත්ත චීවර' ආදි භින්නලිඞ්ග නාමයෝ ද, "දුක තික චතුක්ක පචක" ආදි සඞ්ඛ්‍යා පරිමාණ වාචක නාමයෝ ද, "ඔරබ්භික සූකරික සාකුන්තික මාගවික" ආදි ලුද්දක (වැදි) වාචක නාමයෝ ද, "පුබ්බ අපර දක්ඛිණ උත්තර" ආදි දිශාවාචක නාමයෝ ද. සමාහාර වශයෙන් සමාස වෙත්.

## සමාහාර හා ඉතරෙතරයොග වශයෙන් සමාසවන නාම

"අස්සත්ථ කපිත්ථ" ආදි වෘක්‍ෂවාචක නාමයෝ ද, "උසීර බීරණ" ආදි තෘණවාචක නාමයෝ ද, "ගො මහිස" ආදි පසු වාචක නාමයෝ ද, "හිරඤ්ඤ සුවණ්ණ" ආදි ධනවාචක නාමයෝ ද, "සාලි යව" ආදි ධාන්‍යවාචක නාමයෝද "කාසී කොසල" ආදි ජනපද වාචක නාමයෝ ද, සමාහාර වශයෙන් ද ඉතරෙතරයොග වශයෙන් ද සමාස වෙත්. මෙසේ සමාස වන්නාවූ තවත් නාමයෝද ඇත්තාහ. සමාහාර වශයෙන්වූ තන්හි නපුංසකලිඞ්ග හා එකවචන බව ද, ඉතරෙතර යොගතන්හි බහුවචන බැව්ද දතයුතුයි.

මේ සමාසයෙහි අල්පස්වරනාම මුල්පද කොට යෙදීම කටයුතුයි. පදවයේම ස්වර සංඛ්‍යාව සම නම් එබඳු තන්හි ඒ නාමවයෙන් ප්‍රධාන නාමය ද, දෙකම ප්‍රධාන වශයෙන් ගිණිය හැකි නම් ඉවණ්ණාන්ත උවණ්ණාන්තනාමද ආදිපද කොට යෙදීමද කටයුතුයි.

| 1 | 2 | 3 | 4 | 5 | 6 |
|---|---|---|---|---|---|
| ගහඨ | උපොසථ | සාමණෙර | නාසිකා | මනුස්ස | ත්වං |
| පච | අඨ | දස | කණ්ණ | දෙව | බුද්ධ |
| සීල | සීල | සීල | ඉන්ද්‍රිය | බුද්ධ | සඞ්ඝ |
| නිච්ච | සීල | නිච්ච | වය | පාද | ච |
| සීල | නාම | සීල | එච | කමල | වන්ද |

මේ වාක්‍ය සයෙහි ක්‍රියා නැති තන්හි ඊට සුදුසු ක්‍රියාවන් යොදා සමාසයට සුදුසු තැන් සමාස කොට විභක්ත්‍යන්ත රහිත නාම වාක්‍යයට ගැළපෙන සේ විභක්ත්‍යන්ත කිරීමෙන් සර සට ලියනු.

---

41 පාඩම.

## ක්‍රියාවාචක කිතක

## 38. අනාකණීත්වාතුමන්තාදීහු ද ක්‍රියාවාචක කිතකයෝයි.

'අන, අක, ණී, ත්වා, තුං'' ආදිය අන්ත කොට ඇති කිතකයෝ ද ක්‍රියාවාචක කිතක වෙත්. මෙහි ''අන අක'' යන දෙක ව්‍යාකරණ යන්හි 'යු ණ්වු''යි ප්‍රකාශිතයි. ''අන අක'' යනු ඒ දෙකට වූ ආදෙශයි.

''අන'' යන්න සියලු ධාතු කෙරෙන් සියලු කාරකයන්හිද භාවයෙහි ද යෙදේ. එහෙත් බොහෝ සෙයින් භාවයෙහි වේ. එබැවින් භාෂානුසාරයෙන් දතයුතුයි. ''අක'' ආදි සතර සියලු ධාතූන් කෙරෙන් කත්තෘකාරකයෙහි වෙත්. ''ණී'' ප්‍රත්‍යය ශීලාර්‍ථ වශයෙන් ද යෙදේ. කත්තෘකාරයෙහි යෙදෙන ''අන'' යන්න ද ''ශබ්දාර්‍ථ, ක්‍රොධාර්‍ථ, චලනාර්‍ථ, භූෂණාර්‍ථ'' ධාතු කෙරෙන් හා ''රුච ජුත වඩ්ඪ'' ආදි ඇතැම් ධාතු කෙරෙන් යෙදෙන කල්හි ශීලාර්‍ථ වශයෙන්ද යෙදේ. ''ත්වා'' ප්‍රත්‍යයාන්තයෝ පූර්‍වක්‍රියායි. ''තූන, ත්වා'' දෙක ද පූර්‍වක්‍රියා ප්‍රත්‍යයයි. පූර්‍වක්‍රියා නම් අ රක්‍රියාවෙන් පෙර කරණ ක්‍රියායි.

“පුරිසො භුත්වා සෙති, පුරුෂ තෙමේ අනුභව කොට හොවී) ආදි වශයෙනි. “තුං” ප්‍රත්‍යයාන්තය නම් අපර ක්‍රියාවෙන් පසු කරණ ක්‍රියා විශෙෂයෙකි. “පුරිසො භුඤ්ජිතුං ගච්ඡති, (පුරුෂතෙමේ අනුභවකරන්නට යේ.) මේ ආදි වශයෙනි, මෙහි “භුඤ්ජිතුං” යන භොජනක්‍රියාව සිඬවන්නේ “ගච්ඡති” යන ගමන ක්‍රියාවෙන් පසුවයි. “තවෙ” ප්‍රත්‍යය ද ඒ වෙනුවට යෙදෙන ප්‍රත්‍යයෙකි. මේ දෙකොටසම නිපාතයි. එබැවින් මොවුන් කෙරෙන් විභක්ති නොයෙදෙත්. “ණී” ප්‍රත්‍යයෙන් ගැණෙන්නේ ඊයන්තයි.

කාලවශයෙන් මේ ප්‍රත්‍යයාන්තයෝ ත්‍රිකාලිකයි. (තුං ප්‍රත්‍යය අනාගතයයි කියත්.) ලිඞ්ගවශයෙන් කත්තෘකාරකය හැර සෙසු තන්හි වූ “අන” අන්තයෝ බොහෝසේ නපුංසක ලිඞ්ගයි. කත්තෘකාරක තන්හි ත්‍රිලිඞ්ගයි. “අක ණී” අන්තයෝ ත්‍රිලිඞ්ගයි.

## උදාහරණ.

| ධාතු. | අන. | අක. | ණී | ත්වා | තුං |
|---|---|---|---|---|---|
| භූ | භවන | භාවක | භාවී | භවිත්වා | භවිතුං |
| ඨා | ඨාන | තිට්ඨක | ඨායී | ඨත්වා | ඨාතුං |
| සි | සයන | සායක | සායී | සයිත්වා | සයිතුං |
| වස | වසන | වාසක | වාසී | වසිත්වා | වසිතුං |
| කර | කරණ | කාරක | කාරී | කත්වා | කාතුං |
| ගම | ගමන | ගාමක | ගාමී | ගන්ත්වා | ගන්තුං |
| භාස | භාසන | භාසක | භාසී | භාසිත්වා | භාසිතුං |
| සු | සවණ | සාවක | සාවී | සුත්වා | සොතුං |
| ගහ | ගහණ | ගාහක | ගාහී | ගහෙත්වා | ගහෙතුං |
| ඤා | ජානන | ජානක | ඤායී | ඤත්වා | ඤාතුං |
| පූජ | පූජන | පූජක | පූජී | පූජෙත්වා | පූජිතුං |
| ඡිද | ඡින්දන | ඡේදක | ඡේදී | ඡින්දිත්වා | ඡින්දිතුං |
| ඡද | ඡාදන | ඡාදක | ඡාදී | ඡාදිත්වා | ඡාදිතුං |
| ආස | ආසන | ආසක | ආසී | ආසිත්වා | ආසිතුං |
| වම | වමන | වමක | වාමී | වමිත්වා | වමිතුං |
| ලභ | ලභන | ලාභක | ලාභී | ලභිත්වා | ලභිතුං |
| දා | දාන | දායක | දායී | දත්වා | දාතුං |
| පා | පාන | පායක | පායී | පීත්වා | පාතුං |
| පච | පචන | පාචක | පාකී | පචිත්වා | පචිතුං |
| භුජ | භුඤ්ජන | භුඤ්ජක | භොජී | භුත්වා | භොත්තුං |

සෙසු ධාතූන් කෙරෙන් මේ ප්‍රත්‍යයන් වීමෙන් සිඩවූ කිතකය ද මේ අනුසාරයෙන් දතයුතුයි. මේ ධාතු කෙරෙන් මේ ප්‍රත්‍යයන් වීමෙන් මීට වෙනස්ව සිඩවූ ඇතැම් කිතකයෝ ඇත්තාහ. ඔවුන්ද භාෂානුසාරයෙන් දතයුතුයි.

තවද "අන"යන්න අන්තකොට ඇති ඇතැම් කිතකයෝ "භාවනා, දෙසනා, වෙදනා" ආදි වශයෙන් ආකාරාන්ත ස්ත්‍රීලිඞගවූවෝ ද වෙත්. "අක" යන්න අන්තකොට ඇති කිතක ස්ත්‍රීලිඞගයෙහි යෙදෙන කල්හි "ක" යන්නට ආදි යෙහි වූ අයන්නට ඉයන්න වීමෙන් "භාවිකා" ආදි වශයෙන් ද ණීප්‍රත්‍යයාන්ත කිතක "භාවිනී" ආදි වශයෙන් ද ස්ත්‍රීලිඞගයෙහි යෙදෙත්.

---

42 පාඩම.

## ක්‍රියාවාචකකිතකයන්ගේ යොගයෙහි යෙදෙන විශෙෂවිභක්ති.

කම්මකාරක "ත" ප්‍රත්‍යයාන්තයන්ගේ යොගයෙහි යෙදෙන කර්තෘ තෘතීයාවෙන් යෙදේ. එහෙත් "පූජාර්ථ ධාතු ඉච්ඡාර්ථධාතු අවබොධාර්ථධාතු" ආදි ඇතැම් ධාතූන්ගෙන් සිඩ කම්ම කාරක "ත" ප්‍රත්‍යයාන්තයන්ගේ යොගයෙහි අනුක්ත කර්තෘ වෙනුවට ෂෂ්ඨී විභක්තිය ද යෙදේ. "රඤ්ඤො පූජිතො ධම්මො, (රජ විසින් පුදනුලබන ධර්මයයි.) "රඤ්ඤො සම්මතා ආණා (රජ විසින් කැමැතිවනු ලබන අණවයි.) යන ආදි වශයෙනි. මෙහි 'රඤ්ඤො" යනු කර්ත්‍රර්ථයෙහි ෂෂ්ඨීයි. මෙහි "රඤ්ඤා"යි තෘතීයාව ද යෙදේ. මෙහි "ත" ප්‍රත්‍යය වර්තමාන කාලිකයි.

"තු' ප්‍රත්‍යයාන්තයාගේ යොගයෙහි යෙදෙන අනුක්ත කර්මය ද බොහෝ තන්හි ෂෂ්ඨියෙන් යෙදේ. ඒ පෙර කියනලදි. "අක" අන්තයන්ගේ යොගයෙහි යෙදෙන අනුක්ත කර්තෘ ද ෂෂ්ඨියෙන් යෙදේ. "දුක්ඛස්ස කාරිකා තණ්හා" (තෘෂ්ණාව දුක් කරන්නියක් වේ.) යන ආදි වශයෙනි. මෙහි "කාරිකා" යන "අක" අන්තයොගයෙහි "දුක්ඛස්ස" යනු කර්මාර්ථයෙහි ෂෂ්ඨීයි.

භාවාර්ථ කිතකයන්ගේ යොගයෙහි යෙදෙන කර්මය හෝ කර්තෘ බොහෝසේ ෂෂ්ඨියෙන් යෙදේ. ' ධම්මස්ස සවණං හිතං භවති (ධර්මය ඇසීම හිත වේ.) "තස්ස ගමනං මහප්ඵලං භවති" (ඔහුගේ යාම මහත්ඵල වේ) යනාදි වශයෙනි. මෙහි "සවණං ගමනං' යන භාවාර්ථ කිතක යොගයෙහි "ධම්මස්ස" යනු කර්මාර්ථයෙහි ද "තස්ස" යනු කර්තෘාර්ථයෙහි ද ෂෂ්ඨියි. එබඳු එක් කිතකයක්හුගේ යොගයෙහි කර්මය හා කර්තෘ එකවිට යෙදෙන තන්හි කර්මය පමණක් ෂෂ්ඨියෙන් යෙදේ. කර්තෘ තෘතීයාවෙන් යෙදේ. "හිතං සබ්බෙහි ධම්මස්ස සවණං" (සියල්ලන් විසින් ධර්මය ඇසීම හිත වේ) යන ආදි වශයෙනි.

යම් තැනෙක්හි කත්තුකාරක හෝ කම්මකාරක කිතක පදයකින් අන්‍ය ක්‍රියාසිද්ධි සවනාවයක් හැගේ නම් එහි ඒ කිතකයෙන් උක්තවන්නා වූ (කියවෙන්නා වූ) කර්මය හෝ කර්තෘ ද ඒ කිතක පදය ද සත්තමියෙන් යෙදේ. "දෙවෙ වස්සන්තෙ චොරෙ ආගතො" (වැසි වසිද්දී සොරු ආයේය.) මෙහි "වස්සන්තෙ" යන කිතකයොගයෙහි එයින් උක්තවූ "දෙවෙ" යන කර්තෘ ද "වස්සන්තෙ" යන කිතකය ද සත්තමියි. "භගවතා ධම්මචක්කෙ පවත්තිතෙ දෙවා සද්දමනුස්සාවෙසුං" (භාග්‍යවතුන් වහන්සේ දම්සක් පැවැත්වූ කල්හි දෙවියෝ ශබ්දානුශ්‍රාවණය කළාහ.) මෙහි "පවත්තිතෙ" යන කර්මකාරක කිතකයොගයෙහි එයින් උක්ත කර්මය වූ "ධම්මචක්කෙ" යනු ද ඒ කිතකය ද සප්තමියි. මෙසේ යෙදෙන සත්තමිය භාවසත්තමියයි කියනු ලැබේ. (සිංහල භාෂා ව්‍යවහාරයෙහි මෙබඳු තන්හි යෙදෙන්නේ කම්චබත් රූපයයි.)

"ත්වා, තුං" ප්‍රත්‍යයාන්ත කිතකයෝ කත්තුකාරකයයි කියනු ලැබෙත්. එබැවින් ඔවුන් හා යෙදෙන කර්මය විතීයාවෙන් හා කර්තෘ ප්‍රථමාවෙන් යෙදීම යුතු වේ. එහෙත් ඒ කිතකයෝ වාක්‍යවිෂයෙහි අප්‍රධාන වෙත්. එහෙයින් ප්‍රධාන ක්‍රියාපදය අපෙක්ෂා කොට කර්මයන් යෙදීම නියමයයි, ඒ නියමය ලෙස යොදන කල්හි ප්‍රධාන ක්‍රියාව කර්ම කාරකවූ කල්හි ඒ අපෙක්ෂා කොට කර්තෘකර්මයෝ යෙදෙත්.

"භික්ඛූහි ධම්මො බුජ්ඣිත්වා භාසිතබ්බො" (භික්ෂූන්විසින් ධර්මය දැන කියයුතුයි.) 'ධම්මො භාසිතුං බුජ්ඣිතබ්බො" (ධර්මය කියන්නට අවබොධ කටයුතුයි.)

මේ වාක්‍යවයෙහි "භාසිතබ්බො, බුජ්ඣිතබ්බො" යන කිතකක්‍රියාපදදෙක ප්‍රධාන වේ, හේ කර්මකාරකයි, එබැවින් ඒ හා යෙදුන කර්මය "ධම්මො" යනුයි, ඒ උක්තකර්මයි. එහෙයින් ප්‍රථමායි. "භික්ඛූහි" යනු අනුක්තකර්තෘයි. එහෙයින් තෘතීයායි. මෙහි "බුජ්ඣිත්වා, භාසිතුං" යන 'ත්වා තුං" ප්‍රත්‍යයාන්ත දෙක අපෙක්ෂා කොට ඒ දෙක නොයෙදුනේයි.

"උපාසකෙන ධම්මං සුත්වා සද්ධා පටිලද්ධා"(උපාසකයා විසින් ධර්මය අසා ශ්‍රද්ධාව ලබනලදි.) "ධම්මං සොතුං සද්ධා පටිලද්ධා (ධර්මය අසන්නට ශ්‍රද්ධාව ලබනලදි.)

මේ වාක්‍යවයෙහි "පටිලද්ධා" යන ප්‍රධාන පදය හා "ධම්මං" යන පදයාගේ සම්බන්ධයක් නැත්තේයි. ඒ වනාහි "සුත්වා, සොතුං" යන 'ත්වා,තුං" ප්‍රත්‍යයාන්තවය හා සම්බන්ධයි එබැවින් එහි ද්විතීයායි. කර්තෘපදය ඒ දෙකම හා සම්බන්ධයි. එබැවින් ප්‍රධාන පදය බලා අනුක්ත කර්තෘ විය. ආඛ්‍යාතපද යන්ගේ ප්‍රධානත්වය ඇති තන්හි ද මෙසේයි. 'භික්ඛූහි ධම්මො බුජ්ඣිත්වා භාසීයතෙ'' (භික්ෂූන් විසින් ධර්මය දැන කියනු ලැබේ.) "උපාසකෙන ධම්මං සුත්වා සද්ධා පටිලභීයිත්ථ" (උපාසකයා විසින් ධර්මය අසා ශ්‍රද්ධාව ලබනු ලැබී) යනාදී වශයෙනි.

පින්කිරීම සියල්ලන්ගේ මෙලොව ද පරලොව ද හිත පිණිස වේ.

පින්කරන්නෝ මරණින්මතු ස්වර්ගයට පැමිණෙන්නාහ.

සියල්ලන් විසින් නිතර දුසිරි මෙනෙහි කොට හළයුතුයි.

සියල්ලන් විසින් මනා පිළිවෙත වඩන්නට උගෙණිය යුතුයි.

මනාපිළිවෙත වැඩූකල්හි සියල්ලන්ටම මෙලොවද පරලොවද සුවලැබේ.

මේ වාක්‍යයෝ පාළියෙන් ලිවියයුතුයි--මෙලොව (ඉහ) පරලොව (පරත්‍ර) මතු (පර) දුසිරි (දුච්චරිත) මෙනෙහි කොට (මනසිකත්‍වා) හළයුතු (ජහිතබ්බ) මනා පිළිවෙත (සම්මාපටිපත්ති) වඩන්නට (වඩ්ඪෙතුං.)

---

43 පාඩම.

## උණාදි කිතක.

---

## 39. ණු ථ ම ඉ ත ත්‍රාදීහු උණාදි කිතකයෝයි.

භාෂාවෙහි ක්‍රියාවාචක නුවූ කිතකයෝ අප්‍රමාණ වෙත්, ඔවුහුද ධාතුප්‍රත්‍යය සංයොගයෙන් ෂට්කාරකයට ඇතුළත්වම සිඩයි. ඔවුන් පිළිබඳ ප්‍රත්‍යයෝ ද බොහෝයි. එනම් "ණු ථ ම ඉ ත ත්‍ර" ආදීහුයි. ඔවුන්ගේ කාරක භෙදය ඒ ඒ නාමයන්ගේ අර්ථයට අනුරූප පරිද්දෙන් දතයුතුයි. නාමයන්ගේ ඒ කාරක භෙදය නොදන්නවුන්ට අර්ථය මනාසේ සඵුට නොවේ. මෙහි "ණු" යන්නෙන් "උ" ගණු ලැබේ.

**පච්චය.ධාතු.විග්ගහ නාම　　අර්ථ.**

ණු-කර-කරොතීති=කාරු 1 (කෙරේනුයි කාරුනම්.)

,,-සාධ-සාධියතෙ අනෙනාති=සාධු 3 (මෙයින් සිද්ධ කරණු ලැබේනුයි සාධු නම්.)

,,-චක්ඛ-චක්ඛතීති=චක්ඛු. 1 (බලානුයි චක්ඛුනම්.)

,,-දර-දරීයතීති=දාරු. 2 (පලනුලැබේනුයි දාරුනම්.)

ථ -සම-කිලෙසෙ සමෙතීති=සමථො. 1 (කෙලෙස් සංසිඳුවානුයි සමථනම්.)

,,-වස-ආවසනති එත්ථාති=ආවසථො. 6 (මෙහි වෙසේනුයි ආවසථ නම්.)

ම -භී-භායනති එතස්මාති=භීමො. 5 (මොහුගෙන් භීත වෙනුයි භීම නම්.)

**පච්චය. ධාතු. විග්ගහ. නාම. අර්ථ.**

**ම**-ධු-ධුනාතීති=**ධූමො**. 1 (සෙලවේනුයි ධූම නම්.)
,,-**ලු**-ලුයතීති=**ලොමො**. 2 (කපනු ලැබේනුයි ලොම නම්.)
,,-**සි**-සියතීති=**සිමා**. 2 (බඳිනු ලැබේනුයි සීමා නම්.)
**ඉ**-**මුන**-මුනාතීති=**මුනි**. 1 (දනීනුයි මුනි නම්.)
,,-**යත**-යතතීති=**යති**. 1 (උත්සාහ කෙරේනුයි යති නම්.)
,,-**අඟ**-අඟතීති=**අග්ගි**. 1 (කුටිලව යේනුයි අග්ගි නම්.)
,,-**රුච**-රොචතීති=**රුචි**. 1 (බබලානුයි රුචි නම්.)
,,-**කු**-කවතීති=**කවි**. 1 (ශබ්දකෙරේනුයි කවි නම්.)
**ත**-**ත්‍ර**-**ඡද**-ආතපං ඡාදෙතීති=**ඡත්තං**-**ඡත්‍රං**. 1 (අව්ව වසානුයි ඡත්ත හෝ ඡත්‍ර නම්.)
,, ,,-**සු**-සුණාතීති=**සොතං**-**සොත්‍රං**. 1 (අසානුයි සොත හෝ සොත්‍ර නම්.)
,, ,,**නී** නෙතීති=**නෙත්තං**=**නෙත්‍රං**. 1 පමුණුවානුයි නෙත්ත හෝ නෙත්‍ර නම්.)
,, ,,**පත**-පතති එත්ථාති=**පත්තං**-**පත්‍රං**. 6 (මෙහි වැටේනුයි පත්ත හෝ පත්‍ර නම්.)
,, ,, **දා**-දීයති එතෙනාති=**දාත්තං**-**දාත්‍රං**. 3 (මෙයින් කපනු ලැබේනුයි දාත්ත හෝ දාත්‍ර නම්.)
,, ,,**මිද**-මිදතීති=**මිත්තො**-**මිත්‍රො**. 1 (සෙනහ කෙරේනුයි මිත්ත හෝ මිත්‍ර නම්.)
,, ,, **පු**-පුණාතීති=**පවිත්තං**-**පවිත්‍රං**. 1 (පිවිතුරු කෙරේනුයි පවිත්ත හෝ පවිත්‍ර නම්.)

මෙසේ සිඩවූ නාමයන්ගේ ලිඞගනියමය භාෂානුසාරයෙන්ම මුත් අන්විදියකින් දතහැකි නොවේ.

මෙහි 1 අඞකයෙන් ලකුණු කරණ ලද පද කත්තුකාරක යයි ද, 2 අඞකයෙන් ලකුණු කරණ ලද පද කම්මකාරක යයි ද, 3 අඞකයෙන් ලකුණු කරණ ලද පද කරණකාරක යයි ද, 5 අඞකයෙන් ලකුණු කරණ ලද පදය අපාදානකාරක යයි ද, 6 අඞකයෙන් ලකුණු කරණ ලද පද ආධාරකාරක යයි ද දතයුතුයි.

44 පාඩම.

## බහුබ්බීහිසමාසය.

## 40 අන්‍යපදාපෙක්ෂාවෙන්වූ සමාසය බහුබ්බීහි නම්.

සමාසවූ පදයන්ගෙන් අන්‍යපදාර්ථයක් අපෙක්ෂාකොට කරණලද සමාසය බහුබ්බීහි නම් වේ. සමාසවූ පදයෙන් ඒ අන්‍යපදාර්ථය උක්තවේ (කියවේ.)

ඒ උක්තපදාර්ථයෝ වනාහි "කම්ම කත්තු කරණ සම්පදාන අපාදාන ආධාර සම්බන්ධ" යන මේ අර්ථයෝ වෙත්. එහි-යම් සමාසයකින් ඒ සමාසවූ පදයකට කර්මවූවක් කිය වේ නම් ඒ සමාසය කර්මාර්ථ වේ. "ආගතා සමණා යං විහාරං=සො විහාරො ආගතසමණො හොති" (ශ්‍රමණයෝ යම් විහාරයකට පැමිණියාහු නම් ඒ විහාරය "ආගතසමණ' නම් වේ.) මෙහි සමාසවූ පද දෙක 'ආගතා සමණා" යනුයි. එහි "ආගතා" යනු කත්තුකාරක කිතකයි. "සමණා" යනු එහි කර්තෘපදයි. එහි කර්මය අපෙක්ෂාකොට ඒ දෙක සමාසවීමෙන් "ආගතසමණ" නම් විය. "ආගතසමණ" නම් ශ්‍රමණයන්ගේ ආගමනයට කර්මවූ විහාරාදි ස්ථානයෙකි. ඒ වනාහි සමාසවූ පදයන්ගේ අර්ථයෙන් අන්‍යවූවකි. සෙසු අර්ථයෝද මේ ක්‍රමයෙන් දත යුත්තාහ.

මේ සමාසයෙහි සමාසවූ නාමය කවර ලිඞ්ගයෙක්හි නාමයක් වුවත් සමාසවූ පසු අන්‍යපදයාගේ ලිඞ්ගය ලබයි.

### උදාහරණ.

| සමාසයොග්‍යවාක්‍ය. | සමාසපද. | අන්‍යපද. |
|---|---|---|
| 1 කම්ම-පටිපන්නා අද්ධිකා යං- | සො පටිපන්නද්ධිකො- | ගාමො |
| 2 කත්තු-ජිතානි ඉන්ද්‍රියානි යෙන- | ,, ජිතින්ද්‍රියො | මුනි |
| 3 කරණ-ඡින්නාරුක්ඛා යෙන- | ,, ඡින්නරුක්ඛො- | ඵරසු |

4 **සම්පදාන**-උපනීතං
භොජනං යස්ස-සො උපනීතභොජනො භික්ඛු

5 **අපාදාන**- අපගතා සිස්සා
යාය- සා අපගතසිස්සා- පාඨසාලා

6 **ආධාර**- සුලභො පිණ්ඩො
යස්මිං- තං සුලභපිණ්ඩං- නගරං

7 **සම්බන්ධ**-මහන්තානි
ධනානි යෙසං - තෙ මහද්ධනා- සෙට්ඨිනො

මෙහි 1...වාක්‍යයෙන් මාර්ගිකයන්ගේ පිළිපැදීමට කාමීවූ ග්‍රාමයද, 2...ඉන්ද්‍රියයන් දිනීමෙහි කතීවූ මුනිද. 3...වෘක්ෂයන් කැපීමට කාරණවූ එරසුවද, 4..භොජනය එලවාදීමට යොග්‍යවූ භික්ඛුද, 5...ශිෂ්‍යයන්ගේ පහවයාමට ඉම්වූ පාඨශාලාවද, 6...සුලභවූ පිණ්ඩභොජනයට ආධාරවූ නගරයද 7...මහත්වූ ධනයට හිමිවූ සෙඨිද උක්ත වේ. ඒ අන්‍යපදයි.

මේ සමාසයෙහිවූ සමාසපද "ඇති" යන අර්ථයෙන් යුක්තයි. "පටිපන්නාද්ධිකො" පිළිපන් මාර්ගිකයන් ඇති ආදි වශයෙනි. මේ සමාසයෙහි සමාසපදයෙන් හැඟෙන අර්ථය වාක්‍යයෙහි නැත්තේයි. එබැවින් මේ සමාසය නිත්‍ය සමාසයි. යම් සමාසයෙක්හි වාක්‍යය හා සමාසපදය යන දෙකම එකාර්ථ නම් ඒ සමාසය අනිත්‍ය සමාසයි. "රඤ්ඤො පුරිසො= රාජපුරිසො" මෙහි "රඤ්ඤො පුරිසො" යනු වාක්‍යයි. "රාජ පුරිසො"යනු සමාසපදයි. දෙක්හිම අර්ථය එකයි. "පටිපන්නා අද්ධිකා යං"යන වාක්‍යයෙහි අර්ථය නම්"යමකට මාර්ගිකයෝ පිළිපන්නාහුද" යනුයි. "පටිපන්නාද්ධිකො" යන සමාස පදයෙහි අර්ථය "පිළිපන් මාර්ගිකයන් ඇති" යනුයි.

මේ සමාසය වනාහි උපමා උපමෙය පදයන්ගෙන්ද සිද්ධයි "චන්දො විය මුඛං යස්ස සො=මුඛචන්දො (සඳ වැනි මුව ඇති)ආදි වශයෙනි. ඇතැම් තන්හි නිපාත සමගද සමාස වේ. "නත්ථි මතං යස්මිං තං=අමතං (මැරීම නැතිතැනයි.) මේ ආදී වශයෙනි.

ඇතැම් තන්හි භින්නාධිකරණපදයෝ ද සමාස වෙත්. "චක්කං පාණිම්හි යස්ස සො=චක්කපාණි" (අතෙහි චක්‍රායුධය ඇත්තේයි.) ආදි වශයෙනි. මෙහි "චක්කං පාණිම්හි" යන දෙක භින්නාධිකරණයි. මේ සමාසයෙහි ඇතැම් තන්හි පද දෙකට වැඩි ගණනක්වුවත් සමාසවේ. "මත්තා බහවො මාතඞ්ගා යස්මිං තං=මත්තබහුමාතඞ්ගං- වනං" (මත්වූ බොහෝ ඇතුන් ඇති වනයයි) මෙහි පද තුණෙකි.

මේ සමාසයෙහිදු ස්ත්‍රී ලිඞ්ගයන්ගේ පුංලිඞ්ගරූපවීම කම්මධාරයෙහි කී ක්‍රමයෙන් දතයුතුයි. "විසිට්ඨා පඤ්ඤා යස්ස සො-විසිට්ඨපඤ්ඤො" යනාදි වශයෙනි. මේ සමාසය 'තග්ගුණසංවිඤ්ඤාණ, අතග්ගුණසංවිඤ්ඤාණ" යයි දෙකට බෙදේ. යම්තැනෙක්හි සමාසවූ පදයන්හි ඇති ගුණයෙන් අන්‍යපදය හැඳිනේ නම් ඒ 'තග්ගුණසංවිඤ්ඤාණ" යයිද එසේ නොහැඳිනේ නම් ඒ අතග්ගුණසංවිඤ්ඤාණයයිද දතයුතුයි. "ලම්බකණ්ණො, අතික්කන්තසාගරො" යනාදි වශයෙනි. එල්බෙන කන් ඇත්තේ "ලම්බකණ්ණ" නමි. ඒ ගුණයෙන් එසේ ඇත්තේ හැඳිනේ. අතික්‍රමණය කළ සාගරය ඇත්තේ "අතික්කන්තසාගර" නමි. එබඳු තැනැත්තේ ඒ ගුණයෙන් නොහැඳිනේ. මේ සමාසයෙහි තවත් බොහෝ භෙදයෝ වෙත්. ඒ භෙදයන් මේ අනුසාරයෙන් දතයුතුයි.

45 පාඩම.

**අබ්‍යයීභාවසමාසය.**

## 41 අව්‍යයාර්ථ ප්‍රධානත්වයෙන් තත්පූර්වක සමාසය අබ්‍යයීභාවයි.

අව්‍යයයෝ නම් උපසර්ග හා නිපාතයි. ඔවුන්ගේ ඒ ඒ අර්ථයන් ප්‍රධානවීමෙන් පූර්වපදව සිට සිද්ධවූ සමාසය අබ්‍යයීභාවයයි කියනු ලැබේ.

අව්‍යය ශබ්දයන්ගේ අර්ථයෝ අප්‍රමාණ වෙත්. මෙහි "විභත්ති, සමීප, අභාව, පච්ඡාභාග (පසුපැත්ත), යොග්ග

(සුදුසු) වීච්ඡා (වෙන් වෙන්වූ වස්තු එකට සම්බන්ධ කොට කියනු කැමැතිවීම), පටිපාටි (පිළිවෙළ) පරිච්ඡේද (පිරිසිඳීම) අන්තොභාග (ඇතුල් පැත්ත) බාහිර (පිටිපැත්ත) උද්ධභාග (උඩුපැත්ත) පුබ්බභාග (පෙරපැත්ත) සකලභාව (මුලුල්ල), අනතික්කම (නොඉක්මීම), යන මේ අර්ථ තෙළෙසෙහි පවත්නා අව්‍යයන්ගේ සමාසයෝ දක්වනු ලැබෙත්.

මෙහි සමාසවූ නාමයෝ නපුංසකලිඞ්ග වෙත්. එසේ වීමෙන් නාමාන්තයන්හි දීර්ඝස්වරයෝද හ්‍රස්ව වෙත්. මේ සමාසයෙහි වූ අකාරාන්ත නාමයන් කෙරෙන් සෙදෙන පඤ්චමී විභක්තිය හැර සෙසු විභක්තීන්ට "අං" ආදෙශ වේ. හෙද තතියා ඡට්ඨී සත්තමී තුණෙහි විකල්පයෙහි ඉකාරාන්තාදි නාමයන් කෙරෙන් පර විභක්තීන්ට ලොප් වේ.

## උදාහරණ

| අව්‍යය. | අර්ථ. | සමාසාර්ථවාක්‍ය. | සමාසපද | අර්ථ. |
|---|---|---|---|---|
| අධි | විභත්ති- | ඉත්ථියධිකිච්ච | අධිත්ථි | ස්ත්‍රිය කෙරෙහි |
| උප | සමීප - | නගරස්ස සමීපං | උපනගරං | නුවර සමීපය |
| නි | අභාව - | මකසානංඅභාවො | නිම්මකසං | මැස්සන් නැති |
| අනු | පච්ඡාභාග- | රථස්ස පච්ඡා | අනුරථං | රියට පසු |
| ,, | යොග්‍ය - | රූපස්ස යොග්‍යං | අනුරූපං | රූපයටයොග්‍ය |
| ,, | වීච්ඡා - | අද්ධමාසං අද්ධමාසං [අනු] | අන්වද්ධමාසං | අඩමසක් පාසා |
| යථා | පටිපාටි - | බුඩ්ඪානං පටිපාටි | යථාබුඩ්ඪං | මහලුපිළිවෙළ |
| යාව | පරිච්ඡේද- | ජීවස්ස පරිච්ඡෙදො | යාවජීවං | දිවිහිම් |
| අන්තො | අන්තොභාග- | නගරස්ස අන්තො | අන්තොනගරං | නුවරතුළ |

| | | |
|---|---|---|
| බහි | බාහිර - නගරස්ස බහි | බහිනගරං නුවරපිටත |
| උපරි | උද්ධභාග- පාසාදස්ස උපරි | උපරිපාසාදං පහයමතු |
| පුරෙ | පුබ්බභාග- භත්තස්ස පුරෙ | පුරෙභත්තං බතටපෙර |
| සහ | සකලභාව- සහ මක්ඛිකාය | සමක්ඛිකා මැස්සන් සහිත |
| යථා | අනතික්කම- සත්තිමනතික්කමම | යථාසත්ති ශක්තිය නොයික්ම |

අව්‍යයීභාවයද නිත්‍ය සමාසයෙකි. මේ සමාසයෙහි වූ පදයෝ අව්‍යය වශයෙන් සලකනු ලැබෙත්. මෙසේ සිද්ධවූ සෙසු සමාසයෝද මේ පිළිවෙළින් දතයුතුයි.

පුෂ්පයන්ගේ ගන්ධයෝ වාතය අනුව යෙත්.
ගඞ්ගාව සමීපයෙහි කෙත් ජලයෙන් වැනසෙත්.
ඒ මිනිස්සු බලය නොයික්ම ඒ කර්මය කළාහුය.
ඒ ස්ත්‍රීහු පහය තුළ සිටියාහුය.
ඒ මිනිස්සු ඇඳ මත්තෙහි හොවිත්.

මේ වාක්‍යයෝ සමාසයට සුදුසු තැන් සමාසකිරීමෙන් පාළියට පෙරළිය යුත්තාහ.

49 පාඩම.

### සඞ්ඛ්‍යාපූරණාර්ථ තද්ධිත.

## 42 තිය ථ ඨ ම ඊ ප්‍රත්‍යයාන්තයෝ සංඛ්‍යා පූරණාර්ථ තද්ධිතයෝයි.

යම් සඞ්ඛ්‍යාවකින් යම් ගණනක් පිරේ නම් ඒ පිරීමට ඉවහල්වූ සඞ්ඛ්‍යාවාචක නාමයා කෙරෙන් "තිය ථ ඨ ම ඊ" යන මේ ප්‍රත්‍යයෝ වෙත්. ඒ සඞ්ඛ්‍යාපූරණාර්ථ වශයෙනි.

එහි !'වි, ති' ශබ්දයන් කෙරෙන් "තිය" ප්‍රත්‍යයද, "චතු" ශබ්දයෙන් "ථ" ප්‍රත්‍යයද, "ඡ" ශබ්දයෙන් "ඨ" ප්‍රත්‍යයද අවිශෙෂයෙන් සෙසු ශබ්දයන් කෙරෙන් "ම" ප්‍රත්‍යයද,

"එකාදස" ශබ්දය පටන් "අට්ඨාදස" ශබ්දය තෙක් ඇති ශබ්ද යන් කෙරෙන් "ඊ" ප්‍රත්‍යයද වේ.

"ඊ" ප්‍රත්‍යයාන්තයෝ නියත ස්ත්‍රී ලිඞ්ගද සෙස්සෝ ත්‍රි ලිඞ්ගද වෙත්. 'තිය" ප්‍රත්‍යයාන්තයෝ ස්ත්‍රීලිඞ්ගයෙහි "දුතියා" ආදි වශයෙන් ආකාරාන්ත වෙත්.

### උදාහරණ.

| ප්‍රත්‍යය | තද්ධිතවාක්‍ය. | තද්ධිත. | අර්ථ. |
|---|---|---|---|
| තිය | ද්වින්නං පූරණො | දුතියො | දෙවන |
| ,, | තිණ්ණං ,, | තතියො | තුන්වන |
| ථ | චතුන්නං ,, | චතුත්ථො | සතරවන |
| ඨ | ඡන්නං ,, | ඡට්ඨො | සවන |
| ම | පඤ්චන්නං ,, | පඤ්චමො | පස්වන |
| ,, | සත්තන්නං ,, | සත්තමො | සත්වන |
| ඊ | එකාදසන්නං පූරණී | එකාදසී | එකොළොස්වන |

මෙහි "තිය" ප්‍රත්‍යය වූකල්හි "ද්වි, ති" දෙකට "දු, ත" ආදෙශයි. "ථ, ඨ" ප්‍රත්‍යය දෙක "ත්ථ, ට්ඨ" යි වීය.

### නිපාතතද්ධිත.

## 43 වාරවිභාගප්‍රකාර විභක්ත්‍යර්ථයන්හි වූ ක්ඛත්තුං ධාථාථංතොත්‍රථදාදීහූ නිපාත තද්ධිතයෝයි.

වාරාර්ථ, විභාගාර්ථ, ප්‍රකාරාර්ථ, විභක්ත්‍යර්ථයන්හි "ක්ඛත්තුං, ධා, ථා, ථං, තො, ත්‍ර, ථ, දා" ආදි ප්‍රත්‍යයෝ වෙත්. ඔවුහු නිපාත තද්ධිතයෝයි.

එහි වාරාර්ථයෙහි (වරක් යන අර්ථයෙහි) හා විභාගාර්ථයෙහි (කොටස් කිරීම් අර්ථයෙහි) සඞ්ඛ්‍යාවාචක නාමයන් කෙරෙන් "ක්ඛත්තුං ධා" යන ප්‍රත්‍යය දෙකද, ප්‍රකාරාර්ථයෙහි අවිශෙෂයෙන් සියලුම සර්වනාම කෙරෙන් "ථා"

ප්‍රත්‍යයද "කිං ඉම" ශබ්දයන් කෙරෙන් "ථං" ප්‍රත්‍යයද, පඤ්චමීවිභක්ත්‍යර්ථයෙහි සියලු නාම කෙරෙන් "තො" ප්‍රත්‍යයද, සර්වනාම කෙරෙන් සප්තමී විභක්ත්‍යර්ථයෙහි "ත්‍ර ථ" යන දෙකද "කිං සබ්බ අඤ්ඤ එක ය" යන මේ සර්වනාම කෙරෙන් "දා" ප්‍රත්‍යයද වේ. මෙසේවූ තවත් ප්‍රත්‍යයෝ බොහෝ වෙත්. භාෂානුසාරයෙන් දතයුතුයි.

"දා" ප්‍රත්‍යය වනාහි කාලවාචක සප්තමි විභක්ත්‍යර්ථයෙහි වේ. 'තො" ප්‍රත්‍යය ඇතැම් තන්හි සප්තම්‍යර්ථයෙහිද වේ. (ඒ වනාහි සෙසුවිභක්ත්‍යර්ථයන්ට ද සාධාරණ වේ.

උදාහරණ.

| ප්‍රත්‍යය. | වාක්‍යය. | නිපාතතද්ධිත. | අර්ථ. |
|---|---|---|---|
| ක්ඛත්තුං | එකං වාරං | එකක්ඛත්තුං | එක්වරක් |
| ධා | එකෙන විභාගෙන | එකධා | එක්පරිද්දෙකින් |
| ථා | සබ්බෙන පකාරෙන | සබ්බථා | සර්වප්‍රකාරයෙන් |
| ථං | කෙන පකාරෙන | කථං | කවරප්‍රකාරයකින් |
| ,, | ඉමිනා පකාරෙන | ඉත්ථං | මේ ප්‍රකාරයෙන් |
| තො | ධම්මස්මා | ධම්මතො | ධර්මය කෙරෙන් |
| ,, | ආදිස්මිං | ආදිතො | ආදියෙහි |
| ත්‍ර | සබ්බස්මිං | සබ්බත්‍ර | සියල්ල කෙරෙහි |
| ථ | ,, | සබ්බත්ථ | ,, ,, |
| දා | සබ්බස්මිං කාලෙ | සබ්බදා | සියලුකල්හි |

මේ පද නිපාත බැවින් සියලු ලිඞ්ගවිභක්ති වචනයන්හි සමාන වෙත්.

ඒ මිනිසුන්ගෙන් අටවෙනියත් සොළොස්වෙනියත් දෙවෙනියත් දෙවරක් දෙපරිද්දෙකින් පිළිපන්නාහුය.

දූන් බොහෝ සේ පක්ෂයෙක්හි අටවැනි තිථියත් පසළොස්වැනි තිථියත් ලක්දිව සැමතන්හිම පොහොය වශයෙන් සලකනු ලැබෙත්.

මේ වාක්‍ය දෙක්හි තද්ධිත කටයුතු තැන් තද්ධිත කොට පාළියෙන් ලිවියයුතුයි.

## පරිශිෂ්ට සඞ්ග්‍රහය.

---

### විභත්ති භෙදය.

විභත්තිභෙදය නම් උපසර්ග නිපාතාදීන්ගේ යොග වශයෙන් වෙන විභක්තියෙක්හි අර්ථය වෙන විභක්ති රූපයකින් යෙදීමයි. එහි භෙද බොහෝ වෙත්. මෙහි ඉන් ස්වල්පයක් දක්වනු ලැබේ. මෙහි පෙර කිතකයොගයෙහි යෙදෙන ඡට්ඨී සත්තමී දෙක කියනලදී.

### දුතියා විභත්තිය.

"දිවස, මාස" ආදි කාලවාචක ශබ්දයක් හෝ "කොස යොජන" ආදි මාර්ගවාචක ශබ්දයක් හෝ ක්‍රියා ගුණ ද්‍රව්‍යයන් හා නිරතුරු යෙදෙනකල්හි ඒ කාලවාචක ශබ්දය හෝ මාර්ගවාචක ශබ්දය දුතියා විභත්ති රූපයෙන් යෙදේ. මේ **අච්චන්ත සංයොගදුතියායි.**

**ක්‍රියායොග**-භික්ඛු **දිවසං** සජ්ඣායති-(භික්ෂුතෙමේ දවසක් හදාරයි)

**ගුණ** ,, -**සරදං**රමණීයා නදී-(සරත් කාලය මුළුල්ල ගඟ සිත්කලුයි)

**දබ්බ** ,, -**මාසං** ඛීරභොජනං- (මසක් ක්ෂීර භොජනයයි)

**ක්‍රියා** ,, -**කොසං** රොදං අගමි-(හඬසතක් හඬමින් ගියේය)

**ගුණ** ,, -**යොජනං** දීඝො පබ්බතො-(යොදුනක් දිග පර්වතයයි)

**දබ්බ** ,, -**යොජනං** වනං-(යොදුනක් වනයයි)

මෙහි "දිවස" ආදිය ක්‍රියාදිය හා නිතර යෙදුන බැවින් "දිවසං" ආදි වශයෙන් දුතියා විය.

කාලවාචකශබ්ද බොහෝසේ සප්තම්‍යර්ථයෙහි දුතියා රූපයෙන් යෙදේ. "එකං සමයං" (එක්කලෙක්හි) ආදි වශයෙනි.

"වස, සි, ඨා, ආස, විස" යන මේ ධාතු අකර්මක වෙත්. එබැවින් මේ ධාතූන්ගේ යොගයෙහි ආධාරය මුත් කර්ම යක් නොයෙදේ. එහෙත් "උප අනු අධි ආ" යන මේ උප සර්ගයන් පූර්වකොට ඇති "වස" ධාතුකක්‍රියායොගයෙහිද "අධි ආ" යන මොවුන් පූර්වකොට ඇති "සි ඨා ආස" ධාතුකක්‍රියායොගයෙහි ද "අභි නි" යන මේ දෙකම පූර්ව කොට ඇති "විස" ධාතුක ක්‍රියායොගයෙහිද ඒ ආධාරය දුතියා විභත්තියෙන් යෙදේ. "සො ගාමං උපවසති (අනු වසති අධිවසති ආවසති) හෙතෙමේ ගමෙහි වෙසේ) "සො, පඨවිං අධිසෙස්සති" (හෙතෙමේ පොළොවෙහි ශයනය කරන්නේය) "සො භූමිං අධිතිට්ඨති" (හෙතෙමේ භූමියෙහි සිටි) "ගෙහං අභිනිවිසති" (ගෙට ඇතුල්වේ) යනාදි වශයෙන් දතයුතුයි.

"අන්තරා අන්තො තිරො අභිතො පරිතො" යන මේ නිපාතයන් සමග යෙදෙන පදය දුතියා විභත්තියෙන් යෙදේ. ඒ ෂෂ්ඨී විභක්ත්‍යර්ථවශයෙහි. "අන්තරා ච රාජගහං අන්තරා ච නාලන්දං අද්ධානමග්ගපටිපන්නො" (රජගහ නුවරටත් නාලන්දා වටත් අතර අදන්මගට පිළිපන්නේය.) "සො අන්තො ගෙහං වසති (හෙතෙමේ ගේතුළ වෙසේ.) "තිරො ගෙහං වසති (ගේ පිටත වෙසේ) "අභිතො ගාමං වසති (පරිතො ගාමං වසති) (ගමේ හාත්පස වෙසේ) යනාදි වශයෙහි.

## තතියා විභත්තිය.

ඇතැම්තන්හි කාලවාචක ශබ්ද තතියාවෙන් යෙදෙත්. සප්තම්‍යර්ථ වශයෙහි. "තෙනසමයෙන (ඒ කාලයෙහි) යනාදි වශයෙහි. ඇතැම්තන්හි හෙතු ශබ්දයාගේ අර්ථය ප්‍රකාශ කිරීමට ද තතියාව යෙදේ. "පුඤ්ඤෙන සග්ගං ගච්ඡති (පුණ්‍යහෙතුවෙන් ස්වර්ගයට යේ) යනාදි වශයෙහි.

"සහ සද්ධිං සමං" යන මේ ආදිවූ සහාර්ථ (සමග යන අර්ථ ඇති) පදයන් සමග යෙදෙන පදය තතියාවෙන් යෙදේ. එසේ යෙදෙන්නේ ක්‍රියාදියක් හා එකට සම්බන්ධවන්නාවූ

කීපයකින් අප්‍රධානවූ පදයයි. "පිතා පුත්තෙන සහ ගතො" (පියා පුත්‍රයා සමග ගියේය) මෙහි 'ගතො" යන ගමන ක්‍රියාව හා 'පිතු, පුත්ත' යන දෙකම සම්බන්ධයි. එහෙත් එහි ඒ ක්‍රියාව හා "පුත්ත" යන්න අප්‍රධානභාවයෙන් සම්බන්ධ බැවින් එහි පුත්තෙන'යි තතියා විය. "පුත්තො **පිතරා** සහ ගතො" (පුත්‍රයා පියා සමග ගියේය) යන තන්හි "පිතු" යන්න අප්‍රධානභාවයෙන් සම්බන්ධ බැවින් එහි "පිතරා"යි තතියායි. "තිලෙහි සද්ධිං සාලිං වපති" (තල සමග හැල් වපුරයි) යන ආදියද මෙසේයි.

ඇතැම් තන්හි ප්‍රථමාර්ථයෙහිද තතියාව යෙදේ: **අත්තනා** ව තං අකාසි (තෙමේම ඒ කොළේය) යනාදි වශයෙනි. බොහෝ සෙයින් "අත්ත" ශබ්දය මෙසේ යෙදෙන බැව් පෙණේ. මෙසේ යෙදෙන තතියාවිභත්ති එකවචනරූපය බොහෝ තන්හි බහුවචන වශයෙන්ද යෙදේ. "තෙ අත්තනාව තං ලභිංසු (ඔවුහු තුමූම ඒ ලැබූහ) යනාදි වශයෙනි.

## චතුත්ථීවිභත්තිය.

චතුත්ථී විභත්තිය දානාර්ථයෙහි පමණක් නොව "රොචන (රුචිය) ධාරණ (දැරීම) ථුති (ස්තුතිය) ඉච්ඡා, කොධ ඉස්සා (ඊර්ෂ්‍යා) උසූයා දොස්නැගීම) තදත්ථ (පිණිස යන අර්ථය) ආසිංසන (ආශීර්වාදය) නමස්කාර (නමස්කාරය) යන මේ ආදි අර්ථයන්හි ද යෙදේ.

**රොචන-සාධුජනස්ස** සච්චං රුච්චතෙ (සත්පුරුෂ ජනයාට සත්‍යය රුචිවේ.

**ධාරණ-රඤ්ඤො** ඡත්තං ධාරෙති (රජහට ඡත්‍රය දරයි)

**ථුති-බුද්ධස්ස** සිලාඝන්ති පණ්ඩිතා (පණ්ඩිතයෝ බුදුන්ට ස්තුති කෙරෙත්)

**ඉච්ඡා-සමිද්ධානං** පිහයන්ති දලිද්දා (දිළින්දෝ සමෘද්ධයන්ට කැමැතිවෙත්.)

**කොධ-පාපිට්ඨා සතං** කුජ්ඣන්ති (පවිටෝ සජ්ජනයන්ට කිපෙත්)

**ඉස්සා**-තිත්ථියා ඉස්සයන්ති **සමණානං** (තීර්ථකයෝ ශ්‍රමණයන්ට ඊර්ෂ්‍යාකෙරෙත්)
**උසූයා**-දුජ්ජනා **ගුණවන්තානං** උසූයන්ති (දුර්ජනයෝ ගුණවතුන්ට දෙස් නගත්)
**තදත්ථ**-**මොක්ඛාය** සීලං රක්ඛති (මොක්ෂය ලැබීම පිණිස සිල්රකී)
,, -**මකසානං** ධූමං කරෙති(මදුරුවන් (වැළැක්ම) පිණිස දුම්කෙරේ)
**ආසිංසන**-**භවතො** සුඛං හොතු (භවත්හට සැප වේවා
**නමස්කාර**-නමො **බුද්ධාය** (බුදුන්ට නමස්කාර වේවා)

යම් ක්‍රියාදියක් යමකට ප්‍රයොජන වේනම් ඒ තදත්ථයි. ඒ ක්‍රියාදිය වනාහි නැතිදේ ලැබීමටද ඇති දේ වැළැක්මටද ප්‍රයෝජන වේ. එබැවින් ඒ තදත්ථය දෙපරිදි වේ.

මේ විභත්තිය තවත් බොහෝ අර්ථයන්හි යෙදේ. භාෂානුසාරයෙන් දතයුතුයි.

## පඤ්චමිය.

පඤ්චමීවිභත්තිය අපගමනාර්ථයෙහි පමණක් නොව, "භය, ආදාන (විද්‍යාදිය ගැණීම) පරාජය (පැරදීම) උප්පත්ති දූර, සමීප, අඤ්ඤ" යන මේ ආදි අර්ථ ඇති ශබ්දයන්ගේ යොගයෙහිද 'අප පරි පති" ආදි උපසර්ගයන්ගේ යොගයෙහිද-හෙත්වත්ථ, කම්මත්ථ, අධාරත්ථයන්හි ද වේ.

**භය**-සො **චොරස්මා** අභායි (හෙතෙමේ සොරුගෙන් බියවිය)
**ආදාන** මාසං **ආචරියා** උග්ගණ්හි (මසක් ආචාර්යයන්ගෙන් උගත්තේයි)
**පරාජය**-**බුද්ධස්මා** අඤ්ඤතිත්ථියා පරාජිංසු (අන්‍යතීර්ථකයෝ බුදුන්ගෙන් පැරදුනාහ)
**උප්පත්ති**-**තණ්හාය** ජායතෙ සොකො (තෘෂ්ණාවෙන් ශොකය උපදී)
**දූර**-කීවදූරෙ **ඉතො** තෙ ගාමො (තාගේ ගම මෙයින් කොපමණ දූරද?)
**සමීප**-සමීපෙ **ගාමා** වනං (ගමින් සමීපයෙහි වනයයි)

**අඤ්ඤ**-නාඤ්ඤං **දුක්ඛා** නිරුජ්ඣති (දුකින් අනිකක් නිරුද්ධ නොවේ.)
**අප**-අප **සාලාය** ආයන්ති (සාලාව හැර යෙත්)
**පරි**-පරි **පබ්බතා** වස්සති (පර්වතය හැර වසී)
**පති-හිරඤ්ඤස්මා** පති සුවණ්ණං දදාති (අමුරන් වෙනුවට සවර්ණය දෙයි.)

**හෙත්වත්ථ-කස්මා** ආගතොසි (කුමක්හෙයින් ආයෙහිද?)
**කම්මත්ථ-පාසාදා** චඞ්කමති (පහයට නැගී සක්මන්කෙරේ)
**ආධාරත්ථ-ආසනා** උට්ඨහි (ආසනයෙහි සිට නැගිටියේය)

ඇතැම් තන්හි සිටි පූර්වක්‍රියාව ලොප්කොට ඒ පූර්වක්‍රියාවට කර්මවශයෙන් සිටි පදය හෝ ආධාර වශයෙන් සිටි පදය හෝ පඤ්චමියෙන් යොදනලදී. ඒ පූර්වයෙහි සිටි කර්මය කර්මාර්ථ පඤ්චමියද, ආධාරය ආධාරාර්ථ පඤ්චමියද වේ. මෙහි "පාසාදං අභිරූහිත්වා ආසනෙ නිසීදිත්වා"යි සිටිතන්හි 'අභිරූහිත්වා, නිසීදිත්වා" යන පූර්වක්‍රියාවන්ගේ ලොපයයි.

## ඡට්ඨීවිභත්තිය.

ඡට්ඨීවිභත්තිය 'කාරණත්ථ සත්තම්‍යත්ථ" දෙක්හිද, පූරණත්ථ, සදිසත්ථ, රුජත්ථ, භයත්ථ, යන මේ ආදි ශබ්දයන්ගේ යොගයෙහි ද වේ.

**කාරණත්ථ-පුප්ඵස්ස** බුද්ධං යජති (මලින් බුදුන් පුදයි)
**සත්තම්‍යත්ථ**-කුසලො **ත්වං ධම්මස්ස** (උඹ ධර්මයෙහි දක්ෂයි)
**පූරණත්ථ**-සරීරං **අසුචිනො** පූරං (ශරීරය අසූචියෙන් පිරුණේයි)
**සදිසත්ථ** සො **පිතුස්ස** සදිසො (හෙතෙමේ පියාට සමානයි)
**රුජත්ථ-තස්ස** රුජති (ඔහුට රිදේ)
**භයත්ථ**- සො **මය්හං** භීතො (හෙතෙමේ මට භීතවිය)

## සත්තමිය.

සත්තමී විභත්තිය ප්‍රධාන වශයෙන් ආධාරාර්ථ වේ. ආධාරය ඇතිතන්හි ආධෙයයක්ද තිබියයුතු වේ. ආධාර නම්

යමක් දරණ වස්තුවයි. ආධෙය නම් ඔහු විසින් දරණු ලබන වස්තුවයි.

ආධාරය වනාහි "ඔපසිලෙසික, ව්‍යාපික, සාමීපික, වෙස යික"යයි සිවුවැදෑරුම් වේ. එහි ඔපසිලෙසික නම් ආධෙය යාගේ වැළඳගැණීම ඇති ආධාරයයි. 'මඤ්චෙ සෙති (ඇඳෙහි ශයනය කෙරේ) යනාදී වශයෙනි. මෙහි "මඤ්චෙ" යනු ඔප සිලෙසිකාධාරයි. ආධාරයවූ ශයන ක්‍රියා කර්තෘගේ වැළඳගැන්ම ඇති බැවිනි.

ආධෙයයාගේ පැතිරීම ඇති ආධාරය ව්‍යාපික නම් වේ. තිලෙසු තෙලං [තිල බීජයන්හි තෙලයි] යනාදී වශයෙනි. මෙහි "තිලෙසු" යනු ව්‍යාපිකාධාරයි. ආධෙයවූතෛලයාගේ පැතිරීම ඇති බැවිනි. ආධෙයයාගේ සමීපභාවය ඇති හෙවත් ආධෙයයට සම්පත්‍රියෙන් සිටි ආධාරය සාමීපිකාධාරයි. **සාවත්ථියං** විහරති, (සැවැත්නුවර සමීපයේ වෙසේ) යනාදී වශයෙනි. මෙහි "සාවත්ථියං" යනු සාමීපිකාධාරයි. විහරණ ක්‍රියාකර්තෘවූ ආධෙයයාගේ සමීපභාවය ඇති බැවිනි. ආධෙයය විෂය කොට ඇති ආධාරය හෙවත් ආධෙයයවූ ඉන්ද්‍රියයන්ගේ හැසිරීමට ගොදුරුවූ ආධාරය වෙසයිකාධාරයයි. **අකාසෙ** පක්ඛිනො චරන්ති, (අහසෙහි පක්ෂීහු හැසිරෙත්) යනාදී වශ යෙනි. මෙහි "ආකාසෙ" යනු වෙසයිකාධාරයි. පක්ෂිසඞ්ඛ්‍යාත ආධෙයයට ගොදුරුවූ බැවිනි.

සත්තමී විභත්තිය වනාහි තවත් "කම්ම, කරණ, සම්පදාන, නිමිත්ත" යන මේ ආදී අර්ථයන්හි ද යෙදේ. එහි බොහෝසේ, කර්මාර්ථ සප්තමිය යෙදෙන්නේ "ගහණ, [ගැණීම] චුම්බන (සිඹීම) අභිවාදන, (වැඳීම) යන මේ අර්ථ ඇති ශබ්දයන් සමග බැව් පෙණේ. **බාහාසු** ගණ්හාති, (අත්ගණී) **මුද්ධනි** චුම්බති (මුදුන සිඹී) **භික්ඛුසු** අභිවාදෙති (භික්ෂූන් වදී) **හත්ථෙසු** පිණ්ඩයා චරති (අතින් පිඩුපිණිස හැසිරේ) සංඝෙ දින්නං මහප්ඵලං, **සම්පජානමුසාවාදෙ** පාචිත්තියං (දැන දැන බොරු කීම නිමති කොට පචිති ඇවැත්වේ) යනාදී වශයෙනි.

නිද්ධාරණාර්ථයෙහි වනාහි ඡට්ඨී සත්තමී දෙකම යෙදේ. ජාති, ගුණ, ක්‍රියා, නාමයන් පිළිබඳ යම්කිසි උස් පහත් ගුණයක් කාරණකොට ගෙන සමූහයකින් යමක් වෙන් කිරීම නිද්ධාරණයි. ඒ සමූහත්වය ඇති නාමය ඡට්ඨීයෙන් හෝ සත්තමියෙන් යෙදේ. **මනුස්සානං** (**මනුස්සෙසු**) ඛත්තියො උච්චතරො"(මිනිසුන් අතුරෙන් ක්‍ෂත්‍රියයා ඉතා උසස් වේ.)"කණ්හා **ගාවීනං** (**ගාවීසු**) සම්පන්නඛීරතමා (දෙනුන් අතුරෙන් කළු දෙන් තොමෝ ඉතා සමෘද්ධ කිරි ඇත්තීය) "**අද්ධිකානං** (**අද්ධිකෙසු**) ධාවන්තො සීඝතමො" (මාර්ගිකයන් අතුරෙන් දුවන්නේ ඉතා සීඝ්‍ර ගමන් ඇත්තේය.) '**දෙවානං** (**දෙවෙසු**) සක්කො සෙට්ඨො" දෙවියන් අතුරෙන් ශක්‍රයා ශ්‍රෙෂ්ඨයි) යන මේ ආදි වශයෙනි. "මනුස්සානං (මනුස්සෙසු) සුද්දො නීචතරො" (මිනිසුන් අතුරෙන් ශුද්‍රයා අතිශයින් නීචයි) යනාදි යද දතයුතුයි.

---

## එක පටන් කොටිප්‍රකොටිය තෙක් සඞ්ඛ්‍යා ශබ්ද.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | එක | 20 | වීසති-වීසං | 51 | එකපඤ්ඤාසං |
| 2 | ද්වි | 21 | එකවීසති | 69 | එකූනසට්ඨී |
| 3 | ති | 22 | ද්වාවීසති | 60 | සට්ඨී |
| 4 | චතු | 23 | තෙවීසති | 69 | එකූනසත්තති |
| 5 | පඤ්ච | 24 | චතුවීසති | 70 | සත්තති |
| 6 | ඡ | 25 | පඤ්චවීසති | 79 | එකූනාසීති |
| 7 | සත්ත | 26 | ඡබ්බීසති | 80 | අසීති |
| 8 | අට්ඨ | 27 | සත්තවීසති | 89 | එකූනනවුති |
| 9 | නව | 28 | අට්ඨවීසති | 90 | නවුති |
| 10 | දස | 29 | එකූනතිංසති | 99 | එකූනසත |
| 11 | එකාදස | 30 | තිංසති-තිංසං | 100 | සත |
| 12 | ද්වාදස | 31 | එකතිංසති | 101 | එකසත |
| 13 | තෙරස | 32 | ද්වත්තිංසති | 1000 | සහස්ස |
| 14 | චතුද්දස | 33 | තෙත්තිංසති | 10000 | දසසහස්ස |
| 15 | පඤ්චදස | 39 | එකූනචත්තාළීසං | 100000 | සතසහස්ස |
| 16 | සොළස | 40 | චත්තාළීසං-තාළීසං | 1000000 | දසසතසහස්ස |

| | | | | | |
|---|---|---|---|---|---|
| 17 | සත්තදස | 41 | එකචත්තාළීසං | 10000000 | කොටි |
| 18 | අට්ඨාදස | 49 | එකූනපඤ්ඤාසං | 100000000 | පකොටි |
| 19 | එකූන වීසති | 50 | පඤ්ඤාසං- පණ්ණාසං | 1000000000 | කොටිප්පකොටි |

"එක" ශබ්දය එකවචනයි. "ද්වි" ශබ්දය පටන් "අට්ඨාරස" ශබ්දය තෙක් ඇති ශබ්ද බහුවචනයි. මේ ශබ්ද ත්‍රිලිඞ්ගයි. එතැන් පටන් "නවුති" ශබ්දය තෙක් ඇති ශබ්ද ස්ත්‍රීලිඞ්ග එකවචනයි. "වීසති" ආදි තිකාරාන්තශබ්දයන්ගේ විභක්ති රූප "රත්ති"ශබ්දයේ මෙන් යොදා ගතයුතුයි. "චත්තාළීසං, පඤ්ඤාසං" ශබ්දයන් කෙරෙන් පර සියලු විභක්ති ලොප් වෙත්. "චත්තාළීසං පුරිසා" ආදි වශයෙනි. "සත, සහස්ස" ශබ්දයෝ නපුංසක ලිඞ්ග එකවචනයි. "කොටි" ශබ්දය ස්ත්‍රීලිඞ්ග එක වචනයි. විභක්තිරූප 'රත්ති' ශබ්දයේ මෙනි.

තවද මේ එකවචනයයි කී ශබ්ද ද බහ්වර්ථ බැවින් ඔවුන් හා යෙදෙන විශෙෂ්‍යපද බහුවචන වෙත්. "වීසති පුරිසා, වීසති රත්තියො, වීසති චිත්තානි" ආදි වශයෙනි. රාශිවශයෙන් බෙදා කියනතන්හි "වීසති" ආදිය ද බහුවචනයි. සතළිස රාශි දෙකට බෙදූකල්හි වීසති දෙකයි. එසේ කියනකල්හි "ද්වෙ වීසතියො"යි බහුවචනයි. "ද්වෙ වීසතියො බුද්ධදන්තා" (බුදුදත් සතළිසයි) යනාදි වශයෙනි.

එකහමාරට "දිවඩ්ඪ දියඩ්ඪ" යන දෙකද, දෙකහමාරට "අඩ්ඪතිය අඩ්ඪතෙය්‍ය" යන දෙක ද, තුණහමාරට "අඩ්ඪුඩ්ඪ" යනු ද ව්‍යවහාර කරණු ලැබේ. ඒ යෙදෙන්නේ "සත"ශබ්දාදියෙන් පූර්වභාගයෙහිය. "දියඩ්ඪසතං" (සතසඞ්ඛ්‍යා එකහමාර 150, "අඩ්ඪතියසතං (සතසඞ්ඛ්‍යා දෙකහමාර 250) "අඩ්ඪුඩ්ඪසතං (සතසඞ්ඛ්‍යාතුණහමාර 350 යනාදි වශයෙනි.

නිබ්බානස්ස පච්චයෝ හොතු
හීනටිගල පඤ්ඤාරාම හිමි
2017-01-31 දින